**වර්ෂ 2026.02.06 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

**සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී. මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

| අනු අංකය | තනතුර | පක්ෂය | නම |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා |
| 3. | ගරු ප්‍රා.ස.ම | ජා.ජ.බ. | කේ.පී.මහින්ද ජයලාල් |
| 4. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා |
| 5. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික | එච්.එම්. සිසිර සේනාරත්න මහතා |
| 6. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි මිය |
| 7. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එල්. සුධීරා සේමිනි ලියනගේ |
| 9. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා |
| 10. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා |
| 11. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ | කේ.වී.ආර්.ධර්මසිරි මහතා |
| 13. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා |
| 15. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ | ඉරෝෂා උදයංගනී විජේසිංහ |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා |
| 21. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා |
| 23. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති මිය |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා |
| 25. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය |
| 26. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන් මල්කාන්ති ලියනගේ |
| 27. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය |
| 28. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා |
| 29. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | ඩී.එච්.හරිසිංහ මහතා |
| 30. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති මිය |
| 31. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා |
| 32. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදුභාෂිනී මිය |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ජී.බී.රංගනාත් ගහබඩගේ |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා මිය |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා |
| 36. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා |
| 37. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එච්.වී. මහින්ද මහතා |
| 38. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා |
| 39. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා |
| 41. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ඊ. රනිල් එදිරිසිංහ මහතා |
| 42. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්කේ.විජේසිරි මහතා. |
| 43. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මල්කැකුල මහතා |
| 44. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා |
| 45. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය |

**01.පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

1. 2026.01.02 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -</u>

2026.01.02 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා:-</u>**

2026.01.02 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

සංශෝධන

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා:-</u>**

**පිටු අංක 19 හි වළඳුර නඩුකාරදෙනිය වසම්වල සභාවට පවරාගත හැකි පොදු ස්ථාන නීත්‍යානුකූලව සභාවට පවරාගැනීම සම්බන්ධ මගේ යෝජනාවේදි මා සඳහන් කලා නඩුකාරදෙනිය ප්‍රජාශාලාව, ක්‍රිඩා පිටිය ඒ භූමිය නිවාස සංවර්ධන අධිකාරියෙන් සභාවට ගන්න ලිපියක් විතරයි යොමුකරන්න තියෙන්නේ. ඉල්ලීමක්. ඒ කටයුත්ත සිදු කරන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා:-</u>**

46 පිටුවේ 06-39 සම්පත් බොතේජු මන්ත්‍රීතුමා යෝජනාවේ දි මා විසින් යම් උත්තරයක් ලබාදුන්නා. එය මේ ආකාරයෙන් සංශෝධනය විය යුතුයි. “ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා රුපියල් ලක්ෂයක් ලබාදෙන බවත් එයින් මෙම රූපවාහිනී යන්ත්‍රයේ අළුත්වැඩියාව කරදියහැකි බව එම ස්ථානයේ වෛද්‍යවරයාට හා පවුල් සෞඛ්‍ය නිලධාරී තුමියට පවසා ඇත. ඉන්පසු එම රූපවාහිනියන්ත්‍රය බොතේජු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම මත තිවන්ක ඉලෙක්ට්‍රිකල් වෙත භාරදී ඇත. ඉන්පසු බොතේජු මන්ත්‍රීතුමා එය අළුත්වැඩියාවට යන වියදම එම ආයතනයෙන් විමසා ඇති අතර තිවන්ක මහතා ඒ සඳහා රු.36000.00 ක් වැයවන බව ත් සෞඛ්‍ය මධ්‍යස්ථානයට බැවින් රු. 35000.00 ක් දෙන ලෙසත් පවසා ඇත. එහිදී බොතේජු මන්ත්‍රීතුමා රු. 40000.00 ක බිල්පතක් ඉල්ලා ඇත්තේ ලිපිලේඛනවලට වැයවන බව පවසමින් බවද තව දුරටත් මෙම ගොඩනැගිල්ලේ පාසැල පැත්තට ඇති පැතිබැම්ම නියම ආකාරයෙන් නැති හේතුවෙන් බිත්ති පුපුරා ඇති අතර එමෙන්ම විදුලි පංකා වැඩකරන්නේ නෑ. මේවාට විසඳුම් අවශ්‍යයි. “ ලෙස සඳහන් විය යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා:-</u>

72 පිටුවේ සඳහන් බෝපත්ඇල්ල රථගාල ටෙන්ඩර්කිරීම පිළිබඳව මීට වඩා මුදලක් අපිට ගන්නතිබුනා. මට ආරංචියි ටෙන්ඩරය දීලා කියලා. ගැටළුව අයවැයේ බජට් කරලා තියෙනවා ඇස්තමේන්තුකරලා ලක්ෂ අටකට. මේ දීලා තියෙන විදිහට හයලක්ෂ ගානක් පාඩුයි. අපේ අයවැය විකෘර්තියක් එනවා. ඒ ටෙන්ඩරය ගත්ත පුද්ගලයා මිත්‍රයි. නමුත් මෙතන මූලා ගැටළුවක් තියෙනවා. මුදල් කමිටුවේ කතාකරන්න. මේ සම්බන්ධව මගේ විරෝධතාවය මම ප්‍රකාශ කරනවා. ලෙස සටහන් කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසු 2026.01.02 වන දින මහ සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව ඒකමතිකව මහාසභා සම්මත විය.

**02.** <u>සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කල යුතු නිවේදන -</u>

1. **මෙම සභාවේ රියදුරු සේවයේ යොදවාගැනීමට සභා බල ප්‍රදේශයේ පදිංචි සුදුසුකම්තියෙන අයගෙන් අයදුම්පත් කැඳවා තියෙනවා. තනතුරු දෙකකට. ට්‍රැක්ටර් පදින්න හැකි අය ගන්නේ. ඒක 2026.02.18 දිනට පෙර අයදුම්කල යුතුයි. ඒ සම්බන්ධව දැනුවත්කර දැන්වීම් පලකර තියෙනවා. දැන්විම් පුවරුවේ ප්‍රදර්ශනය කරලත් තියෙනවා.**
2. **ඊයේ දිනයේ එනම් 2026.02.05 දින මා සහභාගී උනා ගිණුම් වාර්තා පිළිබඳව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් පවත්වන ලද හොඳම ගිණුම් වාර්තා ඉදිරිපත්කරන රාජ්‍ය ආයතන ඇගයීමේ උත්සවයට. කුරුවිට ප්‍රාදේශිය සභාවට එහි කුසලතා සහතික සම්මානයක් ලැබුණා. 2024 වර්ෂයට අදාලව ගිනුම් සැකසීම වෙනුවෙන්. ගියවසරේ ආපදා හේතුවෙන් මේ කටයුත්ත කල්ගිහින්. ඒ අනුව හොඳම ගිණුම් වාර්තා ඉදිරිපත්කරන රාජ්‍ය ආයතන අතරින් ප්‍රාදේශිය සභා අංශයෙන් කුසලතාවයක් අපිට ලැබුණා. ලේකම්තුමා ඇතුළු විෂය භාර නිලධාරී හට මේ අවස්ථාවේ සුභපැතුම් පල කරනවා. එසේම ඉදිරියේදී රන්පදක්කමක් මේ සභාවට ගෙන එන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.**

**03.** <u>සභා රැස්විමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා</u>

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් මෙදින ගරු සභාවට කැළුම් ශ්‍රී ධර්මදාස මන්ත්‍රිතුමා අසනීප විම මත මහා සභාවට සහභාගීවිමට නොහැකිබව දන්වා ඇති අතර නිවාඩු ලබාදෙනලෙස යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මතය විමසීමෙන් අනතුරුව කැළුම් ශ්‍රී ධර්මදාස මන්ත්‍රිතුමා හට නිවාඩුව සඳහා අනුමැතිය ලබාදීමට මහාසභාවේ ඒකමතිකව තීරණය විය.**

**04.** ප්‍රාදේශීය සභාව අමතා එවනලදද සංදේශ ,පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.
නැත.

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-01.** බෝපත් ඇල්ල ආශ්‍රිතව වෙළඳකටයුතු වල යෙදෙන පිරිසට බෝපත් ඇල්ල රථගාල ආශ්‍රිතව තාවකාලිකව කඩකාමර ලබාදීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

වසර කීපයකට පෙර විශේෂයෙන් මාර්ගය දෙපස හිටපු වෙළඳ කටයුතුවල යෙදුණු පිරිස ඉවත් කරලා. අරමුණ වෙලා තිබුනේ ඒ අයව වෙන තැනකට ගන්න එක. රථගාල ආශ්‍රිතව කඩ ලබාදීම. නමුත් තාම ඒ කටයුත්ත කරන්න බැරිවෙලා. ඒ පිරිස ඉල්ලීම් කරනවා ඒ අයට කඩ දෙන්න කියලා. ඒ අයට සුදුසු කඩ දෙන්න උත්සාහා කරලා තිබුනත් තව කාලයක් යයි. මේ අය කඩිනමින් දෙන්න කියලා ඉල්ලා හිටිනවා. බලාපොරොත්තු වෙනවා තාවකාලික පදනම මත භූමිය දීලා ඒ අයට කඩ හදාගන්න කියන්න. කාර්මික නිලධාරී මගින් හා අවශ්‍ය විස්තර අරන් ඒ බිමට අදාලව බිම් බද්දක් වගේ ගන්න පුළුවන්. විශේෂයෙන් මේ බද්දක් ගැනීමේදී ඒ බිමේ තත්වය අනුව ලොකු මිලක් ගන්න බැරිවෙයි. නිවාඩු දිනවලයි පිරිස් එන්නේ. වෙළඳ සංගමයක් තියෙනවා ඇල්ල ආශ්‍රිත වෙළඳ ප්‍රජාවගේ. අපිට ඒකට අදාල නම් දීලා තියෙනවා සංගමයේ. ඒ පිරිසට මූලිකවම දෙන්න වෙනවා. මාසිකව යම් මුදලකට මේ විදිහට බදු දෙන්න පුළුවන්. සභාවට යම් ආදායමක් එනවා. මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්. උමේෂා මල්කාන්ති මිය-</u>

කොට්ඨාශයේ මන්ත්‍රිවරිය ලෙස මා මුලින්ම මේ යෝජනාව ඉදිරිපත්කිරිම පිලිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරනවා. විශේෂයෙන් බෝපත්ඇල්ල ආශ්‍රිතව සංචාරය කිරිමට එන සංචාරකයින්ට තමන්ගේ නිෂ්පාදන අලෙවිකරලා ජීවිකාව කරන මේ පිරිසට යම් නිශ්චිත ස්ථානයක් දෙන එක ඉතා වැදගත්. ඒ පිලිබඳව ස්තුතියි. බෝපත්ඇල්ල ආකර්ශනයට සීමාවක් නෑ. ලංකාව පුරා ලෝකය පුරා ජනතාව වෙත ගෙන යාහැකි විදිය හැකි සුන්දර ස්වාභාවික වස්තුවක් . ගමේ ඉන්න ජනතාව ගොඩක් වෙලාවට රසකැවිලි, බටපොතු වේවැල් වගේ නිෂ්පාදන, පොල්කටු නිර්මාණ වගේම කිතුල් ආශ්‍රිත හකුරු ආදිය වෙළඳාම් කරන්න මේ ඇල්ල ආශ්‍රිතව කටයුතු කරනවා. ඔවුන්ගේ ආර්ථිකය වඩාත් ශක්තිමත් කරගන්න රථගාල ආශ්‍රිතව නිශ්චිතව ස්ථාන සැකසීම වැදගත්. නැවතත් ජනතාව වෙනුවෙන් කරන මේ කටයුත්ත වෙනුවෙන් ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-</u>

මේ ඇල්ල රථගාල ආශ්‍රිත කඩ හදාගන්න බිම දෙන්නේ දැනට කඩ කරන අයටද? අළුත් අයටද? කඩ කීයක් දැනට තියෙනවාද? පාර දෙපැත්තේ තියෙන සියළු කඩ ඉවත් කරලා මෙතනට එනවාද?

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

දැනට කඩ සංගමයක් ලෙස ඉන්න පිරිසට ප්‍රමුඛත්වය දෙනවා. මතක ආකාරයෙන් 43 ක් වගේ ඉන්නවා. ගෙවල්වල දාගෙන ඉන්න කඩ නම් ඉවත්කරන්න බැරිවෙයි. මාර්ගයේ කඩ තියෙන ඒවා තමයි මූලිකව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

බෝපත්ඇල්ල වෙළඳ ප්‍රජාව වෙනුවෙන් කටයුතු කිරිම ගැන සතුටුයි. ඇල්ල ගැන ගොඩක් අය කතා කරනවා. මුලින් අපි එනකොට ඇල්ලට යන්න අඩිපාරක් තිබුනේ. පාරක් කපන්න ගිහින් මායි ඩිමන් ආබ්‍රෙව් හිටපු මන්ත්‍රීතුමායි පොලිසිත් ගියා. ප්‍රාදේශීය ලේකම් සතුව ඉඩම් තිබුනත් ඒවා බලෙන් මිනිස්සු  අල්ලගෙන. ක්‍රියාමාර්ග ගත්තත් ඒ අය ඉවත්කරගන්න බෑ.නමුත් යම් කොටසක් සභාවට අත්පත්කරගත්තා. සභාව මේ කඩ ඉවත්කරන්නත් විධිමත් නැතිව කටයුතු කලා. ඒ කඩ කඩනකොට මමනම් ගත්තේ ජනතාවගේ පැත්ත. අපි උසාවි නියෝග ගත්තා. මම ආණ්ඩුකාරතුමාටත් පෙන්නුවා. කතා කරලා එතන ළඟම තියෙන ඉඩමක් වෙළඳකුටි හදන්න ගන්න පුළුවන්. සභාවට පවරාගන්න පුළුවන්. බලපත්‍ර තියෙන ඒවා. ඉල්ලීමක් කරන්න. මේ වෙළඳ සංගමේ අයට ලොකු තක්සේරු මුදලක් නම් ගෙවන්න බැරිවෙයි. ගමේ නිෂ්පාදන විකුනනවා කිව්වට එතන තියෙන්නේම චීන බඩු.  ග්‍රාමීය නිෂ්පාදනත් තියෙනවා. සමහරු රොටිත් පුච්චනවා. ලොකු ආදායමක් නෑ. සෙනසුරාදා ඉරිදා විතරයි ආදායමක් තියෙන්නේ. සතියේ දිනවල නෑ. රථගාල ගාවට මේ කඩ ගෙනිච්චාට සාධාරණ මුදලක් ගන්න. තක්සේරුවෙදි අඩු මුදලක් ගන්න. වරිපනම් තක්සේරුව නම් වැඩියි. අඩු මුදලක්තියෙන අයටත් වැඩි බදු මුදලක් ගෙවන්න වෙලා.ඉස්සර දවසක් මම ප්‍රකාශයක් කලා සභාවේ මේ බෝපත්ඇල්ල පාර්ක් එක වික්ටෝරියා පාක් එක වගේ කියලා. ඒක ලංකාදීප පුවත්පතේ  පලවෙලා. ඒ දවස්වල සංචාරකයෝ ආවා වාහනවලට පාර මදි යන්න. පාරවල් බ්ලොක් වෙලා වාහන නිසා. ඒ දවස්වල සීග්‍ර විධිහට ප්‍රසිද්ධ උනේ. මේ ඇල්ල ජාතික උරුමයක් විධිහට නම්කරන්නත් හැදුවා. ඒ වැඩේ නැවතුනා. මේ වෙලාවේම මතක් කරනවා මම රථගාලේ මේ වෙනකොට රථවාහන වැඩිවෙලා ආදායම් වැඩියි. අයවැයේ ආදායම් රු. ලක්ෂ අටකට ඇස්තමේන්තු කරලා. නමුත් ටෙන්ඩර්තීරනය අනුව දීලා තියෙන විධිහට හයලක්ෂ හැටදාස්ගානක් පාඩුයි.මේ දුන්න පුද්ගලයාගේ ගැටළුවක් නෑ.පුද්ගලිකව තරහත් වෙයි මේවා කියලා. ඇල්ල වෙලෙඳුන්ට සාධාරණයක් කරන්න. කැපවෙලා උදව් කරන්න. මේ අයගෙ කඩවල අයිතිය වෙනුවෙන් පෙනී හිටිය කෙනෙක් විධිහට මට සතුටුයි. ඇල්ල රථගාල ගැනත් නිවැරදි තීරණයක් ගන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

විධිමත් ලෙස ඇල්ල සංවර්ධනය කිරීම හැමෝගෙම බලාපොරොත්තුව. බෝපත්ඇල්ල රත්නපුරේ ආකර්ශනීයම උරුමය. මේ සංවර්ධනය තුලින් ඇල්ලට ලැබෙන අගය වැඩිවෙන්න ඕනි. මේ වෙනකොට ඇල්ලේ වන පරිසර හානිය පොලිතින් ආදිය වැඩිවෙලා ඒකට ජනතාවමයි වගකියන්න ඕනි. බෝතල්කටු නම් අඩුවෙලා. ජනතාවට මේ ඇල්ල ගැන ආයෙත් සුභවාදීව කතාකරන්න පුළුවන් විධිහට මේ කටයුත්ත කරමු. කඩ කාමර නිසිපරිදි ස්ථානගත කිරිම හා ව්‍යාපාර කරන්න සුදුසු පරිදි සැකසීම ඵලදායීව කරමු. තාවකාලිකව තක්සේරුවක් ගමු. මේ ජනතාවගේ ආදායම් නිශ්චිත නෑ. ස්වයංරැකියා ලෙස තම තමන් යමක් අලෙවි කරනවා. ඒ නිසා මේ දේවල් ක්‍රමවත්ව කරමු. මග දෙපස ප්‍රධාන මාර්ගය පවිත්‍ර කල යුතුයි. පරිසර කමිටුවත් එකතු වෙලා මාස තුනෙන් තුනට වගේ වත් ඇල්ල පරිශ්‍රය පවිත්‍ර කරමු. පාසැල් දරුදැරියන් විවිධ ප්‍රජාව එකතුකරගෙන මේ කටයුතු නිර්මාණශීලීව කරමු.සභාවෙන් ක්‍රමවත්ව යම් යම් නීති ක්‍රියාත්මක කරලා මේ ස්ථානය සුන්දරත්වය රැකගැනීම හා පරිසර හානිය අවම කිරිමට කටයුතු කල යුතුයි. මේ කඩ සම්බන්ධව දැනට මේ ස්ථානයේ ඉන්න ව්‍යාපාර කරන පිරිසට ප්‍රමුඛත්වයදෙන්න. සභාවට සාධාරණ මුදලක්

ගමු ආදායම ලෙස. ගියවර ඇල්ල රථගාල බදු දීමේදි යම් අතපසුවීමක් වෙලා කියලා මංගල මන්ත්‍රීතුමා කිව්වා. අයවැය සම්මත කරලා ඒවා විමර්ශනයවෙනවා. ඒ ගිණුම්. පාදක ටෙන්ඩරය ගැටළුවක් වෙයි. ආදායම අඩු නිසා. අටලක්ෂ ගානක් තියෙන ආදායම් අඩුවට තීන්දු කරලා දුන්නු එක. ඒ අඩුවට දුන්නු එකට මම එකඟ නෑ. මාගේ අකමැත්ත සභා වාර්තාවේ සටහන් කරන්න. අමනාපවීම් තියාගන්න එපා. මන්ත්‍රීවරයෙක් ලෙස මම මේ කාරණයෙදි එකඟ නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා</u>

බෝපත්ඇල්ල අපිට සම්පතක්.දැන් ඒ සුන්දරත්වය නෙමේ තට්ටුදෙකේ මොකක්හරි බිල්ඩිමක් නිසා ඒ ස්ථානය අවලස්සනවෙලා. කිව්වේ නම් පොලිස් ආරක්ෂාව ගන්න තැනක් කියලා. එහෙම් ආරක්ෂාව අවශ්‍යයි. නමුත් මේ ස්ථානය නැරඹුම් ස්ථානයක් වගේ දේට සුදුසු. ළමයින්ට එහෙම ඇල්ල බලන්න සුදුසුයි ඒ ස්ථානය ඒ ලෙස සකසන්න. වසර ගානක් පොලිස් ආරක්ෂාව තිබුනා. මම මේ ස්ථානයට එකඟ නෑ. ඒක ළමයින්ට බලන්න විදිහට හදන්න. කොන්ක්‍රිට් ඉදිකිරිම නිසා සුන්දරත්වය අහිමි වෙලා. නැවත ඒ ස්ථානයේ කොන්ක්‍රිට් ඉදිකිරිම් කරන්න එපා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවති මිය</u>

මගේ කොට්ඨාශයට යාබද කොට්ඨාශෙ ඇල්ල තියෙන්නේ. ඇල්ලට යන මාර්ග තුනක් තියෙනවා. ඒවායින් උඩකඩ වතුයාය පාර කෙටි මාර්ගයක්. ගල්නියර පාර. ඒක හරිම ප්‍රයෝජනවත්. ඒපාරේ වීදිපහන් නෑ. කණුදාලා ලයිට් දෙන්න. ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වෙන්නේ ඇල්ලට යනකොට පාර දෙපැත්තේ කාණු මදි. කැලේ වැව්ලා. වීදිපහන් දාලා අඩුපාඩු මේපාරේ අඩුපාඩු සකසා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. දේවින්ද කුමාර් මහතා</u>

ඇල්ලේ අනවසර කඩ ඉවත් කිරිම සලිත සභාපතිතුමාගේ කාලේ පටන් ගත්තා. පස්සේ නැවත එක එක සභා මගින් ඒ පිලිබඳව කටයුතු කලා. අද යෝජනාව බෝපත් ඇල්ල රථගාල ආශ්‍රිතව තාවකාලිකව කඩකාමර ලබාදීම සඳහා. ඇල්ලට පිවිසෙන තැන ම ටකරන් කඩ 15 ක් විතර තියෙනවා. එක දිගට. මේ ඇල්ල නරඹන්න එන අයට දෙස් විදෙස් සංචාරකයින්ට ඇත්තටම ඒක අශෝභනයි. ගැටළුවක්. ඒ කඩ ඉවත් කරන එක හොඳයි. මේ සියළු කටයුතු විනිවිදව කරන්න. එතන ප්‍රධාන මාර්ගයට අල්ලලා ගල් වලින් කඩ දෙකක් හදලා. ඇල්ලට පිවිසෙන තැන ම. ඒවාත් අයින් කරන්න. ඒවා පාරේ තියෙන්නේ. ඒ වගෙම දැනට එතන කඩ තියෙන අයට නිවැරදිව නිසිපරිදි තෝරලා දෙන්න. අර ඇල්ල පරිශ්‍රයේ තියෙන කොන්ක්‍රිට් ගොඩනැගිලි දෙකට මාත් විරුද්ධයි. ඒවාට සභාවේ අනුමැතිය අරන්ද? ඒ ඉදිකිරිම් වලට. ඒ බිල්ඩිම් නිසා ඇල්ල සුන්දරත්වයට හානි වෙලා. ඇල්ලට පොලිස් ආරක්ෂාවක් ඕනිද? මෙතන කපා කොටාගන්නේ නෑ. එතනට මිනිස්සු එන්නේ විනෝද වෙන්න. නිවාඩු දිනයක එන මිනිස්සුන්ට විනෝද වෙන්න මේ පොලිසියක් නිසා බාධාවක්. අනවශ්‍ය බලපෑම් එයි. අපි, සභාව නැතිකාලේ මේ ගොඩනැගිලි හදන්න අනුමැතිය අරන් තියෙන්නේ. ජීවිතාරක්ෂක කටයුතු සඳහා ඒ අවශ්‍ය නිලධාරින් ඉන්න එක හොඳයි. නමුත් ඒ ස්ථානයේ පොලිස් කුටියක්

ඉදිකිරීමට විරුද්ධයි. ළමයින්ට යම් සුදුසු කටයුත්තක් සඳහා ඒක වෙන් කිරීම සුදුසුයි. මේ මන්ත්‍රීවරු පත් උනාට පස්සේ ඊට පෙර ගත්ත තීන්දු තීරණ ගැන අපිව දැනුවත් කල යුතුයි. මේ යෝජනාව ගැන අපි දැනුවත් නෑ. ඒ ගොඩනැගිලි දැන් ස්ලැබ් මට්ටමට ගිහින්. යම් තීන්දු ගනිද්දි සභාව දැනුවත් කරලා නැවත ඒ කලින් ගත්ත තීන්දු ගැන කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී. මහින්ද මහතා</u>

හැමතැනම බිල්ලෝ මවන්න එපා. සංවර්ධනය කෙසේ වෙතත් බිල්ලෝ මවනවා. මම කොන්ක්‍රීට් ගොඩනැගිලි ගැන කතා කරන්නේ නෑ. පොලිස් මුරපොල හදලා තියෙන්නේ එතන පාතාලේ අයව අල්ලලා ඇරෙස් කරන්න නෙවෙයි. ඒ ඉන්නේ ජීවිතාරක්ෂක අංශයේ පුහුණුව ලත් පොලිස් නිලධාරීන්. රත්නපුර දිස්ත්‍රික්කයට අයත් අය. දැනට ලංකාවේ දියඇළි ජලාශ වල ගිලිලා ගිය වසරේ 495 ක් අවුරුදු 30 ට අඩු මරණ සිදු වෙලා. මේ ස්ථානයට පොලිසිය එපා කියන්න එපා. වතුරට තරුණ ළමයි කැමතියි. නමුත් තරුණ අයට හිතෙන්නේ නෑ තමන්ගේ ආරක්ෂාව ගැන. ඒ හින්දයි මෙතනට මේ පොලිසිය රඳවලා තියෙන්නේ. ඒ ආරක්ෂාව දෙන්න. නිකමට පොලිසිය එක සතියක් ස්ට්‍රයික් කලොත් කොහොම වෙයිද? පිරිමියෙකුට පාරේ යන්න බැරිවෙනවා. හැල්ලුවට ලක් කරන්න එපා. ඒ ඉදිකිරීම් ගැන මම කතාකරන්නේ නෑ. පොලිසිය දැම්මේ ආරක්ෂාවට ඒක වටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා</u>

මේ ස්ථානයට පොලිසිය ඕනි. ඒ ස්ථානයේ යම් අපරාධ සිදුඋන බවට වාර්තා වෙලා තියෙනවා. එක සිදුවීමක් බොන්න දීලා. තල්ලුකරලා. රත්නපුර කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශයට වාර්තාවෙලා මාත් ඒ විමර්ශනයක් සිදු කලා. ඒ වගේ මේ ස්ථානයේ යම් අපරාධ වෙනවා. බීලා ගහගන්නවා. සතුටටත් ගහගන්නවා. මිනිස්සු ඈතට දැකලා තියෙනවා. ඒ නිසා මේ අපරාධ අනතුරු අවම කරන්න මේ ස්ථානයට පොලිස් මුරකුටිය ඒ සේවය අවශ්‍යයි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ ස්ථානයේ ජීවිතාරක්ෂක නිලධාරීන් ඉන්නේ. වෙන තැනකට වඩා මේ ස්ථානයට ඇත ඇල්ල හොඳින් පේනවා. සිදුවෙන දෙයක් පේනවා. මේ පිරිසට ගඟට බහින අයගැන සෝදිසියෙන් ඉන්න, නිරීක්ෂණයක් කරන්න එතනට පුළුවන්.ඒ ඉල්ලීම අනුවයි එතන ඒක හදන්නේ. ඒ නිසා ඒකට සුදුසුම තැන තමා දාලා තියෙන්නේ. දරුවන්ට නිරීක්ෂනය කරන්නත් පුළුවන් විදිහට ඒක සකසාගන්න පුළුවන්. තව දරුවන්ට ගිහින් මේ ස්ථානයේ සෙල්ලම් කරන්න පුළුවන් වෙන විධිහට භූමි අලංකරණයක් කරන්න ඕනි. දැනට මේ කටයුතු කරලා පසුව භූමි අලංකරණ කටයුතු ආරම්භ කරනවා. ඒ ගොඩනැගිලි එකක් පොලිසියේ නිලධාරින්ට ඉන්න තැන. අනික ඇල්ල බලන්න එන අයට පොඩි පන්ෂන් එකක් වගේ ගන්න කෑම ටිකක් කන්න වගේ ස්ථානයක්. අර පොලිස් පෝස්ට් එකක් නෙමේ. මීට පෙර අවශ්‍යතා බලලයි ඒ හදලා තියෙන්නේ. ඇල්ලේ ජීවිතාරක්ෂක නිලධාරින් ඉන්න තැන ඒ කුටිය මේ කියන නිරීක්ෂණ කුටියක් ලෙසත් අවස්ථා ගන්න පුළුවන්. ඇල්ලේ රථගාල ටෙන්ඩර් එක

අපිට අයවැයේ ලක්ෂ අටක් දාලා. 2025 ඇල්ල රථගාල ලැබීම් ලක්ෂ 7 යි. ඒකත් එක්ක අරන් 2026 ට ලක්ෂ අටක් දාලා. රථගාලේ අපි දාපු සේවක වියදම් එක්ක බැළුවාම අනූදාස් ගානක්. සභාවට පාඩුවක්. එතකොට රථගාල තක්සේරු කළාම ඒ අනුව තමයි ටෙන්ඩර් දාලා තියෙන්නේ. ක්‍රියාවලිය නීත්‍යානුකූලයි. එක ටෙන්ඩරයයි දාලාතිබුනේ. ඊට වැඩිමුදලට දෙන්න පුළුවන් කියලා හිතෙනවා. නමුත් මේ ක්‍රියාවලිය නිවැරදියි. ඒ අනුව සළකලා මේ ඉල්ලුව කෙනාට දෙන්න තීන්දු කලේ. මගේ යෝජනාව සම්බන්ධයෙන් අපි මේ කඩ හදන්න භූමිය දෙන්නේ නිශ්චිතවම වෙළඳසංගමය තුළ ඒ ඉන්න එතන ඉන්න පිරිසට. ඒතන ඉන්න එක්අයෙක් දෙන්නෙක් හැර අනිත් පිරිස සියළුදෙනා සංගමයේ. කාලයක් ඒ ස්ථානයේ වෙළඳාම් කළ අය. ඒ ස්ථානයට අවශ්‍ය ම විශේෂ අවශ්‍යතා අනුව යම් ආයතන වගේ වලටත් දෙනවානම් ඒ දෙන්නේ සභාවේ තීන්දු අරන්. වෙන අයට දෙන්නේ නෑ. කාර්මික නිලධාරී වාර්තා අරන් නිශ්චිතව ඉඩ ප්‍රමාණ දිය යුතුයි. පාක් එකට අවහිර වෙන්නේ නැතිව ඉහළ කොටසේ කෙළවර වගේ කුටි හදන්න පුළුවන්. මේ සියල්ලට කාර්මික නිලධාරී උපදෙස් ගත යුතුයි. නීත්‍යානුකූලව ක්‍රමවේදයක් අනුව ගිවිසුම්ගතව මේ කටයුතු කරනවා. මේ කඩ වලින් අපිට මාසෙකට රු. 500 ගානේ ආවත් අමතර ආදායමක්. ඒක අයවැයේ නෑ. කඩ දෙන්න 45 ක් 53 ක් වගේ ඉන්නවා. ඒක සභාවට අමතර ආදායමක්. රථගාල හරහා එන ආදායමක්. නීත්‍යානුකූලව ක්‍රමවේදයක් අනුව ගිවිසුම්ගතව සභාවට බලය තියෙන පරිදි මේ කටයුතු සිදු කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

කලින් තීරණයක් අරන් තිබුණා මේ සභාවේ මේ ඇල්ලේ පාරිසරික තත්වයට හානි වන අවලස්සන වෙන විධිහේ ඉදිකිරිම් මේ ස්ථානයේ නොකරන්න. වැසිකිලිය හදද්දි මේ ගැටළු ආවා. යම් ඉදිකිරිමක් කලොත් ඒක සිමෙන්ති නොපෙනෙන්න කලාත්මකව ස්වාභාවිකත්වය පෙනෙන විධිහට යම් ආලේපයක් වගේ ගාලා හදමු කියලා තීන්දුවක් ගත්තා මේ සභාවේ. ඒ අනුව කටයුතු කිරිම මෙවැනි තැනකට සුදුසුයි. ටෙන්ඩර් ක්‍රියාවලියේ ගැටළුවක් නෑ. තක්සේරු කළ ක්‍රමයයි වැරදි. පුද්ගලිකව මේකෙන් වන අධිභාරයෙන් අපිව නිදහස් කරන්න

<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා-</u>

මම මේ තක්සේරු කළ ක්‍රමයට විරුද්ධයි. පුද්ගලිකව මා විරුද්ධ බව සටහන් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. දේවින්ද කුමාර් මහතා</u>

මේ රථගාල බදුදීම තීරණයට විපක්ෂයත් විරුද්ධයි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ඇල්ල ඉදිකිරීම සැළසුම් කමිටුවට දාලාද කියලා බලමු. ටෙන්ඩරය නැවත විමර්ශනය කරන්න ඕනි නම් ආයතනවලට දන්වා තොරතුරු ඉදිරිපත් කරලා විමර්ශනය කරමු. මේකෙන් ඒ ආදායම් එන විධිහ හරි. වෙන කටයුත්තකට යොදවන්න තියෙන සේවකයෙක් ඒ ස්ථානයට දාලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

2017 පන්ලක්ෂ ගානට දීලා තියෙන්නේ.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

තක්සේරු කරනකොට ඇති උන ගැටළුවක්. ටෙන්ඩර්කරනකොට දාන්න වෙන්නේ තක්සේරු මුදල. තක්සේරුවේ ප්‍රශ්නයක්.

ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා-

තක්රෙුකල මුදල අනුව දෙන එක හරි. අධිභාර වෙනකොට ගෙවල්වලට ලිපිය එවනවා. මේ කටයුත්ත ගැන විමර්ශනයක් කරන්න සියළු දෙනා වෙනුවෙන්.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

රථගාල ටෙන්ඩරය පිලිබඳව තක්රෙු දෙපාර්තමේන්තුවෙනුත් ගෙන්නලා විමර්ශනයක් කරමු. සියළු අංශ ගෙන්වමු. පළාත් පාලන කොමසාරිස්තුමාවත් ඒ කටයුත්තට එකතුකරගමු. බෝපත් ඇල්ල ආශ්‍රිතව වෙළඳකටයුතු වල යෙදෙන පිරිසට බෝපත් ඇල්ල රථගාල ආශ්‍රිතව තාවකාලිකව කඩකාමර ලබාදීමසම්බන්ධයෙන් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව බෝපත් ඇල්ල ආශ්‍රිතව වෙළඳකටයුතු වල යෙදෙන පිරිසට බෝපත් ඇල්ල රථගාල ආශ්‍රිතව තාවකාලිකව කඩකාමර ලබාදීම සඳහා නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

06-02. කිරිඇල්ල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව සඳහා පොළක් ආරම්භ කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ඉනෝකා මල්ලවආරච්චි මිය-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

කිරිඇල්ලට පොලක් නෑ. ගම්වල ජනතාවගේ යම් නිෂ්පාදනයක් අලෙවිකරගන්න, කිරිඇල්ල ජනතාවගේ ග්‍රාමීය ආර්ථිකය නංවන්න පොලක් පිහිටුවීම වැදගත්. නගරයේ විවිධ තැන්වල අනවසර වෙළඳාම් කරනවා. ඒවා නිසා ගැටළුත් ඇති වෙනවා. ඒ අනවසර තැන් ඉවත් කරනකොට වෙළඳාමක් කරන්න තැන් දෙන්න වෙනවා. කුරුවිට බල සීමාව තුල ක්‍රියාකාරී වෙළඳපලවල් බිහිකර ආර්ථික කටයුතු නංවාලීමට අවස්ථා බිහිකරමු. පරකඩුව පොලත් ආරම්භ කරමු. කිරිඇල්ල පොළක් සැකසීම සම්බන්ධවත් භූමිය පිලිබඳව අදහස් දෙන්න. අපි ගිහින් බැළුවා. යම් ඉඩක් තියෙනවා. නගරයේ පාර අසල වෙළඳසංකීර්ණය ඉදිරිපස කොටස හිස්. එතනත් ගන්න පුළුවන්. අදහස් දෙන්න. වෙන ස්ථාන තියේද? ඒ ස්ථානයේ ප්‍රමාණවත් ඉඩක් තියෙනවා. මූලිකව වෙහෙසක් දරන්න වෙයි. වෙළෙඳුන් ගෙන්න ගන්න. නමුත් ලාබෙට භාන්ඩ දිය හැකි කාලයකුත් එයි. මැදිහත් වෙමු. කිරිඇල්ලට පහසු මිලට භාන්ඩ ගන්නත් ද්‍රව්‍ය අලෙවිකර ගන්නත් වගේම අනවසරතැන්වල ඉන්න පිරිසට නිශ්චිතවම පොලභූමිය අවස්ථා දෙමු. අදහස් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා

හොඳ යෝජනාවක්. ජනතාවගේ අවශ්‍යතාවක් සැපිරිමක්. ජනතාවගේ අදහසක් තියෙනවා මූලිකව පොළ හදන ගමන් දෙවන පියවරක් ලෙස කොකෝවත්ත ඉඩම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් එකක්. එතන කාර්යාලකීපයක් තිබුනට ඒවා භාවිතාවෙන්නේ ඉතාමත් කලාතුරකින්. වසරකට යම් එක් පුහුණුවක් වගේ. ඒ ඉඩම ඒක ගන්න හැකිනම් වැදගත්. ඉස්සර එතන පොලක් තිබුනළු. ඒ ස්ථානයේ වෙන දෙයක් කරලත් නෑ. ඒ බිම යෝග්‍ය නම් සළකා බලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

කිරිඇල්ල පොලක් සැකසීම සම්බන්ධව.කාලිනව තියෙන ජනතාවගේ දෛනික වියදම් වැඩිවීම හා ඒකාකාධිකාරී වෙළඳාමට උත්තරයක් ලෙස ප්‍රාදේශීය සභා පණතේ බලය අනුව ත් කටයුතු කරමු. පසුගිය අයවැයේ මුදල් ප්‍රතිපාදනයක් වෙන් කලා පරකඩුව සති පොල වෙනුවෙන්. ඒ කටයුත්තට මහා ප්‍රාග් ධනයක් වියදම් කලා. එතන ඒ පොල කටයුත්තටත් අවධානය දෙන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

පොලක් ආරම්භකරන්න සභාවකට හැකියි. ඒ සඳහා පණතේ විධිවිධාන තියෙනවා. කිරිඇල්ල වෙළඳසංගමයත් ඉල්ලුවා. ජනතාව එකතුවීම අඩු නිසා විධිමත් පොලක් හදන්න කියන ඉල්ලීම. මේ දෙපාර්ශවයටම හොඳයි. සභාවට ආදායමක්. ජනතාවට යහපත් තත්වයක්. බඩුභාණ්ඩ විකුණාගන්න. ගං සභා කාලේ ඉස්සර පොලක් තිබුණා ඇල්ලගාව. දුම්බර පතල් තිබුන කාලේ. ඒක දැන් ඇල්ලගාව ක්‍රිඩාපිටිය බවට පත් වෙලා. ඒ කඩ දැන් පෞරාණිකයි. පොලක් ස්ථාපනය කළාම තරඟකාරීව වෙළඳ අවස්ථා දෙන්න ඕනි. ජයරත්න මන්ත්‍රිතුමාට ,මට දොෂාරෝපණ එයි. නමුත් ළෙඳාමක් සාර්ථක වෙන්න නම් තරඟකාරිත්වට ඕනි. සභාව සතු භූමියක් දියුණු වෙනකොට තාවකාලික කඩවලට ඉඩප්‍රමාණ ගන්න පුළුවන් වෙයි. විධිමත්ව කඩ හදලා හොඳ ව්‍යාපාරිකයින්ට ආරාධනා කරලා අවුරුද්දට පෙර නව පොළ අරඹමු. සහාය දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා

පරකඩුව සතිපොල වසර ගානක් පවත්වාගෙන ගිය පොලක්. දැන් වැහිලා. හේතුව කඩවල භාන්ඩ මිළ අඩුඋනා පොලට වඩා. ඒකත් හේතුවක්. කඩවලට වඩා පොල මිළ අඩුවෙන්න ඕනි. එල්ලාවල පුද්ගලික පොලක් තියෙනවා. එළවළු මිළ අඩුයි. කිරිඇල්ල පොලටත් මීගොඩ වේයන්ගොඩ වගේ වෙලෙදුන්ගෙන් බඩු අඩුමිළට දුන්නොත් සාර්ථක වෙයි. පොලක් සාර්ථක වෙන්නේ අඩුමිළට බඩු දුන්නොත්. ප්‍රමිතිය වගේම මිළත් සාධාරන විය යුතුයි. දීර්ඝකාලීන ගමනක් යන්න පුළුවන්. කිරිඇල්ලට පොලක් අත්‍යාවශ්‍යයි. පාලම ළඟ කුරුවිට පොලෙත් ගැටළු තියෙනවා. වැහිවෙලාවට වැසිජලය නිසා පොල කටයුතු වලට ජනතාවට අපහසුතා තියෙනවා. ඒවාටත් පිලියම් ගන්න. කිරිඇල්ල පොලක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා

**පරකඩුව පොලට පර්චස් 97 ක් ලක්ෂ 17 කට ගත්තේ. දැන් මුදල ඊටත් වැඩියි. එදා කුරුවිටට වඩා වෙලෙන්දෝ ඒකට ආවා. දැන් සමහරු මියගිහින්. සමහරු මේ පළාතේ නෑ. තවත් ව්‍යාපාරිකයින් පිරිසක් ඇති. හොඳ කෘෂි පොලක්. දැන් පරකඩුවට සීයක් දෙසියක් එකතුවෙන්න තැනක් නෑ. පන්සල පාසැල තමයි තියෙන්නේ. පිරිසකට පොදු කටයුත්තකට රැස්වෙන්න මේ ස්ථානයේ තැනක් හදන්න පුළුවන්. කාටහරි දීර්ඝකාලීනව බදු දීලා හරි කරන්න. අවුරුදු 15 කට විතර. සභාවට මුදල් නැත්නම් වෙන ක්‍රමයකට හරි මේ පොල කටයුත්තත් කඩිනම් කරන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා</u>

**අයගම සභාවට අයත් හැරනියාවක ගලතුරේ පොලක් තියෙනවා. සිංහ පිට්ටනියේ. බ්‍රහස්පතින්දාට තියෙන ඒ පොල සාරවත්. කිරිඇල්ලේ ඉඳන් කිලෝ මීටර් එක හමාරක් විතර දුරින් තියෙන්නේ. කිරිඇල්ලට පොලක් සැකසීම සම්බන්ධව සැළසුම්කරලා කරමු.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**අදහස් වලට ස්තූතියි. වර්තමානය වන විට අපිට සති පොලක් පවත්තවන එකත් අභියෝගයක් වෙලා. සුපිරිවෙළඳසැල්වල ආකර්ශනීය වට්ටම් තියෙනවා. නමුත් ගමෙන් එකතුවෙන ගමේ නිෂ්පාදන වලට යම් අවස්ථාවක් දෙන්න ඕනි. යම් යම් පිරිස් එකතුකරගෙන එකතුවෙලා වෙළඳාම් කටයුතු කරන්න ග්‍රාමීය ආර්ථිකය නංවාගන්න අවස්ථාව දෙමු. අපි කඩ කමිටුවටත් මේක යොමු කරමු. අනිත් පොලවල්වලට , වෙළෙඳුන්ට දැනුම්දීලා ඒ හරහා දැනුවත් කරලා කට්ටිය ගෙන්වා ගමු. කිරිඇල්ල වෙලෙඳුන්ට අවස්ථාවක් හදමු. ඉදිරි කටයුතු කරන්න අවශ්‍ය සහාය දෙන්න.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව කිරිඇල්ල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව සඳහා පොළක් ආරම්භ කිරිමට ඉදිරි කටයුතු සිදු කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

**06-03. එල්ලාවල පහලගම පරලියැද්ද අසලින් තුන්දොළ මාර්ගය නිසි ලෙස සකස් කිරීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ විජේසුන්දර මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

**සභා පනතේ වගන්ති ප්‍රකාරව මේ කටයුත්ත කරන්න. මේ මාර්ගයේ පවුල් 12 ක් විතර ඉන්නවා. ඒ අයට මේ අවශ්‍ය මාර්ග යටිතල පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලා සිටියා. ඉදිරි කටයුතු සිදුකර දෙන්න.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

**ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව_එල්ලාවල පහලගම පරලියැද්ද අසලින් තුන්දොළ මාර්ගය නිසි ලෙස සකස් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

**06-04. එපිටවල මුණසිංහ පුර ප්‍රජා මධ්‍යස්ථානය කුරුවිට ප්‍රාදේශිය සභාව සතු අතර එයට විදුලිය ලබාදිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ඉනෝකා මල්ලවආරච්චි මිය-

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එපිටවල මුණසිංහ පුර එම්.එච්. මුදලිහාමි තුමා දුන්න අවසරය මත සභාව විසින් මේ ඉඩමේ ක්‍රිඩා පිටියක් ප්‍රජා ශාලාවක් හැදුවා. සභාවෙන් නඩත්තු කරන්නේ. විදුලිය දෙන්න කියලා ගම්වාසීන් ඉල්ලීම්කලා. විදුලිය දුන්නාම බිල ගෙවන්න ක්‍රමයක් හදමු. සභාවට වැය බරක් නොවන ලෙස කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අජිත් නන්දසිරි මනම්පේරි මහතා

**ඉස්සර විදුලිය තිබුනා. නමුත් පසුව ලයිට් කපලා. පන්සලේ ඉඩමළු. ප්‍රජාශාලාවක් තියෙනවා. ඒකට විදුලිය අවශ්‍යයි.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

**කාර්මික නිලධාරී වාර්තා අරන් ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව_එපිටවල මුණසිංහ පුර ප්‍රජා මධ්‍යස්ථානය කුරුවිට ප්‍රාදේශිය සභාව සතු අතර එයට විදුලිය ලබාදිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

**06-05.** කුරුවිට එක්නැලිගොඩ ගැමුණු ගොවි සංවිධානය හා වතුයාය ග්‍රාමසංවර්ධන සමිතිය මගින් කරනු ලැබූ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ වන පුස්සැල්ල කොක්ඕවිට මාර්ගය, පුස්සැල්ල ගොංකුරේවත්ත මාර්ගය හා පරකඩුව නිල්මිණි උයන අතුරු මාර්ගය සඳහා ගිවිසුම්ගත ප්‍රකාරව කොටසක් ගෙවා ඇති අතර ඉතිරි මුදල් ඇස්තමේන්තු අනුව හා නීත්‍යානුකූලව ගෙවීම් සිදු කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දමින්ද නලීන් අධිකාරම් මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේ සම්බන්ධව ජනතාව මගෙන් ඉල්ලීම් කලා. මේ පිලිබඳව යම් තව දුරටත් අවශ්‍යනම් කාර්මික නිලධාරී ඇරලා පරික්ෂා කරවලා අඩුපාඩු තියේනම් හදවලා ඉදිරි පියවර ගන්න. සමිති දෙකේ ඉල්ලීම් ලිපි සභාගත කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දමින්ද නලීන් අධිකාරම් මහතා</u>

විසල් ජලක්‍රමය යටතේ මිල්ලවිටියත් පාරවල් කීපයක් නඩත්තු කලා. ප්‍රගතිමාවත , අස්වැද්දුමඋයන මාවත, හල්කොටුන්නවත්තපාර ප්‍රතිසංස්කරණය කලා. නමුත් දැන් ආයෙත් නඩත්තු කරන්න වෙලා. වසම භාර මන්ත්‍රිවරයා මම. මේ පාලමේ පැතිබැම්හානියට පත්වෙලා. නල එලුවට වතුරත්නෑ. මේ පාරවල් පරික්ෂා කරවලා ඒ අවශ්‍ය තැන් නඩත්තු කරවන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩග්ලස් ප්‍රේමදාස මහතා</u>

**2015-2016** විසල් ජල ක්‍රමය යහපාලන රජය යටතේ කරපිංච, කිතුල්පේ,පුන්සිරිගම දොරළුබඩවත්ත නොම්මර **4** සමගිමාවත පුංචිතැපැල්ගම ජලනල එළුවා. පුන්සිරගම ඉඳන් වතුර දීගෙන යන්නේ. නමුත් අපේ ප්‍රෙද්ශවල මේ ප්‍රෙද්ශවලට තාම නෑ. පාරවල් පළුදු කරපුවා හදන්න සභාවට කෝටිගානක මුදල් දීලා. ඒත් මේ වෙනකොට මේ කරපු ව්‍යෘපෘතිවල බටඑළපුවා අතරමග නැවතිලා. කාණු කැඩිලා. පාරවල්කැඩිලා. පැච්වැහුවේ නෑ. කහංගම බටයක් දාලා ලැයිම්කාමර ලඟින් නතරවෙලා. අපේ ප්‍රෙද්ශවල මේ නඩත්තු කරන්නේ නැද්ද? කාණුහදන්නේ නැද්ද?. වතුරදෙන්නේ නැද්ද? ඒ කටයුතු කවදාද කරන්නේ?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර් මහතා</u>

එක්නැලිගොඩ ගැමුණු ගොවි සංවිධානය හා වතුයාය ග්‍රාමසංවර්ධන සමිතිය මගින් කරනු ලැබූ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ ඒ වැඩ අවසන් කලේ මොන කාලේද? එදා අකටයුතු උනා. මේක ගෙවන්න ආපු මුදල් ගෙව්වේ නෑ. නැවත පරික්ෂා කලා. අඟල්පහ අඟල් දෙකට කරලා. අකටයුතු කිපයක් වෙලා. මෝලකැලේ කැන්දලන්දේ ස්ථාන කිපයක් තියෙනවා හදන්න. මුදල් අරන්. මේවා නිසා ගැටළු ඇතිවෙලා. ඉදස්සර මේවා ගැන හෙව්වේ නෑ. උපසභාපතිතුමාත් කියනවා වරදක්වෙලා තියේනම් පිලියම් යොදන්න කියලා. කොස්ගල කාණුදැම්මා අනිත්පැත්තේ කාණු උඩ ගල්බැම් හදලා. කාණුව හැදුවත් අඩි හයක්වත් නෑ. ගම්මු ප්‍රශ්න කරනවා. මම සභාව දැණුවත්

කලත් ඒ ගෙවීම් කරලා. අකටයුතු සිදු උනා. මේ ගෙවීම් කරනකොට සභාවේ මන්ත්‍රීවරුන්ගේ ඒකමතික තීන්දු මත කටයුතු කරන්න. උපසභාපතිතුමා නැවත බලන්න කියන්නේ ඒකයි. මේ යෝජනාවට මම එකඟ නෑ. මුදල්ගෙවිම සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා අරන් මුදල් ගෙවිම සුදුසුද? නැද්ද කියලා තීරණය කලොත් මම එකඟයි. නැත්නම් එකඟ නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා</u>

මැලේබැද්ද මිල්ලවිටිය හන්දිය විසල් ජල කටයුතු අතරමඟ නැවතිලා. මේ විසල් ක්‍රමය තවදුරටත් දිර්ඝ කරන්න බැරිද?

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

තව දෙන්න අවශ්‍ය තැන් තියෙනවා. දැනට පරකඩුව දක්වා මේ විසල් ක්‍රමය යනවා. තව අළුතෙන් දෙන්න තියෙන තැන්වලට දෙන්න බලමු. වතුර ප්‍රෙෂර් එක චෙක්කරනවා. එතනින් එහාට දෙන්න හැකියාව බලනවා. ජලය කාටත් ලබාගැනීමේ ගැටළු තියෙනවා. අපි මේ පිලිබඳව වෙනම කතා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>

නඩුකාරදෙනිය පුද්ගලික පාරවල් කඩලා ගන්න රැඳවුම් මුදලුත් තියෙනවා. ඒ ටික නිදහස් කරන්න ඉල්ලිම්කලා. සමහර පාරවල්වල න්න බෑ. අයිරාංගනී ඒ නිවෙස ළඟ බැම්ම කඩලා. ත්‍රි රෝද රථ බයික් වගේ වැදිලා ඒ පාරේ කැඩුන තැන්වල වාහන වලට හානි වෙලා. විධිමත්ව කටයුතු කරන්න. නඩුකාරදෙනිය වසමේ මේ කැඩුන තැන් හදලා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා</u>

පරකඩුව දිගෝව පාර වටප්පිටිය හන්දිය වතුර නෑ. පානීය ජලය නෑ. මේ විසල් ක්‍රමය හරහා වතුරදෙන්න. එසේම අපසභාපතිතුමාගේ යෝජනාව පිලිබඳව අනිවාර්යෙන් පරික්ෂා කරබලා කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා</u>

අපි සභාවට ආපු දිනයේ පටන් රැඳවුම් මුදල් ගෙවීම් අනුමත කරමින් කටයුතු කරනවා. ඒවා කලාට ජනතාවගේ ජල අවශ්‍යතා සැපයීම් සිදුවෙලා නෑ. කුරුවිට විශාල පාරිභෝගික සංඛ්‍යාවක් ඉන්නවා. ජලය නැතිව අපහසුතා විදිනවා. මේ කුඩානගර ජල ව්‍යාපෘතියේ වතුර දුන්නාට පිරිසුදු නෑ. නමුත් තව දුරටත් අපිරිසුදු වතුර දිමද පිරිසුදු වතුර දීමද සුදුසු. බට එලලා වසර ගානකට පෙර. බට එලුවට ජලය දීලා නෑ. දිනපතා අහනවා. කවදාදා වතුර දෙන්නේ කියලා. විශේෂයෙන් දෙල්ගමුව කඳංගොඩ දකුණ මල්වත්ත ඕවිට පවුල් 20 ක් විතර ඉන්නවා. පායන කාලෙට ළිං වල වතුර නෑ. ඇතින් ගේන්නේ. ඒකට විසඳුමක් දෙන්න. ළඟදි වතුයාය විසල් බට එලුවා. කරුණාකරලා ඉතා ඉක්මනට ජනතාවට වතුර දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න  මහතා</u>

අපේ කාලේ මේ විසල් ජලය ගන්න යෝජනාව ඉදිරිපත් කලේ. මාර්ග සිතියමක් ඇති. ඒ අනුවයි මාර්ග පළුදු කරලා කලේ. දමින්ද මන්ත්‍රිතුමා කිව්ව මාර්ග වසර හතරක් පහක් වෙනවා. දැන් නඩත්තු කල යුතුයි. ඉතිහාසයේ අපි සභාව විසුරුවන්න පෙර මේ යෝජනාවට ගිවිසුම් අත්සන් කලේ. වැඩ ආරම්භ කලා. ක්‍රමවේදය අනුව. ගිවිසුම් අත්සන්කලා. ලේකම් නිවාඩු ගිහින් හිටි නිසා මේ කටයුත්ත කරන්න බැරිඋනා. එක්නැලිගොඩ සමිතියට මේ හිටපු කාර්මික නිලධාරියෙක් රු. 40000.00 ක් දුන්නොත් විතරයි කියලා මේ වැඩේ වෙන්නේ කිව්වාළු. නැත්නම් බෑ කිව්වාළු. සභාපති එක්ක ඇරියස් එකක් කිව්වාළු. මේ පිලිබඳව ලිපියකුත් දුන්නා. කොමසාරිස්ට. ක්‍රියාත්මක උනේ නෑ. විමර්ශනයක් ගියා. ඒ විමර්හනයට කියලා සමිතියෙන් මුදල් ඉල්ලපු එකත්. ඒ අය සාක්කි දෙනවා. නමුත් ක්‍රියාමාර්ගයක් ගත්තේ නෑ. මේ සමිතිවලට මුදල් දෙන්න ඕනි. කාර්මික නිලධාරි නිසායිමේක උනේ. ප්‍රමාදය. නැවත ඕනිනම් පරික්ෂනයක් කරන්න. කමිටුවක් පත්කරන්න. දේවින්ද මන්ත්‍රිතුමාත් දාන්න. උපසභාපතිතුමා මංගල ඩයස් මන්ත්‍රිතුමාවත් දාන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

සභාවේ නොවන අයව දාන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩග්ලස් ප්‍රේමදාස මහතා</u>

මම සඳහන් කල ව්‍යාපෘතිත් බලන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මොහාන් චන්දික අමරසේන මහතා</u>

අදාල සමිතිත් ගෙන්වාගෙන දිනදාගෙන මේ පිලිබඳව පරික්ෂාකරමු. අඩුපාඩු ඇත්නම් හදාගමු. සෑහීමට පත්උනොත් ඉදිරි සභාවේ තීන්දුවක් ගමු. මිල්ලවිටියටත් වතුනෑ. ජනතාව අපෙන් අහනවා. අපිට කෙසේවෙතත් බට එලලා තියෙන අයට දෙන්න. ජලසම්පාදන මණ්ඩලය දැනුවත් කරලා අවුරුද්දට පෙර ජලය දෙන්න. ඒ කටයුතු කඩිනම්කරවන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අද වන විට පාණීය ජලය නොමැතිකම ගැටළුවක්. පසුගිය කාලේ මේ ජල අවශ්‍යතා පිලිබඳව දත්ත ගැනීමේදි එලිඋනේ පාණීය ජලය අඩුම රත්නපුරයළු. දියඇලි ගංගා විශාල ප්‍රමාණයක් තිබුනත්. ඒ නිසා පාණීය ජලය ජනතාවට දෙන්න මැදිහත්විය යුතුයි. පාණීය ජලය විශාල අවශ්‍යතාවක් වෙලා. කුරුවිට ප්‍රෙද්ශයතුළත් පානිය ජලහිඟකම ගැටළුවක්. දැන් ළිංවලට වඩා ජලනල හරහා වතුරගන්නේ. විසල් ජලය පූර්න ලෙස නොවුනත් පරකඩුව දක්වා ජලය යනවා නිශ්චිතව. අතුරු මාර්ග වලත් යම් ප්‍රමාණයක් දිලා. පසුගිය කාලේ ජලය දීමේ යම් කටයුතු අතරමඟ නැවතිලා. මෑතක ආයෙත් පටන් ගත්තා. කුරුවිට නගරය දක්වා නල එලලා. මලව දක්වා ජලය දීලා. ඉදිරියට අනෙක් පැතිවලටත් ඉල්ලීම් කරමු. මැදිහත්වෙමු. මේ යෝජනාවට අදාලට අපි පරික්ෂන කමිටුවක් හරහා පරීක්ෂා කරලා ඒ ගන්න නිර්දේශය පළාත් පාලන කොමසාරිස්ට ඇරලා අනුමැතිය අරන් ගෙවමු. කමිටුවක් දැන් පත්කරමු.

මේ අවස්ථාවේදි කුරුවිට එක්නැලිගොඩ ගැමුණු ගොවි සංවිධානය හා වතුයාය ග්‍රාමසංවර්ධන සමිතිය මගින් කරනු ලැබු විසල් ජල යෝජනා ක්‍රමය යටතේ වන පුස්සැල්ල

**කොක්ඕවිට මාර්ගය, පුස්සැල්ල ගොංකුරේවත්ත මාර්ගය හා පරකඩුව නිල්මිණි උයන අතුරු මාර්ගය සඳහා ගිවිසුම්ගත ප්‍රකාරව කොටසක් ගෙවා ඇති අතර ඉතිරි මුදල් ඇස්තමේන්තු අනුව හා නීත්‍යානුකූලව ගෙවීම් සිදු කිරිමට පෙර ඒ සම්බන්ධව පරික්ෂාකර නිර්දේශ ගැනිම සඳහා කමිටුවක් පත්කිරිම ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාවෙන් හා ගරු උපසභාපති අනිල් ලියනගේ මහතාගේ ස්ථිරත්වයෙන් සිදුවු අතර එහි සාමාජිකයින් ලෙස_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.ප්‍රේමරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දමින්ද නලින් අධිකාරම් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මහේෂ් නාපාවල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සම්පත් රූපසිංහ මහතා, ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා, ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී ටී.ආර්. රන්ජන් කීර්ති මයා, ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරිණී ටි.ටි.මනමේන්ද්‍ර මිය යන පිරිසව පත්කරගන්නා ලදී.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව_කුරුවිට එක්නැලිගොඩ ගැමුණු ගොවි සංවිධානය හා වතුයාය ග්‍රාමසංවර්ධන සමිතිය මගින් කරනු ලැබූ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ වන පුස්සැල්ල කොක්ඕවිට මාර්ගය, පුස්සැල්ල ගොංකුරේවත්ත මාර්ගය හා පරකඩුව නිල්මිණි උයන අතුරු මාර්ගය සඳහා ගිවිසුම්ගත ප්‍රකාරව කොටසක් ගෙවා ඇති අතර ඉතිරි මුදල් ඇස්තමේන්තු අනුව හා නීත්‍යානුකූලව ගෙවීම් සිදු කිරිමට පෙර ඒ සම්බන්ධව ස්ථානිය පරික්ෂණයක් සිදුකිරීම සඳහා මෙදින සභාවේ පත්කරගත් කමිටුව මගින් පරික්ෂාවක් සිදුකර එම නිර්දේශ පළාත්පාලනකොමසාරිස්ට යොමුකර අනුමැතිය ලබාගෙන ගෙවීම් සිදුකිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-</u>**
**06-06. වළඳුර නඩුකාරදෙනිය වසමේ මාර්ග නම්කර ප්‍රදර්ශනය කිරිම සඳහා යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-</u>**

මාර්ග සම්බන්ධව නිශ්චිතව නම් කර නොමැති නිසා තැපෑලෙදි ගැටළු ඇති වෙනවා. ගැසට් කිරීමේදි යොදාඇති නම් කිරිම් බැළුවොත් 480- නඩුකාරදෙනිය පලමු පටුමග දෙවන අතුරු මාර්ගය පලමු මාර්ගය, 461- නඩුකාරදෙනිය පලමුවන පටුමග දෙවන අතුරු මාර්ගය තුන්වන මාර්ගය, 482 - නඩුකාරදෙනිය පලමුවන පටුමග දෙවන අතුරු මාර්ගය තුන්වන මාවත පලමු අතුරු මාර්ගය ලෙස. මේ විධිහ නාමකරනය තුලින් සැම තැනම ගැටළු. ප්‍රායෝගිකව අපහසුයි. තැපෑලෙන් ලිපි එනකොට මේ විධිහ භාවිතය ඉතාම අපහසුයි. ගමේ ග්‍රාමසංවර්ධන සමිතිය එක්ක කතා කරලා බහුතර ජනතාවත් එක්ක ඒ අයගේ යෝජනාවකුයි ඉදිරිපත් කලේ. ඉදිරියේදි මේ විය යුතු සංශෝධිත නාමයන් ඉදිරිපත් කරන්නම්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව වළදූර නඩුකාරදෙනිය වසමේ මාර්ග නම්කර ප්‍රදර්ශනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-**

**06-07. යහලකොටුන්න නුගහේන මාර්ගයේ සම්පත් දේවගේ මයාගේ නිවස අසල සිට උපුල් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**
**ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව යහලකොටුන්න නුගහේන මාර්ගයේ සම්පත් දේවගේ මයාගේ නිවස අසල සිට උපුල් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-**

**06-08. නඩුකාරදෙනිය ඉසුරු ග්‍රොසරිය අසල සිට ප්‍රජා ශාලාව දෙසට මාර්ගය කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-**
**වැයශිර්ෂයෙන් විපක්ෂයේ මන්ත්‍රින් හට රුපියල් දෙලන්ෂ තිස්දාහක ප්‍රතිපාදන දෙනවා කිව්වා. ග්‍රාමසංවර්ධන සමිතියෙන් කරන්න ගියාම ඒ ලිපිලේඛණ ගන්න ගියාම වර්තමාන සමිතියට චෝදනා තියෙනවා. ඒජී ඔපීස් එකෙන් අත්සන් කරන්න බෑ කිව්වා. වෙන සමිත්යකින් කරන්න හැදුවුවාම කාලවේලා මදි කිව්වා. ඒ මුදල් මේ යෝජනාවට ගත හැකිද?**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**
ඒ මුදල් මේ අවුරුද්දේ ගන්න බෑ. ඒ ඒ වසරට අදාල මුදලක් මේ කටයුත්ත ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව නඩුකාරදෙනිය ඉසුරු ග්‍රොසරිය අසල සිට ප්‍රජා ශාලාව දෙසට මාර්ගය කොන්ක්‍රීට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.මහින්ද මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.මහින්ද මහතා-</u>**

**06-09. ගොරකා ඇල සිට කුරුවිට දක්වා මාර්ගයේ පාතගම සිට හැරෙන ස්ථානයට ආසන්නව අබලන්වී ඇති බෝක්කුව අළුත්වැඩියා කිරිමට රු. 20 00000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා-</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.මහින්ද මහතා-</u>**

**මේක අනාරක්ෂිත බෝක්කුවක්. ඉරිතලලා. අඩි 15 ක් විතර ගල් ගැලවිලා. මගී ප්‍රවාහන බස්රථ ගමන් කරනවා මේ පාරේ. පළාත් සභා මාර්ගයක්. පළාත් සභාව හරහා හෝ මේ කටයුත්ත කඩිනමින් කරවන්න.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u> -**
**අදාළ තැන්වලට කියලා කටයුත්තට මැදිහත්විම් කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>එච්.වි.මහින්ද</u> මහතාගේ යෝජනාව අනුව ගොරකා ඇල සිට කුරුවිට දක්වා මාර්ගයේ පාතගම සිට හැරෙන ස්ථානයට ආසන්නව අබලන්වී ඇති බෝක්කුව අළුත්වැඩියා කිරිමට රු. 20 00000.00 ක ප්‍රතිපාදන ලබාගැනීම සඳහා පළාත් සභාවට හා අදාළ අංශ දැනුවත් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.මහින්ද මහතා-</u>**

**06- 10. නාගොඩ වෙලේ කඩේ අසල මාර්ගයේ ජලය රැඳෙන කොටසේ කාණු සකස් කර ගමනාගමනයට සුදුසු පරිදි සංවර්ධනය කිරීමට රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා-</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා-

කලින් සඳහන් කල බෝක්කුවට මීටර් 100 ක් විතර ඉදිරියෙන් ජලය රැඳෙන තැනක්. අඟල් අටක් නමයක් විතර වතුර පිරුණාම දින තුන හතරක් තියෙනවා. වාහන ගමනාගමනය නිසා අනතුරු සිදුවීමේ ප්‍රවනතාවය ඉහලයි. සුදුසු ලෙස සකසන්න . අදාල අංශ හෝ දැනුවත්කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා-

මේ ස්ථානය අනතුරුදායකයි. හැකි ඉක්මනින් සකසා දෙන්න. පළාත් සභාවට හෝ දැනුම් දෙන්න. වැවේකඩේ අසලත් වලක් තියෙනවා. වතුර රැඳිලා. ප්‍රවාහනයට අමාරුයි. වලවල් හැදිලා.ඒ ටිකත් හදලා දෙන්න.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

අදාළ තැන්වලට කියලා කටයුත්තට මැදිහත්වීම් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතාගේ යෝජනාව අනුව නාගොඩ වෙලේ කඩේ අසල මාර්ගයේ ජලය රැඳෙන කොටසේ කාණු සකස් කර ගමනාගමනයට සුදුසු පරිදි සංවර්ධනය කිරීමට රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාගැනීම සඳහා පළාත් සභාවට හා අදාළ අංශ දැනුවත් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා-

06- 11. හොලිපිටිය චන්ද්‍රසේකර මහතාගේ නිවස ඉදිරිපිටින් පහළට ඇති පඩිපෙලේ කෙළවරේ සිට පොදු ළිඳට ගමන්කරන අඩිපාර අබලන්වී ඇති බැවින් කොන්ක්‍රීට් යොදා පඩිපෙලක් සැකසීමට රු. 400000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා-

පොදු ළිඳට යන පාර. අඩි 100 ක් විතර පඩිපෙලක් අවශ්‍ය වෙන්නේ.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතාගේ යෝජනාව අනුව හොලිපිටිය චන්ද්‍රසේකර මහතාගේ නිවස ඉදිරිපිටින් පහළට ඇති පඩිපෙලේ කෙළවරේ සිට පොදු ළිඳට ගමන්කරන අඩිපාර අබලන්වී ඇති බැවින් කොන්ක්‍රීට් යොදා පඩිපෙලක් සැකසීමට රු. 400000.00 ක ප්‍රතිපාදන ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

**06- 12.** **වළඳුර කොට්ඨාශයේ යහලකොටුන්න සුසානභූමියට යන පාර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා-

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

**ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව වළඳුර කොට්ඨාශයේ යහලකොටුන්න සුසානභූමියට යන පාර සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

**06-13.** **වළඳුර කොට්ඨාශයේ ආරිද්ද ඔස්සන්ගොඩවත්ත මාර්ගයේ පරගාල අසලට බෝක්කුවක් දැමීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒ.සශිකලා මදුභාෂිණී මිය

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය

**මේක විකල්ප මාර්ගයක්.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

**ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව වළඳුර කොට්ඨාශයේ ආරිද්ද ඔස්සන්ගොඩවත්ත මාර්ගයේ පරගාල අසලට බෝක්කුවක් දැමීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. ඒන්. මනම්පේරි මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. ඒන්. මනම්පේරි මහතා-</u>

**06-14.** **එපිටවෙල හා ඉඩංගොඩ ග්‍රාමසේවා වසම් වෙන්වන කිරිඇල්ල පරණ පොලිසිය ඉදිරිපිටින් ඇති වරකාගොඩකන්දට යන පාර අයිනේ ඇති ගල්ලෑල්ල පොත්ත ඇළ දැඩි ලෙස අබලන්ව බැම්ම බිඳී ගොස් ජලය අපතේ යන බැවින් එහි බැම්ම සකසා එහි ඇති වතුර පීල්ල සකස්කොට එයට ටැංකියක් යොදා සකස්කිරීමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා-**</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**</u>

**ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. ඒන්. මනම්පේරි මහතාගේ යෝජනාව අනුව එපිටවෙල හා ඉඩංගොඩ ග්‍රාමසේවා වසම් වෙන්වන කිරිඇල්ල පරණ පොලිසිය ඉදිරිපිටින් ඇති වරකාගොඩකන්දට යන පාර අයිනේ ඇති ගල්ලෑල්ල පොත්ත ඇළ දැඩි ලෙස අබලන්ව බැම්ම බිඳී ගොස් ජලය අපතේ යන බැවින් එහි බැම්ම සකසා එහි ඇති වතුර පීල්ල සකස්කොට එයට ටැංකියක් යොදා සකස්කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. ඒන්. මනම්පේරි මහතා-</u>

**06-15.** **අංක 145, එපිටවෙල ග්‍රාමසේවා වසමේ, පරණපාර, එපිටවෙල බුදුමැදුර ලඟින් ඇති, නිවාස 10 කට පමන යන ඕවිටිගල මාර්ගය සෝදාපාළුවට ලක්ව ඇති අතර එම මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා-**</u>

**එම යෝජනාව ස්ථිර කරමි.** <u>**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**</u>

**ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. ඒන්. මනම්පේරි මහතාගේ යෝජනාව අනුව අංක 145, එපිටවෙල ග්‍රාමසේවා වසමේ, පරණපාර, එපිටවෙල බුදුමැදුර ලඟින් ඇති, නිවාස 10 කට පමන යන ඕවිටිගල මාර්ගය සෝදාපාළුවට ලක්ව ඇති අතර එම මාර්ගය සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය-

_06- 16. කුරුවිට ඩුහලෝ වත්තේ පානීය ජල ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරිමට ප්‍රතිපාදන ලබා දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මියගේ යෝජනාව අනුව කුරුවිට ඩුහලෝ වත්තේ පානීය ජල ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කිරිමට ප්‍රතිපාදන ලබා දීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය-
06- 17. විසල් රත්නපුර ජල යෝජනා ක්‍රමය සඳහා කාහේන්ගම ට අදාලව පළුදු කල ස්ථාන දෙකක් වන ගොරොක්ගහවත්ත ( එගොඩවත්ත පාර) මාර්ගයේ ආරම්භක ස්ථානය හා යුධ හමුදා කඳවුර ඉදිරිපස පැරඩයිස් දෙසට මාර්ගයේ පළුදු කළ ස්ථානය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ධර්මසිරි මහතා.
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය-
මේ පාරවල් දෙකේම පළුදුකිරිම් කරලා තියෙන්නේ පසුගිය කාලේ. නමුත් තාම හදලා නෑ. ඒ ස්ථාන දෙක ප්‍රතිසංස්කරනය කරලා දෙන්න. පසුගිය දිනක විසල් ජලය ගන්න මාර්ග පළුදුකිරිමක් කරලා .ජනතාවට වතුර ගන්නත් ඕනි. නමුත් මාර්ග පළුදු කිරීමේදි ඒ සඳහා යම් අධීක්ෂණයක් ඕනි. මාස එකහමාරයි මේ පාර හදලා අවසන්කල මාර්ගය. ශාන්තිපුර 8 වන පටුමග. ව්‍යාපෘති මුදල් හෝ රැඳවුම් මුදල් වත් අරන් නෑ. වතුර ගන්න බට දාන්න පාර කපලා නෙමේ. කුළුගෙඩියකින් තලලා. 4 පටුමග පදාස පිටින් ගැලවිලා. මුදල් අරගෙනත් නෑ. පාර හැදුවට පස්සේ නැවත ලිපි ඉදිරිපත්කරනවා. එතකොට නිලධාරි ගිහින් බලනවා. මේ මාර්ග දෙක ගැනම සභාවට ලිපියක් දැම්මා. ඒ ස්ථාන දෙක ගැන සභාවට වගකියන්න බැ. මේවා පළාත් සභා මාර්ග. මුදල් අරන්නෑ. දැන්වත් වෙනසක් කරන්න. මේ මාර්ග කඩනකොට නිලධාරියෙක් ඉන්න ඕනි. නැවත හරියට ඒක හදනවද බලන්නත් ඕනි. හිතට වේදනාවක් මේ මාර්ග දෙක ගැන.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මියගේ යෝජනාව අනුව විසල් රත්නපුර ජල යෝජනා ක්‍රමය සඳහා කාහේන්ගම ට අදාලව පළුදු කල ස්ථාන දෙකක් වන ගොරොක්ගහවත්ත ( එගොඩවත්ත පාර) මාර්ගයේ ආරම්භක ස්ථානය හා යුධ හමුදා කඳවුර ඉදිරිපස පැරඩයිස් දෙසට මාර්ගයේ පළුදු කළ ස්ථානය ප්‍රතිසංස්කරණය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය-</u>

**06- 18. පැරඩයිස් ශ්‍රී සමන් පුර අතුරු මාර්ගයේ නිර්මලා මියගේ නිවස දක්වා කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ධර්මසිරි මහතා.</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**
**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
**ප්‍රතිපාදන ලැබෙන අයුරින් ඉදිරි කටයුතු කරමු**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මියගේ යෝජනාව අනුව පැරඩයිස් ශ්‍රී සමන් පුර අතුරු මාර්ගයේ නිර්මලා මියගේ නිවස දක්වා කොටස සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-</u>

06-19 . මුකුනුවැන්න ස්ටෝරුවෙන් කිරිමුදවන ටැංකි වලඇති ඇසිඩ් මිශ්‍ර අප ජලය ප්‍රධාන ඇළ මාර්ගයට බැහැරකිරීමේදි පිරිසුදුකර බැහැර කිරිමට පුස්සැල්ලාව වැවිලිසමාගමට ලිඛිතව දැනුවත් කිරිමට කටයුතු කරන ලෙසත් එසේ නොකරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා.</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-</u>

**මේ ඇළ ගැන බොහේපු මන්ත්‍රීතුමාත් දන්නවා. මුකුනුවැන්න ස්ටෝරුවෙන් භාවිතා කරන ජලය පිරිපහදු නොකර මේ ඇළට දානවා. පොදු ජනතාවට අතපයවත් හෝදන්න බැ. මේ**

**තත්වය හානිකරයි. ලිඛිතව දැනුවත් කරලා ඒ පිලිබඳව කිසි කටයුතු කරන්නේ නැත්නම් නීතිමය පියවරක් ගමු.**

**ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා.**

මීට අවුරුදු 12 කට පමන පෙර මේ රබර් ශාලාවේ අපජලය පිරිපහදු කරලා යි ස්වාභාවික ජලයට එකතු කලේ. ඒ සඳහා යන්ත්‍ර තිබුනා. ප්‍රෙද්ශවාසින් යම් යම් අවස්ථාවල විවේචන කලා ඒ යන්ත්‍ර මගින් පිරිපහදු කරන්නේ  නැතිව ඇලට වතුර දානවා කියලා. අපේ කෘෂි කටයුතුවල බටහිර පත්බේරිය වෙල්යායට වතුර යන ප්‍රධාන ජල ගබඩා අමුණ මේක. මේ ආකාරයට ඇලට අපජලය එකතුවිම ගොවියන්ට හානිකරයි. සෞඛ්‍ය ගැටළු ඇතිවෙයි. නමුත් සමහරු කැමති අයත් ඉන්නවා. ඇසිඩ් වලට මඩතැම්බිලා තනකොල මැරෙනවළු.නමුත් මේ තත්ව මත නොසිතන විනාශ වෙන්න පුළුවන්. එසේම අපේ ප්‍රෙද්ශයේ 100 ක් විතර ජනතාව දෛනික කම්කරු රැකියාව කරනතැනක් මේක. ඒවාත් රැකෙන ලෙස ගොවියාත් රැකෙන ලෙස ජලය පිරිපහදු කරලා  පිටකරන්න කටයුතු සලස්වමු.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

කර්මාන්තයත් රැකිය යුතුයි. ඒවා සඳහා නීතිරෙගුලාසි තියෙනවා. ඒ නිසා යම් කර්මාන්තයක් අපජලය පිරිපහදු නොකර ප්‍රමිතියකින් තොරව ජලයට බැහැරකරනවා නම් අදාල නීතියක් තියෙනවා. නිතිමය තත්වය අනුව නිසිකටයුතු නොකරනවානම් අපි ක්‍රියාමාර්ගයක් ගමු. මූලිකවම අපි අදාල වැවිලි සමාගම ලිඛිතව දැනුවත් කරමු.

ඒ  අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා ගේ යෝජනාව අනුව** මුකුනුවැන්න ස්ටෝරුවෙන් කිරිමුදවන ටැංකි වලඇති ඇසිඩ් මිශ්‍ර අප ජලය ප්‍රධාන ඇළ මාර්ගයට බැහැරකිරීමේදි පිරිසුදුකර බැහැර කිරිම සිදුකරන ලෙස  පුස්සැල්ලාව වැවිලිසමාගම ලිඛිතව දැනුවත් කිරිමටත්  එසේ නොකරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනිමටත්  **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-

06-20. වටප්පිටිය සිට මුකුනුවැන්න ස්ටෝරුව දෙසට ඇති මාර්ගයේ කාණු පද්ධතියක් දැමීම සඳහා මූලිකව තාක්ෂනික නිලධාරී වාර්තාවක් ලබාගෙන ඇස්තමේන්තුගත කර මුදල් ප්‍රතිපාදන වෙන්කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා.**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-

මේ මාර්ගය කාණු පද්ධතියක් නැතිව සංවර්ධනය කරලා තේරුමක් නෑ. කාණු හදන්න ගියාමත් සමහර පිරිස් වෙතින් නොයෙක් ප්‍රශ්න එයි. ඒ නිසා කාර්මික නිලධාරි වාර්තා අරන් කරමු. මාර්ගයට කාණු පද්ධතිය දැමීම මූලිකවම සිදු  විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා.

මුකුනුවැන්න පමනක් නෙවෙයි. ඕනෑම මාර්ගයක් කාර්මික නිලධාරි වාර්තා අරන් සිදුකිරිම සුදුසුයි. මේතුමා අදහස් කරන විධිහට මුකුනුවැන්න මාර්ගය කාර්මික නිලධාරි වාර්තා අරන්

කානු හදන්න කටයුතු කරන්න කියන්නේ නැත්නම් දේශපාලන මැදිහත්වීම් සිදුවෙයි කියලා වගේ. දේශපාලකයින් කරන්නේ ජනතා අදහස් දැක්වීමයි. ජනතාවගේ නියෝජිතයින් විධිහට ජනතා අදහස දක්වන අය. ජනතාව අපිව මෙතනට එව්වේ මෙතනට මේ ජනතාවගේ ප්‍රෙද්ශයේ ගැටළු කියන්න. අපිත් ඒකට බැඳී ඉන්නවා. ඒ අතරම අපිට වඩා තාක්ෂනික දැනුම තියෙන කාර්මික නිලධාරි මගින් මේ කටයුතු පිලිබඳ වාර්තා අරන් සිදු කිරිම විය යුතුයි. සාර්ථකව කරමු. ළමා මධ්‍යස්ථානය ඉදිරිපිට පාරේ කාණුව වහලා. ඇහැලියගොඩ පොලිසියෙන් ඒක පරික්ෂාකරන්න ආවා. කාර්මික නිලධාරි වාර්තා ගන්න කිව්වා. කාර්මික නිලධාරිට එවේලේ ප්‍රවාහන පහසුකමක් තිබුනේ නැති නිසා අනතුරුගස් බලන්න ගිය ගමන් මගේ ත්‍රිවිල් එකේ ගියා. වවන හුවමාරුවක් උනා. ජලය බැස යමින් තිබුන කානුවක් වහලා තියෙන්නේ. ඒක අරින්න කිව්වා. අල්ලපුගෙදරට වතුර යන එක නවත්තවන්න. ඒ කානුව වහලා හින්දා වැස්ස වෙලාවට ඒ සේරම වතුර අර ගෙදරට ගලනවා. ඒ කානුව ඇරියොත් ඒ ගැටළුව නැති වෙනවා. නමුත් තාම ඇරලා නෑ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

වටප්පිටිය වරිපනම් සීමාවේ මේ හරිය දියුණු ගම් ප්‍රෙද්ශ. මූලික සේවාවන් සැපයිය යුතුයි. ඉස්සර කෝච්චි පාර. වර්ෂා කාලෙට ජලයෙන් යට වෙනවා. මටත් මේ පිලිබඳව වාර්තා උනා. වැටුම්මල මාර්ගයේ බස් එකට යන්න විතරයි ඉඩ තියෙන්නේ. වාහන අයින් කරන්න ඉඩක් නෑ. විධිමත්ව ජලය බැසයන්න ක්‍රමවේදයක් නෑ. පරනගම මුදුන්කොටුව මාර්ගයේ ක්‍රමවේදය ආදර්ශයක්. ඒක බලන්න. පාකිං හදලා තියෙනවා. ඉඩ තියෙන ස්ථාන කීපයක . ඒක ප්‍රමාණවත්. ගැටළුවක් නෑ. වටප්පිටිය ස්ථානය ජනාකීර්ණයි. මධ්‍යමහා විද්‍යාලයක්, ප්‍රාථමික විද්‍යාලයක්, පොලකුත් එයි. විශාල ජනතාවක් එයි. විධිමත් ව සංවර්ධනය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා.

**වලදූර වැලිගොඩැල්ල පාර ප්‍රභාත් මහතාගේ නිවස අසල බෝක්කුව පරගලතැන්න මාර්ගය පුළුල් කිරීම ඉසුරු ග්‍රොසරිය අසල කොන්ක්‍රිට් කිරිම පොදු සංවර්ධන කටයුතු වලතියෙන ගැටළු සම්බන්ධව මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නෑ. මේ සම්බන්ධව තොරතුරු ඉල්ලූ විට ලිපියක් මගින් ඉදිරිපත් කරන ලෙස දැනුවත් කලා. ඉහත ව්‍යාපෘති සම්බන්ධව පුළුල් පරික්ෂනයක් අවශ්‍යයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිරෝෂා ලියනගේ මිය-

වලදූර පාළුවන්න ආපදාවට පත්වූ ස්ථාන යටතේ බෝක්කුව දැම්මේ. මනමේන්ද්‍ර මිස් මගින් ඇස්තමේන්තු සැකසුවේ. ඔඩිට් මගින්, පළාත් පාලනයෙන්, කාර්මික නිලධාරින් මගින් බැළුවා. ගැටළුවක් නෑ. පාරේ පළල අඩි 8යි. බෝක්කුව අඩි 9 යි. මීට පෙර තිබුන බෝක්කුව කඩා වැටිලා. දැනට ලැබුණ ප්‍රතිපාදන අනුව මේ කටයුත්ත කලා. වැඩි විස්තර අවශ්‍ය නම් කාර්මික නිලධාරී මගින් ලබා ගන්න. වැලිගොඩැල්ල ලක්ෂ දහයයි. පාරේ වලවල් වැහුවා. ඒ අවශ්‍ය දේවල් කලා. විමර්ශන නිලධාරී පළාත් ප්‍රධාන අමාත්‍යාංශයෙන් බැළුවා. දේෂ නෑ. වලවල් වහලා තියෙන්නේ. බස් එක යනවා. ලක්ෂ 10 ට කළ හැකි උපරිමය කළා. අඩි 650 ක්. අවශ්‍ය නම් ආයෙත් බලන්න. පරගලතැන්න මාර්ගයේ රැඳවුම් තියෙනවා. ගැටළු විසඳුවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.

පාළුවත්ත පාර අඩි 10 යි. අඩි 9 බෝක්කුවක් මදි. පාර ඊට වඩා පළල්. බස් එකක් යනවා. එෆ් 1 අන්තර් ගම්මාන ව්‍යාපෘතිය යටතේ කල පාරක්. පන්සල පාර,වැලිගොඩැල්ල පාර, පරගලතැන්න පාර ප්‍රාදේශිය ලේකම් මගින් කල ව්‍යාපෘති. මුලින්ම සභා පාරක් හදනකොට සභාවේ අනුමැතිය ගන්නවා. මුදල් ගෙවනකොටත් සභාවේ පාරක් නම් සභාවේ නිර්දේශය ඕනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කලාට පස්සේ ගැටළු එන්නේ සභාවට. වැලිගොඩැල්ල පාර වලවල් වැහුවට ප්‍රමිතියක් නෑ. පස්උඩ තාර දාලා. හාරලා බලන්න. වැහි දෙකක් වැස්ස ගමන් හෝදගෙන යනවා. අපරාදේ මුදල්. පරගලතැන්න පාර බැකෝදාලා හාරද්දි කොන්ක්‍රිට් එක කැඩිලා. පැති කැඩිලා. පස්දාලා කොටනවා. ඒවා හොට ගැලපෙන්නේ නෑ. පාර පලල්වෙන්න කපලා. ඒවා කරද්දි දේපල හානිවෙලා. පාරේ කපලා දාපු ටික එහෙමමයි. මුදල් ඉවරළු. ඇස්තමේන්තුවක් සකසන කොට නිශ්චිත විය යුතුයි. ප්‍රෙද්ශය, මුදල ,කරන වැඩය නිශ්චිත විය යුතුයි. මේක සභාවේ පාරක් නිසා කැඩුන ටිකට සමිතියෙන් මුදල අයකරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කේ. විජේසිරි මහතා.

**පොහොරබාව උඩගංකන්ද මාර්ගය හැදුවේ ග්‍රාමසංවර්ධන සමිතියෙන්. සභා මුදල් ලක්ෂ පහක් යොදවලා. මේ මාර්ග ප්‍රදේශය කඳු සහිතයි. මාර්ගයේ උඩ කොටසේ වතුර ගලාගෙන ඇවිත් ගෙවල් යටවෙනවා. කොන්ක්‍රිට් කලාට පස්සේ පාර ඉස්සුනා. ඒබීසි දාන්න කියලා ඒක කලත් විශාල වතුර පාරක් නිසා ගෙවල් යටවෙනවා. මේ ගැටළුව පිරිස අතර පහරදීමක් දක්වා ගියා. මේ මාර්ගයේ කාණු දාන්න බෑ. මාර්ගයේ දෙපස ඉඩ නෑ. කඳු ආශ්‍රිත පාරවල් වලට පාර හරහා යකඩ කම්බි දැලක් දාලා අඩි එකහමාරේ විතර වලක් හැදුවොත් සියයට පනහක් විතර මේ උඩින් එන වතුර පාර නවත්වන්න පුළුවන්. කාර්මික නිලධාරී එක්ක ගිහින් ඒක කරමු. මේ ගමක ලොකු ගැටළුවක්. අවධානය දෙන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.

මටත් ඒ සම්බන්ධ වීඩියෝ ලැබුනා. ඒවා තාක්ෂණික ගැටළු. අළුතෙන් ඉදිකිරීම් කරද්දි ගෙවල්වලට වැහි වතුර නොයනලෙස ඒ ඉදිකිරීම් තාක්ෂනයත් එක්ක කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-

අදහස් පල කල සියළු දෙනාට ස්තුතියි. බොතේජු මන්ත්‍රී තුමා අදහසක් දැක්වූවා. මගේ කොට්ඨාශයේ කාණු පද්ධතියේ ලොකු ගැටළු තියෙන පාරක් ඕක. ඒ කානු හදන්න කියන එක ගැන වෙන ආකාරයකින් මට කියන්න ඕනි නෑ. බෙතේජු මන්ත්‍රීතුමා කියන විධිහට වෙන බලපෑම් නම් මම කෙළින්ම ඒ ගැන යෝජනා කරනවා. ඒවා නෑ. මෙතන ලොකු ගැටළුවක්. ගෙවල්වල තාප්ප පාරේ. කාර්මික නිලධාරී වාර්තාවෙන් ඒවාට විසඳුම් කිව්වාම ගැටළුවක් නෑ.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

පොදුවේ මාර්ග සියල්ල පිලිබඳව කටයුතු වලදි කාර්මික නිලධාරි වාර්තා ඇස්තමේන්තු අරන් කටයුතු කරන්නේ. ඒ නිර්දේශ හෝ ඇස්තමේන්තු වලට පටහැනිව කරලා නම් ඒ පිලිබඳව හොයන්න පුළුවන්. නමුත් ඒ ව්‍යාපෘති කාර්මික නිලධාරී වාර්තා ඇස්තමේන්තු නිර්දේශ

අනුව නිසි පරිදි කරලා නම් ගැටළුවක් නෑ. අවශ්‍යතාවය අනුව තව දුරටත් සංවර්ධනය කරන්නත් පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.</u>

යම් ගැටළුවක් තියෙනවා. ඇස්තමේන්තුව හදපු කාර්මික නිලධාරීම තමයි ඒ වැඩේ සාර්ථකයි කියලා අනුමැතිය දෙන්නෙත්. ඒක නිසා ඒ තත්වය වෙනස් කරන්න. වෙන කාර්මික නිලධාරියෙක් ඒ කටයුත්තට යොදවන්න. ක්‍රමවේදයක් හදන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>
යෝජනාව සම්බන්ධව මුදල්ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා ගේ යෝජනාව අනුව** වටප්පිටිය සිට මුකුනුවැන්න ස්ටෝරුව දෙසට ඇති මාර්ගයේ කාණු පද්ධතියක් දැමීම සඳහා මූලිකව තාක්ෂනික නිලධාරී වාර්තාවක් ලබාගෙන ඇස්තමේන්තුගත කර මුදල් ප්‍රතිපාදන වෙන්කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-</u>

06-21. මීගස්තැන්නවත්තේ සොහොන් පිට්ටනිය ආශ්‍රිත ප්‍රෙද්ශයේ වැසි ජලය ගලාබැසීමට තිබූ මාර්ග අවහිර වීම හේතුවෙන් ජලය එකතුවන අතර ඩෙංගු වසංගතය හා ජනතාවට පීඩාකාරී තත්වයක් උද්ගතව ඇති බැවින් තාක්ෂන නිලධාරී වාර්තා ගෙන සුදුසු ජලබැහැරකිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා.</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-</u>

සොහොන් පිට්ටනිය ආශ්‍රිත ප්‍රෙද්ශයේ වර්ෂා කාලයේ රැස්වෙන වතුර ගලාබැසීමක් සිද්ධ වෙන්නේ නෑ. නොයෙක් ඉදිකිරීම් ආදිය හින්දා ඒ වතුර ගලාගෙන යන මාර්ග අවහිරවෙලා. මේ සඳහා විධිමත් ක්‍රමයක් අවශ්‍යයි. නැත්නම් ඒවා එකතුවෙලා ඩෙංගු වගේ වසංගත පීඩාකාරි තත්ව ඇතිවිය හැකියි. මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තාගෙන ඒ අනුව සුදුසු ජලබැහැරකිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මේ සම්බන්ධව තාක්ෂන නිලධාරී වාර්තා ගෙන ඉදිරි සුදුසු ක්‍රියාමාර්ගයක් ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා ගේ යෝජනාව අනුව** මීගස්තැන්නවත්තේ සොහොන් පිට්ටනිය ආශ්‍රිත ප්‍රෙද්ශයේ වැසි ජලය ගලාබැසීමට තිබූ මාර්ග අවහිර වීම හේතුවෙන් ජලය එකතුවන අතර ඩෙංගු වසංගතය හා ජනතාවට පීඩාකාරී තත්වයක් උද්ගතව ඇති බැවින් තාක්ෂන නිලධාරී වාර්තා ගෙන සුදුසු ජලබැහැරකිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>**

06-22. කොස්ගොඩ කරදකැටිය පාර ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මුදල් ප්‍රතිපාදන ඇති අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව** අනුව කොස්ගොඩ කරදකැටිය පාර ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>**

06-23. බටතොට මෝදර නාන තොටුපළ ට බැස යාමට පහසු වන ආකාරයේ පඩිපෙලක් සෑදීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මුදල් ප්‍රතිපාදන ඇති අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව** අනුව බටතොට මෝදර නාන තොටුපළ ට බැස යාමට පහසු වන ආකාරයේ පඩිපෙලක් සෑදීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>**

06-24. තලාවිටියවත්ත උඩහගම හරස් මාර්ගය ප්‍රවේශ ස්ථානය කොන්ක්‍රිට් යොදා සකස් කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මුදල් ප්‍රතිපාදන ඇති අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව** අනුව තලාවිටියවත්ත උඩහගම හරස් මාර්ගය ප්‍රවේශ ස්ථානය කොන්ක්‍රීට් යොදා සකස් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා-</u>**

06-25. දොරළුබඩවත්ත සමන් දෙවි පිළිමය අසල සිට පන්සල දෙසට ඇති මාර්ගයේ වතුර බැසයාම සඳහා කාණුව කැපීමට රු. 100000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා-</u>**

මේ කාණුව නොමැතිකමින් ගැටළු ඇතිවෙලා. මාර්ගයේ ගමනාගමනය අපහසුයි. වතුර බහින්නේ නෑ.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතාගේ_ යෝජනාව** අනුව දොරළුබඩවත්ත සමන් දෙවි පිළිමය අසල සිට පන්සල දෙසට ඇති මාර්ගයේ වතුර බැසයාම සඳහා කාණුව කැපීමට රු. 100000.00 ක ප්‍රතිපාදන ලබාදිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා-</u>**

06-26.කිතුල්පේ නයන කඩය අසල සිට ගුණරත්න මහතාගේ නිවස අසල මාර්ගයේ වතුර බැසයන කාණුව සකස් කිරිමට රු. 250000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා-</u>**

මේ කාණුවත් අත්‍යාවශ්‍යයි. කානු පද්ධතියම ගැටළුයි මේ මාර්ගවල. කාර්මික නිලධාරිත් මේ සම්බන්ධව කිව්වා.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතාගේ_ යෝජනාව** අනුව කිතුල්පේ නයන කඩය අසල සිට ගුණරත්න මහතාගේ නිවස අසල මාර්ගයේ වතුර බැසයන කාණුව සකස් කිරිමට රු. 250000.00 ක ප්‍රතිපාදන ලබාදිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා-</u>

06-27. කිතුල්පේ හේන්යාය පාර ගුණපාල මහතාගේ නිවස අසල සිට ගුණසිංහ මයාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරිමට රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.සශිකලා මදුභාෂිනී මිය</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතාගේ_ යෝජනාව** අනුව කිතුල්පේ හේන්යාය පාර ගුණපාල මහතාගේ නිවස අසල සිට ගුණසිංහ මයාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරිමට රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා විසින් කරනු ලබන යෝජනා -</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>
06-28.පරනගම පහලවත්ත මද්දුම කඩේ අසල එක්රැස්වන ජලය බැසයන පරිදි සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා.</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>
**මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තා අරන් සුදුසු පරිදි සංවර්ධනය කරදෙන්න**
<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතාගේ යෝජනාව** අනුව පරනගම පහලවත්ත මද්දුම කඩේ අසල එක්රැස්වන ජලය බැසයන පරිදි සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>**

06-29. දෙහෙරගොඩ අළුත්පාර කොන්ක්‍රීට් නොකල කොටස අඩි 270 ක් පමන සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා.</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතාගේ යෝජනාව** අනුව දෙහෙරගොඩ අළුත්පාර කොන්ක්‍රීට් නොකල කොටස අඩි 270 ක් පමන සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-</u>**

**ගරු මන්ත්‍රීතුමා විසින් අංක 06- 30 යෝජනාවේ පාසැල නොව පන්සල විය යුතු බවට සඳහන්කරන ලදි. ඒ අනුව සභා වේ එකඟත්වය අනුව එය සංශෝධනයකරන ලදී.**

06-30. රුක්හේන පන්සල අසල සිට හතරඅදහේන දක්වා මාර්ග කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා.</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතාගේ යෝජනාව** අනුව රුක්හේන පන්සල අසල සිට හතරඅදහේන දක්වා මාර්ග කොටස සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -</u>**

06-31. තැඹිලියන මාර්ගයේ අවසාන කොටස ලහිරු ගයාන් මයාගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතාගේ යෝජනාව** අනුව තැඹිලියන මාර්ගයේ අවසාන කොටස ලහිරු ගයාන් මයාගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -</u>**

06-32.මහදෙනිය සිට ඩුහලෝ වත්ත දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ධර්මසිරි මහතා.</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**
**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතාගේ යෝජනාව** අනුව මහදෙනිය සිට ඩුහලෝ වත්ත දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -</u>**

06-33. එක්නැලිගොඩ අත්වැල් පිටිය පාරේ සිට උපුල් ප්‍රසන්න මයාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
මුදල් ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතාගේ යෝජනාව** අනුව එක්නැලිගොඩ අත්වැල් පිටිය පාරේ සිට උපුල් ප්‍රසන්න මයාගේ නිවස දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>**

06-34.අයාලේ යන සුනඛ ගහණය වර්ධනය වීම නිසා වන්ධ්‍යාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම කඩිනම් කිරීම හා අදාළ වෙනත් සෞඛ්‍ය සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා-</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>**
න්‍යාය පත්‍රයට ඇතුළුකරන අවස්ථාවේ දැන නොසිටියත් පසුගිය දිනවලමේ යෝජනාව ක්‍රියාත්මක උනා. එසේම පසුගිය සභාවාරයේ මේ සම්බන්ධව අදහස් කීපයක් පල කෙරුණා. නමුත් යෝජනාවක් ලෙස ඉදිරිපත් වෙන්නේ මෙවර. පසුගිය දිනවල කිරිඇල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රෙද්ශයේ ක්‍රියාත්මක උනා. සමහර අවස්ථාවලදී අපිටත් ඒ කටයුතු වලට සම්බන්ධ වෙන්න ලැබුණා. පසුගිය කාලටෙය් ඇල්ලගාව හා ඒ ආශ්‍රිත ප්‍රෙද්ශ වල සුනඛ ගහනය අසීමිතව වැඩිවී තියෙනවා. අනෙකුත් කොට්ඨාශවලත් පවතින්නේ මේ තත්වයම බවයි හිතන්නේ. අයාලේ යන සුනඛයින්ගේ වගේම ගෘහස්තව ඇති කරන සුනඛයින්ගේද සීඝ්‍ර බෝවීමක් දක්නට ලැබෙනවා. බලු පැටවුන් පාරවල් වලට පන්සල්වලට වෙනත් පොදු තැන් වලට ගෙනැවිත් දැමීම ඊට සාක්ෂි. සුනඛයින් සපාකෑම නිසා සමහර දිනවල රෝගීන් 10 ක් පමන රෝහලට එන බව කිරිඇල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරන කමිටුවේදි ප්‍රකාශ කෙරුණා.ගෘහස්ත සතුන් කෙරේ සාර්ථක උනත් අයාලේ යන සතුන් සඹන්ධයෙන් මේ වැඩසටහන සාර්ථක නෑ. මේ කාර්යේදි ඔවුන් මග ඇරෙනවා. මේ සඳහා විසඳුමක් තිබිය යුතුයි. කොහොම උනත් වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිලිබඳව ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -</u>**
ජනවාරි මාසේ කිරිඇල්ලේ එන්නත් කරලා. මේ තත්වය ප්‍රෙද්ශ ගනනාවකට ගැටළුවක්. වසරගානක ඉඳන් මේ කටයුත්ත නිසි ලෙස සිද්ධ වෙන්නේ නෑ. ජනතාවට පාරේ යන්න ත් ගැටළු. බයිසිකල් අනතුරු බොහොමයක් මේ බලු ගහනය වැඩි නිසා. ඒ නිසා එන්නත කටයුතු කඩිනම් කරවන්න. කිරිඇල්ලේ වගේ අනෙක් ප්‍රෙද්ශවලටත් කඩිනමින් ක්‍රියාත්මක කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**
සුනඛයන් ගැන කටයුතු කරන්න අතුරු ව්‍යවස්ථාවක් තියෙනවා. බල්ලෝ සභාවේ ලියාපදිංචි කරලා සළකුණ එල්ලන්න ඕනි. ඒ බල්ලට විතරයි පාරේ යන්න පුළුවන්. සභාවට ගැලපෙන අතුරු ව්‍යස්ථාවක් සම්මත වෙලා තියෙනවා. ඒ අනුව තටයුතු කරමු. අයාලේ යන බල්ලෝ නිසා වෙන හානිය විශාලයි. ඒ වෙනුවෙන් ගහන එන්නත් වලට විශාල මුදලක් යනවා. රුපියල් ලක්ෂයේ එකහමාරේ එන්නත්. බයිසිකල් වාහන වලට බ්‍රේක් ගහන්න ගිහින් අනතුරු බහුලයි. මුලින් කෙක්කකින් බල්ලන් ඇල්ලුවා. සයනයිඩ් දාලා.ඊට පස්සේ

එන්නත්කරනය. වන්ධ්‍යාකරනයේදි නහර කපනව. නමුත් ඒක ප්‍රායෝගික නෑ. ගෙවල්වල යන බල්ලන් විතරයි එතනට ගේන්නේ. අයාලේ යන උන් නෑ. පරන ක්‍රමය සාර්ථකයි. නැත්නම් අවිහිංසාවාදී සංවිධාන කියන අය එකතු වෙලා අයාලේ යන බල්ලන්ව එකතු කරලා සංරක්ෂනය කරන්න ඕනි. ගනන් කිරීමත් හොඳයි. කොළඹ එක්තරා සංවිධානයක් අනතුරුට පත්උන බල්ලෙක්ට පැය දෙකක් ඇතුලත ප්‍රතිකාර කලා. කොළඹ ඉඳන් ඇම්බියුලන්ස් එකක් ඇවිල්ලා සේලයින් දීලා අරන් ගියා. ඔටාරා වගේ බලුසංවිධාන වගේ ඒවා හදන එකත් සුදුසුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -**

ගෙවල්වල බල්ලෝ කීප දෙනෙක් ඉන්නවා. බෙහෙත්විදිනකොට අරන් එන්නේ එකයි. හදිසියේ බල්ලෙක් කෑවොත් අපේ නෙමේ කියනවා. පොලිසියන වැඩ වෙනවා. බෙහෙත් විදිල්ල හරියට කරන්න නම් ග්‍රාමනිලධාරී සහායත් ගන්න. නිසි තොරතුරු අරන් සියළු බල්ලන්ව එන්නත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා -**

දෙල්ගොල්ල මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරනවා. වන්ධ්‍යාකරන වැඩසටහන් දැන් නැතිළු. ජලභීතිකා එන්නත ගහනවළු. පාරේ තමා වැඩිපුරම බල්ලෝ ඉන්නේ. සභාව සතු අයාලේ යන සතුන් පිලිබඳ වගකීම්. බෝවීම සීඝ්‍රයි. ඉස්සර මේ කටයුතු සාර්ථකව කලා. සත්තු මැරීම හොඳ නෑ. නමුත් විශාල වියදමක් දරනවා එන්නත්වලට. කුඩා ලමයින්ට සුදුසු නෑ. අතුරු ආබාධ එනවළු. එය පිලිතුරක් නෙමෙයි. පාරේ අයාලේ යන උන්ට ඒ එන්නත් ගහලාත් නෑ. පාරේ කාගන්නවා. ඒවගේම බල්ලෝ නිසා මේ වන විටත් රිය අනතුරු ගනනක් සිදුවෙලා. විසඳුමක් අවශ්‍යයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -**

කිරිඇල්ල එස්පීඑච්අයි මහතා කිව්වා මේ වෙන කොට 3400 කට විතර එන්නත විදලා කියලා.

වන්ධ්‍යාකරනය කරන්න මුදල් මදි නම් ගාඩ් දැම්මානම් හරි. එම්ඕඑච් එකට තාම මුදල් ලැබිලා නෑ. ඒ වැඩසටහන නතර කරලා නෑ. ක්‍රියාත්මක වෙනවා. ඒ මුදල් ආවාම ආයෙත් පටන් ගනියි. ප්‍රතිපාදන කඩිනමින් ගන්න මැදිහත් වෙන්න. බයිසිකල් ත්‍රිවිල්වගේ වාහන අනතුරට පත් වෙලා මිනිස්සුත් මැරෙනවා බල්ලෝ නිසා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -**

ගැටළු රැසක් එකතු වෙලා. නමුත් අපි ඒ ගැටළුත් විසඳනවා. දේශපාලන ජීවිතේට එන්න හිතපුවත් නැති අය මේ දේශපාලනයට ආවේ ඒ ගැටළු විසඳන්න. සියළු ප්‍රශ්න විසඳලා හොඳ රටක් හදන්න. ප්‍රශ්න ඇති කරපු අයම මේ දැන් ප්‍රශ්න ඇති උනා වගේ කතාකරනවා. අපිට පුළුවන් මේ ප්‍රශ්න විසඳන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. හරිසිංහ මහතා -**

සුනඛ ගහනය මේ වන විට වසංගතයක් වෙලා. ඉස්සර වෙනත් මාර්ග තිබුනා මේ තත්වය පාලනය කරන්න. පස්සේ ඒ ක්‍රම නැති උනා. වෙළඳසැල් ඉදිරිට වගේ විශාල වශයෙන් බල්ලෝ ඉන්නවා. පාරේ කෑම කන්න බලාගෙන ඉන්නවා වෙලඳසැල් ඉදිරිපිට. කුඩා දරුවන් වගේම වැඩිහිටි අයත් මේ අනතුරට ගොදුරු වෙනවා. ගෙවල්වල ඉන්න බලු පැටව් එක්කෝ අල්ලපු ගෙදරට ගෙනත් දාලා. නැත්නම් පාරට ගෙනත් දාලා. මේ තත්වයට සභා මට්ටමින් විසඳුම් අවශ්‍යයි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හා මහජන සෞඛ්‍ය පරික්ෂක නිලධාරී එක්ව පිලියමක් සිදුකරන්න. ගොයම් කපන කාලෙට මේ බලු ප්‍රශ්න වැඩියි. ආයෙත් පැටව්

වැඩිවෙනවා. ඊළඟට වසංගතේ වගේ සුනඛ ප්‍රශ්න. හිතපු නැති වෙලාවට පාරෙ බල්ලෝ පනිනවා. මලව පැරඩයිස් ප්‍රෙද්ශයේ බල්ලෙක් පාරට පැනලා පුද්ගලයෙක් බයිසිකලේ එක්කම දුර ඇදිලා ගියා. ජීවිතේ බේරුනත් අනතුරක් උනා. ඒ නිසා විශේෂයෙන් ඉල්ලනවා මේ උවදුරට කඩිනම් පිලියමක් යොදන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා -**</u>

ඉස්සර තොන්ඩුවක්දාලා ක්‍රමයක් භාවිතා කලා. මේ උවදුර නිසා ඒක අඩු කරන්න. මේ ආණ්ඩුවට මුදල්තියෙනවා. අයවැයෙනුත් මුදල් වෙන් කලා. නිවැරදි විසඳුම් දෙන්න. සංගණනයක් කරලා හරි. නැත්නම් අල්ලලා දූපතකට දාන්න. අයාලේ යන සුනඛයනි ගවයින් විශාල ප්‍රමාණයක් ඉන්නවා නගරයේ. යෝජනාව අනුව මේ කටයුතු කඩිනම් කරමු.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මදුශංක දේශප්‍රිය මහතා -**</u>

වටිනා යෝජනාවක්. සුනඛයින් නිසා විශාල පිරිසක් රෝහල්ගත වෙනවා. දැඩි පරිශ්‍රමයක් දරනවා ඒ රෝගීන්ගේ ජීවිත බේරන්න. සුනඛ වන්ද්‍යාකරනය කලාම ඒ බෝවීම අඩු වෙනවා. මේ ජලභීතිකාව මර්ධනය කරන්න සියළු සුනඛයින්ට එන්නත් කිරිමත් කල යුතුයි. ගරු සභාපතිතුමා ඇතුළු සියළු ගරු මන්ත්‍රිතුමන්ලා මේ කෙරේ අවධානය දිලා මහජන සෞඛ්‍ය පරික්ෂක වගේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි එක්ව සියළු අංශ එක්ව මේ කටයුතු සාර්ථකව කරගැනිමට කටයුතු කල යුතුයි. සුනඛ ග්‍රහනයෙන් මිදිලා ජලභිතිකාව අවම කළ හැකියි. ගෙවල්වල සිටින සුනඛයිනුත් එන්නත්කල යුතුයි. ග්‍රාමනිලධාරි කෙනෙක් වශයෙනුත් සේවයේ සිටි මේ යෝජනාව ඉදිරිපත්කල ගරු මන්ත්‍රිවරයාටත් ස්තුතියි.

<u>**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**</u>

පත්මසිරි දෙල්ගොල්ල මන්ත්‍රිතුමාගේ යෝජනාව පිලිබඳව. අයාලේ යන සුනඛයින් පිලිබඳව ජලභීතිකාව පාලනය කිරිම ඒ සම්බන්ධ කටයුතු දැන් කිරිඇල්ලේ ක්‍රියාත්මක වෙනවා. මීට පෙර කළ දේ නැවතිලා තියෙන්නේ සත්ව අවිහිංසා සංවිධාන මැදිහත්විම නිසා. ඒ හින්දා සුනඛ ගහනය මර්ධනය කරන්න කරපු කටයුතු නැවතිලා. මේ දේ වලට ආගමික මත බලපානවා. අපි ජනතාව ආරක්ෂා කරන්න කටයුතු කළ යුතුයි. ඊට අදාළව ක්‍රියාත්මක වෙමු. සාකච්ජා කරමු. අදාළ අංශවල දායකත්වය ඇතිව අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතාගේ යෝජනාව** අනුව අයාලේ යන සුනඛ ගහණය වර්ධනය වීම නිසා වන්ධ්‍යාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම කඩිනම් කිරීම හා අදාල වෙනත් සෞඛ්‍ය සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට අදාල අංශ දැනුවත් කිරිමට හා අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා-**</u>

06-35.ප්‍රදේශය පුරා විදුලි පහන් සවි කිරීමේ කටයුතු විධිමත් කිරිම හා කඩිනම් කිරීමට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා-**</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා-**

මේ කටයුතු දැනටත් කෙරීගෙන යනවා කියලා දන්නවා. නමුත් මන්ත්‍රීවරු විධිහට අපිට මේ ගැන ක්‍රමවත් දැනුම්දීමක්කරලා නෑ. හැමෝටම සමාන අවස්ථා ලැබෙනවාද දන්නේ නෑ. විනිවිදභාවයක් නෑ. සියළු දෙනා දැනුවත් වන ක්‍රමයක් නැත්තේ ඇයි?.දවසට බල්බ් 15 යි ලු සවිකරන්නේ. බල ප්‍රෙද්ශයේ විදුලි පහන් 15000 ක් තියෙනවලු. එතකොට සවිකරන්න දදවස් 1000 ක් යනවා. සතියට දින දෙකක් නිවාඩු උනොත් දවස් 1500 යි. අවුරුදු 4 ටත් වැඩියි. සභාවේ නිල කාලයත් අවසන් වෙනවා. අපේ කොට්ඨාශවල අපටත් නොදන්වා සවි කරලා. අපි කොට්ඨාශෙ ජයග්‍රහනයකල මන්ත්‍රීවරු. මේ කටයුතු සර්ව සාධාරනව ඉටුකිරීමේ වගකීමක් අපිට තියෙනවා. එහෙම නොවෙන එක අපිට වෙන අසාධාරනයක් නෙවෙයි. ජනතාවට වෙන අසාධාරනයක්. සභාවේ විශ්වාසය කඩ කරන්න එපා. මේවායින් වෙන්නේ සභාව හැල්ලුවෙන එක. අත්‍යවශ්‍ය තැන් වල හයිකරලා නෑ. මේ සම්බන්ධව යම් මන්ත්‍රීවරයෙකුට වගකීමක් පැවරිලා කියලා දැනගන්න ලැබුණා. අපේ කොට්ටාශෙ සවිකරන දිනයක් ගැනත් ආරංචියක් ආවා. විස්තර දැනගත්තේ කිපවතාවක් කතා කරලා. ඒ අවස්ථාවට සම්බන්ධවෙන්න උවමනාවක් තිබුනා. මේ වැඩේ හරියට කරන්න ඕනි නිසා. උඹු කිව්වා උපසභාපති එන බව. මම උපසභාපතිතුමාටත් කතා කලා. නිශ්චිත උත්තරයක් ලැබුනේ නෑ. මල්කැකුළ සභාපතිවරයාගේ කාලේ අපේ කොට්ඨාශෙ වීදි පහන් 175 ක් විතර සවිකර තිබෙනවා. ඒවා අළුත්වැඩියා විය යුතුයි. පත්තු වෙන්නේ නෑ. මේ සභාව පිහිටුවලා මාස හයකටත් වැඩියි. සභාවෙන් සවිකරනවාට අමතරව සභාවේ අනුදැනුමින් වෙනත් අයත් සවිකරනවා. එහෙම සවිකරන එක හොඳයි. මමනම්කැමතියි අපිට හොරෙන් හරි මේ විදිපහන් සවිකරනවාට. නමුත් මේවා ගැන අපි දැනුවත් විය යුතුයි. ඉක්මනින් සවිකළ යුතු අත්‍යවශ්‍යතැන්වලට කඩිනමින් සවිකර දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා-**

ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගෙන් ලිඛිතව තොරතුරු ගත්තා. මන්ත්‍රීවරු ඒ තොරතුරු දුන්නා. ලොකු ලාම්පු පිච්චිලා. ඒවා ක්‍රියාත්මක නැතිවෙලේ ජන්දය තියලා පත්උන මන්ත්‍රිලා ඉන්නේ. මේකේ පවතින රජය යටතේ පත්උන මන්ත්‍රිට නිල බලය තියෙනවා වසර හතරේම කොට්ඨාශ කටයුතු ගැන සොයාබලන්න. අපිට ගැටළුවක්නෑ ඒ ලියවිලි අපි නොදුන්නානම්. මම සතියක් ඇවිදලා තොරතුරු ගත්තා. ගිය ඉරිදා බටහිර දොඩම්පෙ විදුලි කාර්මිකයා වීදිපහන් සවිකරනවා. මිනිස්සු අහනවා ප්‍රධාන හන්දියේ දානවානම් හොඳයි කියලා. අධිකාරියේ පන්සල ලඟ තරුණයෙක්ගේ ගෙයක් ළඟ දැම්මේ. එවැනි කටයුතු අපේ වාර්තාවල නොවුනත් මෙවැනි වැඩ වෙයි කියලා හිතුවේ නෑ. නිල වශයෙන් පත් උන අපිට ලැජ්ජයි. අපි ගරු කටයුත්තක් කරන්නේ. කොට්ඨාශෙ මන්ත්‍රි ලෙස මම දැනුවත් නෑ. මම හිතනවා මේවා ඉදිරියට නොවෙයි කියලා. මම ප්‍රධාන හන්දි ටිකට ඉල්ලුවා. හිටපු මන්ත්‍රීවරයෙක් ඒ පැත්තේ ඒ පාරටත් නෑ. ඒ පැත්තේ තරුණයෙක්ගේ ඉල්ලීමට ඒ තැන්වල දාලා. හොඳ දේට අපි සහාය වෙනවා. බල්බ් ගැන අපෙන් තොරුතුරු ගත්තේ ඇයි?.වෙනත් අය ගිහින් බල්බ් සවිකරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මිය-**

ගිය 31 සෙනසුරාදා මගේ කොට්ඨාශෙත් සවි කරලා. පිටස්තර අයයි කලේ. මේ සම්බන්ධව අපිටත් කියන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා-**

කොට්ඨාශ 26 ම වීදිලාම්පු සවිකරනවා. අවසානේ සභාවාරය ඉවර උනත් ඉවරකරන්න බෑ. පන්සල් පල්ලි කෝවිල් ප්‍රධාන හන්දි ආදී ලෙස අපි සංගනනය දුන්නා. විදිලාම්පු අළුත්වැඩියා කළයුතු තැන්, බලලා විස්තර දුන්නා. මුලින් ඔබතුමාගේ යුක්තියුක්ත වැඩපිළිවෙලහොඳයි කියලා කිව්ව මිනිස්සු අහනවා. දැන් ඔබතුමාටත් දොස් කියනවා. දැන්. වීදිලාම්පු කොට්ඨාශ 26 ටම සකස්කරන්න. ප්‍රමාණවත් කාර්මික ශිල්පීන් මදි. මැසිවිලි නගන්නෑ. විදිලාම්පු දීලා දෙවනුව හියුම් පයිප්පත් දෙන්න. මේ වීදිලාම්පු සකස්කරන්න එක සභාවට ගෞරවයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. ජයසේකර මහතා-**

මේ ගැටළුව ග්‍රාමියව දැවෙන ප්‍රශ්නයක් වෙලා. පසුගිය දිනක කඳංගොඩ ප්‍රෙද්ශයේ කාර්මික ශිල්පියා විදිපහන් හදලා යන අතරේ එක් කාන්තාවක් මේ කටයුත්තට සහායවෙලා. ඇය ගිහින් සමහර ගෙවල් පෙන්නලාඒ ගෙවල්වල සවිකරන්න එපා කියනවළු. පන්සලේ කඨින පිංකම තිබුණා. ඒ හන්දියේ විදිපහන වත් සවිකරන්න බැරි උනා. එක්තරා පක්ෂයක කාන්තාවකට ඕනි විධිහටයි ඒවා වෙන්නේ. රාත්‍රියට පාරේ සතෙක් සර්පයෙක් කැවොත් කන්නේ පක්ෂය බලන්නේ නෑ. ඒ නිසා අවශ්‍ය තැනට වීදිලාම්පු දාන්න. පාසැල, පන්සල ලඟ, හන්දි, පොදු තැන්වලට දාන්න. සමහර අඳුරු තැන්වල රාත්‍රියට මාල හොරු, පසුම්බි පැහැරගෙන යන්න හැකි තැන් තියෙනවා. ඒ වගේමයි. ඇතැම් තැන් පක්ෂ භේදයක් නැතිව වීදිලාම්පු සවිකරලා. ඒකට ස්තුතියි. ක්‍රමාණුකූලව කරන්න. අවශ්‍ය වීදිලාම්පු විස්තර අපිත් දුන්නා. වයර් බල්බ් සංඛ්‍යා ලේඛන. දැන් කොතනටත් යන්න බෑ. මිනිස්සු අහනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා-**

සභා බල ප්‍රෙද්ශය විශාලයි. වැඩිම විදිපහන් සවිකලේ මේ සභාවේන් වෙන්න ඇති. කව්රු හරි කමක් නෑ. ගම එළිය කරනවානම් මම කැමතියි. මිනිස්සු විදි ලාම්පු ඉල්ලනවා. ක්‍රමවේදයක් අනුව සවිකරන්න. තවත් අයෙක් දාලා සවි කරමු කිව්වා. සහතික අරන් හරි මේක කඩිනම් කරන්න. අනිත් ත්‍රිවිල් එකත් ගන්න පුළුවන් රැක් එක සවිකරලා. කව්රුහරි දාලා මේ කටයුත්ත කරන්න. හැමෝම ඉල්ලනවා විදි ලාම්පු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා-**

පසුගිය මාස තුන තුළ විදිපහන් 750 කට වඩා අළුත්වැඩියා කළා. කොට්ඨාශවල බෙදිලා යන විදිහට. නමුත් සමහර තැන් මගඇරෙන්න ඇති. නව බල්බ් 1000 ක් ඕඩර් කරලා. පළාත් සභාවේ ප්‍රතිපාදන. ලක්ෂ 10 ක්. ගම් සවිමත්කිරීමේ ව්‍යාපෘතිය මගින් සමිතියට දීලා 127 ක් සවිකලා. ප්‍රමුඛත්වයක් දෙනවා බටුහේන සිට බඳුවත්තටත් දොඩම්පේ- ඇල්ලගාව දක්වාත් ප්‍රධාන මාර්ගයේ දෙපස. ප්‍රධාන මාර්ගය කළුවරයි. ඒ නිසා ප්‍රමුඛත්වයක් දුන්නා. සභාවට කාර්මික ශිල්පීන් ඉන්නේ එක් අයෙක්. ප්‍රියන්තත් ගත්තොත් කාර්යක්ෂම වෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-**

මගේ කොට්ඨාශෙ දිනගානක් කියලා දිනයක් දෙනවා කියලා ඒ දුන්න දිනත් කැන්සල් උනා. පස්සේ වෙන අයෙක් සවිකරලා. ස්විච් එකක් රු. 300 ක්. ඒවගේ 20 ක් ඕනි. අතේ මුදල් දාලා හරි හදනවා. චන්ද්‍රකුමාර් මන්ත්‍රිතුමාත් වතුනිවාස වලට යම් ප්‍රමාණයක් දැම්මා. අතින් මුදල් වියදම් කරලා . අපේ අක්‍රිය වීදිපහන් සභාපතිතුමා ලේකම්තුමා දන්නවා. ඒවා දෙනවා කිව්වා. නමුත් අපිට කලින් ගිය කැන්වසිං ගිය පාක්ෂිකයෝ ලවා දාලා. බැනලා රණ්ඩුකරලා එකක්

දාලා. පුද්ගලික කාරණා මත දාලා. නම්කරන කෙනෙක් ගිහින් දානවා. සභාපතිතුමාටත් විරුද්ධව කතාවක් තියෙනවා. පළාත් සභා මුදල් අනුමතකරගෙන ගෙදරක විදිපහන් ස්ට්‍රොක් කරලා . මම සභාපතිතුමාව දැනුවත් කලා. කණ්ඩායම් රැස්වීමෙත් කතා කලා. පළාත් සභාවේ මුදල් අරන් ලක්ෂ 10 ක් ග්‍රාමසංවර්ධන සමිතියක් මගින් ලයිට් 200 ක් සවිකරන්න පුළුවන් ක්‍රමවේදයක් තියේද? ගමක සමිතියට පුළුවන්ද? ඒවාට ප්‍රසම්පාදන ක්‍රමවේදයක් තියේද? ටෙන්ඩර්කලාද? අහවල් ගෙදර තියෙනවා විතරයි. මිනිස්සු දන්නවා. මේ ක්‍රමය සභාවේ අනුදැනුමක් නැතිව මේ විධිහට ලයිට් සවිකලහැකිද? ඉදිරි සභාවේදී උත්තර දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-</u>

අපි ලයිට්දාන්න ටෙන්ඩර් දාලා පාර්ශවයක් ගමු කිව්වා. ගමක සමිතියකට පිට ප්‍රෙද්ශයක ලයිට් දාන්න පුළුවන්ද?. සභාවේ කාර්මිකයාමද යන්නේ?. වැටුප් ගෙවන්නේත් ඒ ලක්ෂ 10 තුළද?. මම දැනුවත් කරලා පන්සලේ කඨින පිංකම දිනවල ලයිට් රෙපෙයාර්කලා. ඒ දිනවල අපි පාට පක්ෂ බලන්නේ නැතිව නිරෝෂා මන්ත්‍රිතුමියගේ ගෙවල් ලඟත් සවිකලා. ඒවා හැමෝටම ප්‍රයෝජනවත්. මල්කැකුළ සභාපතිතුමාට ස්තුති කල යුතුයි. ඒ කාලයේ අවශ්‍යතාවය අනුව පොදුවේ විදිපහන් දැම්මට කටයුතු කලා. මේ ගැටළු නිරාකරණය විය යුතුයි. කාර්මිකයා වගකියන්නේ වැටුප ගෙවන්නේ සභාවද? සමිතියද?.දිනපතා ගැටළු එනවා. සභාවෙත් මූලික කතාවක් වීදිලාම්පු. යම් යම් ගැටළු අවම වෙන විධිහට ඉදිරියේදී විසඳාගමු කිව්වා. මම අතින් වියදම්කරලා දැම්මා ප්ලෑෂර් එකක්. මේ සභාවට තියෙන බලය හැඩය බලගන්වන්න කඩිනම් පියවර ගන්න. තනි කන්ඩායමක් නෙමෙයි සභාව. සභාවේ තීරණ අරන් තියෙද්දි වෙනත් දේ සිදුවෙන්නේ. මන්ත්‍රිවරුන්ගෙන් බොරුවට විස්තර අරන් වෙනත් ස්ථාන වල විදිලාම්පු සවිකරනවා. මේ ආකාරයට සිදුවන්නේ වසමේ බහුතරයක් විදි අඳුරේ තිබ්මයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතා-</u>

මේ විදි පහන් සවිකරනකොට කැඩුණ පාරවල් කැලෑපාරවල් වලටත් දෙන්න. සමිති මගින් කරන එක සාර්ථක නෑ. වෙනත් ගමක සමිතියක් වෙනත් ගමක අවශ්‍යතාවය දන්නේ නෑ. විශේෂයෙන් මල්කැකුළ මන්ත්‍රිතුමා දේවින්ද මන්ත්‍රිතුමා තාමත් ලයිට් සවිකරනවා. මේ නවක මන්ත්‍රී පිරිස බලා ඉන්නවා. අනිත් අය ලයිට් සවිකරනවා. උප සභාපතිතුමා මටත් දෙන්නම් කිව්වා. අළුත් කෝවිල පාරට ලයිට් අවශ්‍යයි. ශිව රාත්‍රියට කලින් වීදිලාම්පු කැඩුන තැන් තුනක් තියෙනවා කෝවිල පාරේ ඒවාට ලයිට් දාලාදෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>

දිනයේ හොඳම කතාව මෙතුමා ප්‍රකාශ කලා. වලදුරේ අවශ්‍ය හැමතැනම වීදිපහන් සවිකලා. කලාතුරකින් තමා දාලානැතිව ඇත්තේ. සමිතියක් මගින් මුදල් අරන් විදිලාම්පු සවිකලහැකි ක්‍රමයක් පනතේ නෑ. නමුත් සභාවේ ලයිසන් තියෙන විදුලිකාර්මිකයෙක් ඉන්නේ එක් අයෙක් විතරයි. ආම් ගැනීමේදි විදුලි අධිකාරගේ නිර්දේශ ගත යුතුයි. හැමෝටම කණු නගින්න බෑ. බලපත්‍ර තිබිය යුතුයි. මේ යන ක්‍රමයට කොමසාරිස්ගේ අනුමැතිය ගත යුතුයි. විදුලි කණු අපේ නෙමෙයි. අන්සතු දේකයි සවි කරන්නේ. බල්බ් ලැයිස්තු ඉල්ලුවාම ඒ අවශ්‍ය තැන්වල විස්තර දුන්නා. නමුත් තාම සවිකලේ නෑ. මේ බල්බ් වලට හෙට අනිද්දාට ගෙවන්න වෙනවා. විදුලි බිලට එකතු වෙලා ආවාම ඒ ගන්න විදුලිය වෙනුවෙන් ගෙවන්න වෙනවා. මේ ප්‍රෙද්ශයේ ඇමතිතුමන්ලා විදුලි ඇමතිවරු වෙලා ඉන්න කාලේ ජෝන්සෙනෙවිරත්න

ඇමතිතුමා පවිත්‍රා ඇමතිතුමිය ඉන්න කාලේ සභාවෙන් ගෙවන්න කිව්වා සියයට 10 ක්. විදුලිබල මණ්ඩලයට විදුලි පහන් වෙනුවෙන්. නමුත් ඒ අය නිසා ඒ වෙලාවේ ඒක ගෙවන තත්වෙට ආවේ නෑ. මල්කැකුළ හිටපු සභාපතිතුමා ඕනි ඕනි තැන්වල ලාම්පු සවි කලා. මටත් හොරෙන් ගිහින් එහෙත් හයිකලා. ඉදිරියේ විදුලිබලමණ්ඩලය පුද්ගලීකරණය උනාම සභාවට ගෙවන්න වෙනවා. තියෙන විදුලි පහන් ටික නඩත්තු කරමු.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

දෙල්ගොල්ල මන්ත්‍රීතුමා මගේ නමත් කිව්වා. 1997 ලයිට් සවිකලා පස්සෙන් ගිහින්. ඊට පස්සේ ගියේ නෑ. සභාවක් විදිලාම්පු සවිකළ යුතුයි. ක්‍රමවත්ව කල යුතුයි. පන්සලේ හාමුදුරුවෝ සම්බන්ධ වෙලා කලා. මම යන්නේ නෑ. විදුලිබල මණ්ඩලය ඉදිරියේදී දැඩි විරෝධය දක්වයි. මේකට ක්‍රමවේද හදනවා. කව්රුත් කැමතියි මේ විදිපහනක් තියෙනවා නම්. 1997 දි කොළඹ රත්නපුර ප්‍රධාන පාරේ සවිකරනවා නම් විදුලිබලමණ්ඩලයේ අවසරය ඕනි.

පනතේ කරුණු කාටත් පොදුවිය යුතුයි. අදින් පස්සේ මේ වීදිපහන් සම්බන්ධව කොමසාරිස් අනුමැතිය ගන්න. ජලසම්පාදනයටත් කොමසාරිස් අනුමැතිය ඕනි. වීදිපහන් වලටත් ඕනි. යෝජනාවක් සම්මත උනාම කලහැකිදේට වෙනත් අයගේ පස්සෙන් යන්න එපා. සභාව ස්වාධීනයි. හැමදේටම කොමසාරිස් අනුමැතිය ඕනි නෑ. මහජනසේවයට අකුල් හෙලන්න එපා. මේවායේ හරය විනාශ කරන්න දෙන්න එපා. විදිලාම්පු ආලෝකය හොඳ දෙයක්. මේ ආලෝකය වැඩිපුරම දුන්නේ හිටපු සභාපතිතුමා. විදිලාම්පු සවිකරගන්න පස්සෙන් යන්න එපා. මට වඩා දේවින්ද මන්ත්‍රීතුමා හයිකරලා විදිලාම්පු. සංහිදියාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වි.මහින්ද මහතා-</u>

දැනට විදිලාම්පු සවිකරන්න ඉන්නේ මේ සභාවේ එක් අයෙක් විතරයි. මේ රටේ මේ තාක් තිබුණ පාලන අධිකාරී කාලයන් යටතේ අවුරුදු 70 ක් විතර වීදිපහන් සවිකරන මනුස්සයා ඉනිමගක නැඟලා ඒ කණුවේ නගිනවා. බහිනවා. ආරක්ෂක බෙල්ට් එක විතරයි තියෙන්නේ. ඒ කොන්දේ තියෙන බෙල්ට් එක කිලෝ ගානක් බරයි. කොන්දඅමාරුවට ඒ දෙන්නා මාරුවෙන් මාරුවට ස්ප්‍රේඑකක් ගහනවා කොන්දට. මම දැකලා තියෙනවා. නමුත් පාලන අධිකාරිය බංගලා මාලිගා හදාගෙන අසීමිත සැප විඳ ගෙන ජීවත්වෙලා. අර මිනිස්සු සොච්චංමුදලකට ජීවිතය දියකරලා. අවුරුදු හැත්තෑවක් පුරා නගිනවා. බහිනවා.ඒ සේවාව වෙනුවෙන්. ඒ අය වෙනුවෙන් යම් පහසුවක් කිසිදු පහසුවක් සපයලා නෑ. ලංකාව පුරාම එහෙම තමයි. ටෙලිකොම් වගේ ආයතනවල තියෙනවා බකට්එක සහිත සියළු ආරක්ෂාව සහිත පහසුවෙන් සේවාව දියහැකි වාහනයක්. එවැනි පහසුකමක් ප්‍රාදේශිය සභා කීපයකට එකක් හෝ ලබාදියහැකිනම් ඒක වටිනා කටයුත්තක්. ඒ වාහනයක් මේ කටයුතු සඳහා ලබාගන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

වීදිලාම්පු සවිකිරිම සම්බන්ධයෙන් ලබාගත්ත තොරතුරු එක්ක ඒ සංඛ්‍යාලේඛණ එක්ක මේ කටයුත්ත පහසු එකක් නෙවෙයි. අපි විශේෂයෙන් තව පිරිසක් එකතු කරගෙන කරමු කියලත් තීරණය කලා. ගිය වසරේ ඒ කටයුත්තට මුදල් මදි. බල්බ් ස්විච් ගත්තට ඒ අයට ගෙවන්න මුදල් මදි. පස්සේ පළාත් සභාවෙන් අපි රත්නපුරේට වෙන්කරලා තිබුන මුදලක් ලක්ෂ 20 ක් ඒ අය කරන්නේ නැති නිසා අපි ඇහුවා කරන්න. නැවත ඒ අය කරනවා කිව්වාට

ඒ අයට බැරි උනා. වසරේ අන්තිමට දැන්වූවා අපිට දෙන්නම් කියලා ලක්ෂ 10 ක්.ගම සවිමත්කිරීමේ ව්‍යාපෘතිය යටතේ. ඒවාට ඇස්තමේන්තු ඕනි. ඇස්තමේන්තු හැදුවා. ලක්ෂ 10කට. සාමාන්‍ය ව්‍යාපෘතියක් විධිහට කලේ. ඊට අදාල සමිතිහරහා කැඳවලා හැකියාව ඇති සමිතියට දුන්නා. ඒ අය වීදිලාම්පු ගෙනත් සවිකරලා. කාර්මික නිලධාරී අනුමැතිය දුන්නාම මුදල් ගෙවනවා. සමිතියේ නමින් කරන්නේ. ඒ අයගේ හැකියාව තියෙන කෙනෙක් කරන්නේ. විදි ලාම්පු ගන්නේ ඒ අය. කලාට පස්සේ හරියට වැඩේ කරලා නම් පළාත් සභාව හරහා මුදල් ගෙවනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>**

සමිතියකට පුළුවන්ද වෘත්තිය කෙනෙක් අරගෙන ප්‍රෙද්ශයේ ලයිට් සවිකරන්න.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

සමිතියයි ඒ වගකීම ගන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-</u>**

ඕනිම සමිතියකට පුළුවන්ද? සුදුසුකම් තියෙන අයෙක්ව නම් කලොත් පුළුවන්ද?

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට හැකියාව තියෙන අයගෙන් කැඳවනවා. හැකියාව තියෙන සමිතියකට දෙනවා. කාර්මික නිලධාරී අධීක්ෂනය වෙනවා. එක් අයෙකුට විදි ලාම්පු දාන්න බෑ. ඒ කටයුත්ත කාර්යක්ෂම වෙන්න ඕනි. මේ අපේ සභාවෙන් වෙන් කල මුදලක් නෙමෙයි. මම කොමසාරිස්ගේ අනුමැතියෙන් මේක කරන්නේ. වෙනත් අඩුපාඩුතියේද එය වෙනම කරුණක්. මේ කටයුත්ත කොමසාරිස්තුමාට කතා කරලා කලේ. සාකච්චජා කලා. විදිලාම්පු දානකොට අපේ කාර්මික ශිල්පියා මගින් ඒවා රෙපෙයාර් කරනවා. එක වසමකට එක දිනයයි. සරීපාදේ මාර්ගයේ පුරාම වීදිලාම්පු දැම්මා. අදාල සේවකයින් රෑ දහයටත් වැඩ කලා. මේක දුෂ්කර කටයුත්තක්. ඒක අයෙකුට බෑ. මුළු ගමේම දැම්මත් වැඩක් නෑ. විදිපහන්. අවශ්‍යම තැනට දාලානැත්නම්. ඒ නිසා සම්පූර්ණ කරන එක දුෂ්කරයි. ප්‍රියන්තවත් අරන් ඒ සුදුසුකම් සම්පූර්ණ කරලා නම් මේ කටයුත්ත තාර්ථක කරන්න බලාපොරොත්තු වෙනවා. මේ කටයුත්ත කඩිනම්ව කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතාගේ යෝජනාව** අනුව ප්‍රදේශය පුරා විදුලි පහන් සවි කිරීමේ කටයුතු විධිමත් කිරිම හා කඩිනම් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>**

06-36. ඇල්ලගාව රජයේ බෙහෙත් ශාලාව පිටුපස පීල්ලදොළ පාර වංගුව කොන්ක්‍රිට් තට්ටුව යටින් දොල අයිනේ හැරී ඇති ස්ථානයේ බැම්මක් යෙදීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඉකෝකා මල්ලවආරච්චි මිය-</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා-</u>**

නිවාස 10 ක්හා කෘෂිකාර්මික ඉඩම් තියෙනවා. කොන්ක්‍රිට් තට්ටුව යටින් කැඩී ගිහින්. මීටර් තුනේ තුනේ කොන්ක්‍රිට් එකක් දාලා හානිය වලක්වා නෙගත්තොත් පාරකැඩී ගිහින් අළුත්වැඩියාවට වැඩි වියදමක් දරන්න වෙයි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතාගේ යෝජනාව** අනුව ඇල්ලගාව රජයේ බෙහෙත් ශාලාව පිටුපස පීල්ලදොළ පාර වංගුව කොන්ක්‍රිට් තට්ටුව යටින් දොල අයිනේ හැරී ඇති ස්ථානයේ බැම්මක් යෙදීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා-</u>**
06-37.අකුරණ ග්‍රාමනිලධාරී වසමේ දැල්වත්ත ප්‍රධාන මාර්ගයේ සිට හොරගලකැලේ වෙල්යාය දක්වා දිවෙන දෙවැට මාර්ගයේ මීටර් 60 ක් පමන කොටස කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න_මහතාගේ යෝජනාව** අනුව අකුරණ ග්‍රාමනිලධාරී වසමේ දැල්වත්ත ප්‍රධාන මාර්ගයේ සිට හොරගලකැලේ වෙල්යාය දක්වා දිවෙන දෙවැට මාර්ගයේ මීටර් 60 ක් පමන කොටස කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා-</u>**
06-38.මාටුවාගල ග්‍රාමනිලධාරී වසමේ වෙරළුගස්කොටලිය මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස් කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න_මහතාගේ යෝජනාව** අනුව මාටුවාගල ග්‍රාමනිලධාරී වසමේ වෙරළුගස්කොටලිය මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා-**

06-39.මාටුවාගල ග්‍රාමනිලධාරි වසමේ නිවාස 20 අසල සිට නොම්බර 1 නමින් හැඳින්වෙන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලාශාන්ති මිය -**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න_මහතාගේ යෝජනාව** අනුව මාටුවාගල ග්‍රාමනිලධාරි වසමේ නිවාස 20 අසල සිට නොම්බර 1 නමින් හැඳින්වෙන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා -**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා-**

06-40. මැරේකැලේ වත්ත පාර පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා-**

මේ මාර්ගය පැතිබැම්මක් නැති නිසා පාරකඩාගෙන යනවා. අත්‍යාවශ්‍ය කාරනයක්.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ_මහතාගේ යෝජනාව** අනුව මැරේකැලේ වත්ත පාර පැති බැම්ම ඉදිකිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා-**

06-41. චමින්ද මහතාගේ නිවස අසල සිට පඩිපෙළ දක්වා ඇති අමුහේන්කන්ද උඩහගම මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ_මහතාගේ යෝජනාව අනුව** චමින්ද මහතාගේ නිවස අසල සිට පඩිපෙළ දක්වා ඇති අමුහේන්කන්ද උඩහගම මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා-</u>**

06-42. දිගෝ ගෙදර ගල්ගොඩේ වත්ත පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලාශාන්ති මිය -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ_මහතාගේ යෝජනාව අනුව** දිගෝ ගෙදර ගල්ගොඩේ වත්ත පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා-</u>**
06-43. වටප්පිටිය මෙනේරිපිටිය පන්සල දක්වා මාර්ගයේ සුරංග මහතාගේ නිවස අසල සිට බහුකාර්ය ගොඩනැගිල්ල දෙසට මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා –</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතාගේ යෝජනාව අනුව** වටප්පිටිය මෙනේරිපිටිය පන්සල දක්වා මාර්ගයේ සුරංග මහතාගේ නිවස අසල සිට බහුකාර්ය ගොඩනැගිල්ල දෙසට මාර්ගය සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා-**

06-44. මෙනේරිපිටිය වසම කිවිලකොටුව දිවිනාවත්ත මාර්ගයේ පියලත් හා උපාලි මහතාගේ නිවස අසල වාහන ගමන්කිරිමට අපහසු කොටස සංවර්ධනය කිරිමට රු. 500000.00ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතාගේ යෝජනාව අනුව** මෙනේරිපිටිය වසම කිවිලකොටුව දිවිනාවත්ත මාර්ගයේ පියලත් හා උපාලි මහතාගේ නිවස අසල වාහන ගමන්කිරිමට අපහසු කොටස සංවර්ධනය කිරිමට රු. 500000.00ක ප්‍රතිපාදන ලබාදිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා-**

06-45. ශ්‍රී සුධර්ශනාරාම පන්සල අසල සිට පල්ලෙවත්ත දක්වා මාර්ගයේ ජම්බුගහ කුඹුර මහවල අසල ආපදාවට ලක්වූ මාර්ගයේ කොටස සංවර්ධනය කිරිමට රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතාගේ යෝජනාව අනුව** ශ්‍රී සුධර්ශනාරාම පන්සල අසල සිට පල්ලෙවත්ත දක්වා මාර්ගයේ ජම්බුගහ කුඹුර මහවල අසල ආපදාවට ලක්වූ මාර්ගයේ කොටස සංවර්ධනය කිරිමට රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පි.මහින්ද ජයලාල් මහතා විසින් කරනු ලබන යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පි.මහින්ද ජයලාල් මහතා-</u>**

06-46. උඩතලාවිටිය පාසැල පාරේ පාසැල අසල ජලයෙන් යටවන කොටස පාරේ ගමන්කල හැකි වන පරිදි සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පි.මහින්ද ජයලාල් මහතා-</u>**

මේ මාර්ගයේ විශාල පිරිසක් යනවා. දෛනිකව පාසැලට යන ළමුන් ඇතුළුව ගමන්කරන පිරිසට මේ මාර්ගයේ යන්න අපහසුයි. වර්ෂාවට අඩි එකක් විතර ජලයෙන් යටවෙනවා. වාර්තා අරන් ක්‍රමවේදයක් අනුව පාර වතුරට යටවෙන්නේ නැති විධිහට සංවර්ධනය කරන්න.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතාගේ යෝජනාව අනුව** උඩතලාවිටිය පාසැල පාරේ පාසැල අසල ජලයෙන් යටවන කොටස පාරේ ගමන්කල හැකි වන පරිදි සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පි.මහින්ද ජයලාල් මහතා-</u>**

06-47. උඩතලාවිටිය පාරේ ඇති වලවල් වසා පිලිසකර කිරිම හා නිමල්වත්ත ( රාම ලියැද්ද ) බෝක්කුව පළල් කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පි.මහින්ද ජයලාල් මහතා-</u>**

මේපාරේ කැඩිලා වලවල් හැදිලා. පාර විනාශ විමට පෙර ඒ වලවල් සකසලා බෝක්කුව පළල් කල යුතුයි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතාගේ යෝජනාව අනුව** උඩතලාවිටිය පාරේ ඇති වලවල් වසා පිලිසකර කිරිම හා නිමල්වත්ත ( රාම ලියැද්ද ) බෝක්කුව පළල් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී කේ.පි.මහින්ද ජයලාල් මහතා-</u>**

06-48. බෝධිමළුව හන්දියේ සිට බෙහෙත් සාප්පුව දක්වා  ප්‍රධාන මාර්ගයේ ජලය බැසයන කාණු පද්ධතිය සකස් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී කේ.පි.මහින්ද ජයලාල් මහතා-</u>**

මේ මාර්ගයේ වතුර රැඳෙනවා. ජලය බැසයන කාණු පද්ධතිය සකස් කිරීම අත්‍යාවශ්‍යයි.

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  එම්.කේ.විජේසිරි මහතා -</u>**

කානුව මගින්  ඇළටම  වතුර යන විදිහට හදන්න. නැත්නම් ජනතාවට පීඩාවක්. හැමවතුරටම වෙල යටවෙනවා. වෙල යටඋනාම කඩ හා ගෙවල් වලට වතුර යනවා.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ  අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කේ.පී.මහින්ද ජයලාල් මහතාගේ  යෝජනාව අනුව** බෝධිමළුව හන්දියේ සිට බෙහෙත් සාප්පුව දක්වා  ප්‍රධාන මාර්ගයේ ජලය බැසයන කාණු පද්ධතිය සකස් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

මෙම අවස්ථාවේදී ප.ව. 1.30ට පමන විනාඩි 30ක කෙටි විවේකයක් සඳහා මහා සභාව කල්තැබිමට ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් යෝජනා කල අතර ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. විනාඩි 30කට පසුව නැවතත් ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනා ව අනුව හා ගරු මංගල ඩයස් මන්ත්‍රීතුමාගේ ස්ථිරත්වයෙන් මහා සභාව ආරම්භ කරනලදි.

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -</u>**
06- 49. මල්ගහපිටිය ජයසෝම මහතාගේ නිවස හරහා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී  ඉනෝකා මල්ලවආරච්චි   මිය -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -</u>**
මේ මාර්ගය මඩවෙනවා.නිතර. ගංවතුරට තවත් මඩවෙනවා. ගිය සභාවෙන් මුදලක් දීලා සංවර්ධන කටයුතු කලා. මෙවරත් මුදල් ලැබුනොත් මේ සංවර්ධන කටයුතු කල හැකියි. නැත්නම් හැම මාසෙම යෝජනා විතරක් ගෙනත් සම්මත වෙනවා විතරයි. ඒ දෙන මුදල අනුව

යෝජනා ගෙනාවාම මේ සභාවත් කාලය කෙටි වෙනවා. සංවර්ධන යෝජනා වලට යන කාලය කෙටි උනාම සභාවේ අනෙක් කටයුතු වලට වෙලාවත් ඉතිරි වෙනවා.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතාගේ යෝජනාව අනුව** මල්ගහපිටිය ජයසෝම මහතාගේ නිවස හරහා මාර්ගය සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

මෙදින මහා සභා රැස්වීම් වාරයට **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කැළුම් ශ්‍රී ධර්මදාස මහතා **සහභාගී නොවූ** බැවින් **යෝජනා අංක 06- 50** හා **06- 51 මෙදින සභාවට ඉදිරිපත් නොකරන ලදී.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්.ධර්මසිරි මහතා විසින් කරනු ලබන යෝජනා -</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්.ධර්මසිරි මහතා-</u>

06- 52. පැරඩයිස් කෝවිල ඉදිරිපිට කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතාගේ යෝජනාව අනුව** පැරඩයිස් කෝවිල ඉදිරිපිට කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්.ධර්මසිරි මහතා-</u>

06-53. කුරුවිට යුධ හමුදා කඳවුර වටා කරපිංච දක්වා මාර්ගය පුළුල් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

යුධ හමුදා කඳවුර වටා මාර්ගයේ මේ කොටසේ වාහනයක් මාරුවෙන්න බෑ. රාජකාරි කටයුතු වලට ගිහින් සභාවේ වාහනයකටවත් යන්න බැරි උනා. මේ සම්බන්ධව සභාව මැදිහත්වෙලා

මේ මාර්ගය පුළුල් කරවන්න. වැස්ස වෙලාවට පාසැල්දරුවෙකුටවත් යන්න බෑ. පාරේ අයින් වෙන්න තැනක් නෑ. පළාත් සභාවට කියලා මේ වැඩේ කරවන්න. දේවින්ද මන්ත්‍රීතුමා දන්නවා මේ කොටස.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා -**</u>

මෙතුමා අදහස් කරන කොටස විතරක් නෙවෙයි. ඒ මාර්ගයම දැන් කැඩිලා බිඳිලා අබලන් වෙලා. සාමාන්‍යයන් ත්‍රි රෝද රථයක් මෝටර්සයිකලයක් ඇර මේ පාරේ යන්න බෑ. මාරුවෙන්න බෑ. බෝධිය එක්ක වංගු ගන්න බෑ. පාරේ එහා පැත්තේ ගෙදර තාප්පය හා මිදුල. එතනින් ඉඩක් ගන්න බෑ. වැඩි ඉඩ ප්‍රමාණයක් නෑ. යුධ හමුදා කඳවුර පැත්තෙන් ගන්න පුළුවන්. මේ මාර්ගය තමා ගංවතුර ආවාම ත් තියෙන එකම විකල්ප මාර්ගය. කැපිංච කොස්ගල යට වෙනවා. හිඳැල්ලන ටීආර් අයි ගලුකාගමකරපිංච අයට තියෙන විකල්ප මාර්ගය මේක. ගැමුණු රෙජිමේන්තුව දැනුවත් කරලා කටයුතු කරන්න.

<u>**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**</u>
අදාළ අංශ එක්ක සාකච්ජා කරමු. ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතාගේ යෝජනාව අනුව** කුරුවිට යුධ හමුදා කඳවුර වටා කරපිංච දක්වා මාර්ගය පුළුල් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්.ධර්මසිරි මහතා-</u>
06-54. බටුහේන හන්දියේ සිට බටුහේන ප්‍රජාශාලාව දක්වා මාර්ගය පුළුල් කිරිමට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**</u>
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතාගේ යෝජනාව අනුව** බටුහේන හන්දියේ සිට බටුහේන ප්‍රජාශාලාව දක්වා මාර්ගය පුළුල් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා විසින් කරනු ලබන යෝජනා -</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-</u>

06-55. මිල්ලවිටිය බෝගහයට විරියගොඩ පාර පාලම ලඟ සිට ඉන්දික මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-**

පාලම යට කොටස ගල් ගැලවෙලා. මේ මාර්ගයට කඩිනමින් අවධානය නොදුන්නොත් වර්ෂාව එක්ක විශාල අර්බුධයක් වෙයි. විශේෂ අවධානයක් දෙන්න.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතාගේ යෝජනාව අනුව** මිල්ලවිටිය බෝගහයට විරියගොඩ පාර පාලම ලඟ සිට ඉන්දික මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-**

06-56. මිල්ලවිටිය ප්‍රධාන පාරේ කනත්ත අසලින් අඹවනාන මාර්ගය පැතිබැම්ම දමා අඩි 200 ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-**

මේ මාර්ගය කොක්ඕවිට මිල්ලවිටිය විශාල පිරිසක් භාවිතා කරනවා. අත්‍යවශ්‍ය කරුණක්.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතාගේ යෝජනාව අනුව** මිල්ලවිටිය ප්‍රධාන පාරේ කනත්ත අසලින් අඹවනාන මාර්ගය පැතිබැම්ම දමා අඩි 200 ක් කොන්ක්‍රිට් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-**

06-57. මිල්ලවිටිය ලෙල්ලගොඩ මාර්ගයේ ගුණරත්න මහතාගේ නිවස ළඟ සිට අළුගොල්ල හේන්යාය කනත්ත දක්වා මාර්ගය අළුත්වැඩියා කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-</u>**

ගම්වාසින් විසින් මේ සම්බන්ධව ඉල්ලීම් ලිපියකුත් දුන්නා සභාපතිතුමාට මේ කටයුත්ත කඩිනම් කරදෙන ලෙසට.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතාගේ යෝජනාව අනුව** මිල්ලවිටිය ලෙල්ලගොඩ මාර්ගයේ ගුණරත්න මහතාගේ නිවස ළඟ සිට අළුගොල්ල හේන්යාය කනත්ත දක්වා මාර්ගය අළුත්වැඩියා කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලා ශාන්ති මිය විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලා ශාන්ති මිය -</u>**

06-58. එල්ලාවල පහලගම මනන්ඇල්ල මාර්ගයේ මඩවල කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලාශාන්ති මියගේ යෝජනාව** අනුව එල්ලාවල පහලගම මනන්ඇල්ල මාර්ගයේ මඩවල කොටස සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලා ශාන්ති මිය -</u>**

06-59. එල්ලාවල පහලගම වසමේ එගොඩලන්ද මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලාශාන්ති මියගේ යෝජනාව අනුව එල්ලාවල පහලගම වසමේ එගොඩලන්ද මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලා ශාන්ති මිය -</u>

06-60. එල්ලාවල වසමේ ලියන්ගහවත්ත මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලාශාන්ති මියගේ** යෝජනාව අනුව එල්ලාවල වසමේ ලියන්ගහවත්ත මාර්ගය සංවර්ධනය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

**මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා විසින් මෙම යෝජනාවට සංශෝධනයක් එක්කිරිමට සභා අනුමැතිය පැතූ අතර ඒ සඳහා මහා සභාවේ එකගත්වය ලැබුණ හෙයින් යෝජනාවට,** ප්‍රාදේශිය සභාවේ වැඩ අවසන්ව ඇති ගබඩාව හා ගැරේජය යන ව්‍යාපෘති, **ලේඛනාගාරය , කසළ අංගනය හා වාහන අංගනය ද ඇතුළත් කොට පහත පරිදි යෝජනාව ඉදිරිපත්කරන ලදී. ඒ අනුව**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-</u>

06-61. කුරුවිට ප්‍රාදේශිය සභාවේ මේ වන විට වැඩ අවසන්ව ඇති ගබඩාව හා ගැරේජය **ලේඛනාගාරය , කසළ අංගනය හා වාහන අංගනය යන** ව්‍යාපෘති සම්බන්ධව මහා සභාවට තොරතුරු ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා විසින් ගරු සභාවට අදහස් ප්‍රකාශ කරමින් මේ අවස්ථාවේදී මෙම කර්මාන්ත සම්බන්ධව තොරතුරු ගැනීමට මෙම සභාවේ කාර්මික නිලධාරිවරුන්ගේ සහාය අවශ්‍ය වන බවත් ඒ අනුව මේම කටයුත්ත සඳහා මහාසභාව කාරක සභා අවස්ථාවක් බවට පත්වීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව එතුමා විසින්** කුරුවිට ප්‍රාදේශිය සභාවේ මේ වන විට වැඩ අවසන්ව ඇති ගබඩාව හා ගැරේජය **ලේඛනාගාරය , කසළ අංගනය හා වාහන අංගනය යන** ව්‍යාපෘති සම්බන්ධව මහා සභාවට තොරතුරු ලබාගැනීමට මහා සභාව කාරක සභාවක් බවට පත්වන ලෙසට යෝජනා කල අතර

එමයෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සම්පත් බොතේජු මහතා විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා මහාසභා එකඟතාවය ලැබුණ අතර මහාසභාව කාරක සභාවක් බවට පත්විය.

මෙම අවස්ථාවේදී සභාවේ කාර්මික නිලධාරින් කාරක සභා අවස්ථාවට සහභාගී විය. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා විසින් අදහස් දක්වමින් මෙම සභාවේ ලේඛනාගාරය සඳහා ඇස්තමේන්තු මුදල ලෙස දාසයලක්ෂ හැට හතරදාහක් ඇස්තමේන්තුකර ඇති අතර යම් අකටයුතු වී ඇති බවත් තමා හට ඒ සම්බන්ධව ජායාරූප ලැබුණ බවත් මෙම අකටයුත්ත සම්බන්ධව සොයාබලන ලෙස දැනුම්දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව පසුගියදින තමා විසින් මෙම ස්ථානය නිරික්ෂනය කල බවත් එහිදි වර්ග අඩි 900 ක්පමන ප්‍රමාණයක රාක්ක සවිකර ඇති බවත් ඒ සඳහා එම ලෝහයෙන් රාක්ක සවිකිරීමට එම ප්‍රමාණයට විශාල මුදලක් වැයවී ඇතිබැවින් තමා විසින් එම මිළ ගනන් වෙනත් ස්ථානවලින් අසා දැනගත් බවත් ඒවා වර්ග අඩියකට රු. 950 ලෙස හැකිබව දැනුම්දුන් බවත් ප්‍රකාශ කලේය. ඒ අනුව මෙතරම් මුදලක් වැයවීම සිදුනොවිය යුතු බවත් දැනුම් දෙන ලදී. කාමරය පොටි ඇද, අඩි 2x2 ප්‍රමාණයේ ජනේලයක් සකසා බිම පේන්ට් කිරිමට එතරම් මුදලක් වැයවීම සාධාරන නොවන බව ප්‍රකාශ කලේය. වාහන අංගනය ගැටළුව පිලිබඳවද තමන්ට නිලධාරියෙකු විසින් දුරකථනය මගින් දැනුම්දුන් බවත් ඒ අනුව උප සභාපතිතුමාත් සමග එම ස්ථානය නිරික්ෂනය කිරීමට ගිය බවත් මෙම මුදල් පළාත් සභාවේද සභාවේද කියා තමන් නොදන්නා අතර එම මුදල් යෙවීම යම් නිෂ්ඵල බවක් ඇති බවත් දැනුම්දෙන ලදී. එම නිෂ්පල බව වලක්වාලීමට තමන් උත්සාහාකලද එය අදාළ නිලධාරියා විසින් පිලිනොගත් අතර වැඩ නිමවිමට පෙර නිශ්චිත නිගමන නොගන්නා ලෙස දැනුම්දුන් බව සඳහන් කරන ලදී. මේවන විට වැඩ අවසන් අතර මේ කටයුත්ත සාර්ථක නොවන බව සඳහන් කලේය. ඒ අනුව ඉදි කිරීමේ දී කණු ස්ථාපිත වී ඇති ආකාරය අනුව වාහන කීපයක් පමනක් ඇතුල්කල හැකි අතර කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැකිව කොටසක් ඉතිරිවන බවත් මහජන පුස්තකාලය තව දුරටත් ඉදිරියේදී සංවර්ධනය වන ආකාරයට ඉඩ ඉතිරි කර සැකසුවක් වන අතර ඒ සඳහා හැකියාවක් නොවන පරිදි මෙම නව ඉදිකිරීමේ කණුවක් සවිකරඇති බවත් පුස්තකාලය සංවර්ධනය කරන්නේ නම් නැවත කණුව ගැලවිය යුතු බවත් සඳහන් කරන ලදි. ස්ලැබ් එකේ වතුර ගලා යාමද වාහන අංගනය තුලට සිදුවන බවත් ඒ සඳහා යම් ක්‍රමයක් යොදන බවට දැනුම් දුන් බවත් සඳහන් කරන ලදී. ඒ අනුව මුදල් යම් නිෂ්කාර්යක් වන පරිදි මෙම සැළසුම සිදුකර ඇතිබවට ගරු මන්ත්‍රිවරයා විසින් සඳහන් කලේය. තමන් විසින් මුලින් පෙන්වා දුන් වැරදි නිලධාරියා පිලිනොගත් බවත් තමන් වැරදි පෙන්විම නිසා තමාගේ ගමේ සිදුකළ සංවර්ධන ව්‍යාපෘතියකින් යම් පලිගැනීමක් සිදුකරන බවත් ප්‍රකාශ කලේය. ගබඩාව ඉදිකිරිමද යම් අක්‍රමිකතා ඇති බවත් අඩුපාඩු ඇති බවත් සඳහන් කරන ලදී. කානුවක් නොමැතිව බටයක් යොදා ඇති අතර වතුර බැසයාමේ ක්‍රමවේදය ක් නැති අතර මේ පෙර වාහනය කසළ අංගනය තුළට යාමට හැකියාව ඇතත් දැන් වාහනය ඉදිරිපිට නවත්වා කොරිඩෝරුවේ කසළ හලා අතින් කසළ අංගනය තුලට දැම්මට සිදුව ඇති බවත් ප්‍රකාශකලේය. ශ්‍රමය අපතේ යාමක් සිදුවන අතර මෙම ඉදිකිරිම් සැලසුම්ද තුලින් මුදල් අපතේ යාමක් සිදුව ඇති බව ප්‍රකාශ කලේය. තමන්ගේ ගමේ සිදුකළ සංවර්ධන ව්‍යාපෘතියක් පිලිබඳව නිලධාරිනිය විසින් අනවශ්‍ය ලෙස කටයුතු කරන බවත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව මුල් කාලයේ සිටම අධීක්ෂනයක් ලබාගැනීමට නිලධාරිනිය

සම්බන්ධ කරගැනීමට කෙතරම් උත්සාහා කලද එම අවස්ථාවල වෙනත් රාජකාරි කටයුතුවල සිටි බැවින් ඒ සඳහා සහභාගී නොවූ බවත් සඳහන් කරනලදි. දැනුම්දීමක් සිදුකිරීමට ක්‍රමවේදයක්ද නොමැති අතර නිශ්චිත වේලාවක් හෝ පැමිනෙන දිනයක් පිලිබඳව තමාව දැනුවත් නොකල බවත් සඳහන් කරන ලදී. ගංවතුරට පෙර ස්ථානය නිලධාරියා විසින් නිරික්ෂනය කළද ගංවතුරට පසු එම ස්ථානයේ තත්වය නොදන්නා බවත් නිලධාරියා යම් තීන්දු තීරණ ගත්තේ ගංවතුරට පෙර තත්වය මත පිහිටා බවත් සඳහන් කලේය. ඒ අනුව උතුරු ගළුකාගම ප්‍රධාන මාර්ගයේ බෝක්කු දෙකට අදාළ ව්‍යාපෘතියේ කටයුතු පිලිබඳව තමන්ඇතුළු ගමේ ග්‍රාමසංවර්ධන සමිතිය විසින් මුලින්ම ඇස්තමේන්තුවේ ගැටළු කීපයක් ඇතිබව පෙන්වාදී ඇත. ඒවානම් ස්කැවේටර් යන්ත්‍රයක් ( බැකෝයන්ත්‍රයක් ) භාවිතා කරමින් එකම මාර්ගයේ බෝක්කු දෙක පස්කපා ඉවත්කිරීමට නොහැකි බව පෙන්වාදී ඇති අතර එකවර බෝක්කු දෙකෙහිම පස්කපා ඉවත්කලහොත් ජනතාවට මාර්ගයේ ගමන්කල නොහැකි වේ. ස්කැවේටර් යන්ත්‍රයක් මගින් එම ස්ථානයේ පස් ඉවත්කල නොහැකි අතර එක බෝක්කුවක් කඩා ඉවත්කල පසු අනිත් බෝක්කුවට කඩා ඉවත් කිරීමට මීටර් 300 ක් පමන දුර කොන්ක්‍රිට් මාර්ගයේ ස්කැවේටර් යන්ත්‍රය ගෙන යාම කොන්ක්‍රිට් මාර්ගයට හානිවිය හැකි අතර එය ලොරියක ගෙන ගියහොත් කි.මී.දෙකකට වැඩිදුරක් ප්‍රවාහනය කල යුතුයි. අඩි දෙකක හියුම් බටයක් යෙදූපාරෙන් ඉවතට අඩි දෙකක් බැගින් පන්නා ඇති තැනක ස්කැවේටර් යන්ත්‍රයක් මගින් පස්කපා ඉවත්කිරිමද කළ නොහැක. දෙවන බෝක්කුවේ අඩි 1 ½ - 2 හියුමින් බටයක් අළුතෙන් දාලානැති නිසාත් බිල අඩුකරලා. ඒකට හේතුව ඒ ස්ථානයේ මීට පෙර අඩි 4 ක් දිග අඟල් 6 ක බටයකින් වතුර ලබාගෙන තියෙනවා. ඒක මුල් අවස්ථාවේ පාර ඉදිකිරීමේදී කරපු එකක්. පස්සේ මේ මාර්ගය පුළුල් කලත් අළුතෙන් බෝක්කුවක් සවි නොකර ඒ මාර්ගයම වතුර ගන්න භාවිතා කරලා. ගමේ මිනිස්සු කියන්නේ ඒ සථානයට හියුමින් පයිප්පයක් ඕනි නැති බවයි. නමුත් කුඹුරු තීරුවක් වගාකිරීම සඳහා අඟල් 2 ක පමන ජලය ලබාගැනිම ප්‍රමාණවත් බව කුඹුරු හිමියා කිව්වා. එහෙත් පෙර දමා තිබුණ අඟල් 6 බටයට අළුතෙන් අඟල් 6 ක බටයක් යොදාගෙන එම ව්‍යාපෘතිය නිමකර ඇත. එම මාර්ගය දමා තිබුණ හියුමින් බටය ඉවත්කර පාර කඩා අඩි 8 ක්පමන කොන්ක්‍රිට් තට්ටුව ඉවත්කර අළුතෙන් කොන්ක්‍රිට් යොදා හරහට අඟල් 6 ක හියුමින් බට යොදා එය වැසෙන සේ කොන්ක්‍රිට් කර පස්යොදා පුරවමින් අඩි 8 පළල ට හා අඩි 8 ක් දිගට පාරසකස්කර ඇත. එය නිලධාරියා පිලි නොගනියි. එම ව්‍යාපෘතියේ පළවෙනි බෝක්කුවේ ප්‍රධාන මාර්ගයේ කොන්ක්‍රිට් තට්ටුව ඉවත්කර අළුතෙන් සැකසීමට ඉල්ලීම් කලද එයට ඉඩ දී නැත. ව්‍යාපෘතිය ආරම්භයේදී දුරකථනයෙන් අමතා නිලධාරියාට පැමිනෙන ලෙස ඉල්ලිම්කලද පැමිනියේ නැත. එක බෝක්කුවක වැඩ අවසන් කරලා ඒ ස්ථානයට පැමිණිය නමුත් කිසිදු වරදක් ඒ අවස්ථාවේ පෙන්වා දුන්නේද නැත. දෙවැනි බෝක්කුවේ වැඩ ආරම්භ කිරිමට පෙර දුරකථනයෙන් අමතා ඒ ස්ථානයට ගෙන්වා ගත්තා. ඒ අවස්ථාවේ ව්‍යාපෘතිය සම්බන්ධව විමසූ විට කියා සිටියේ ප්‍රධාන මාර්ගයේ කොන්ක්‍රිට් ඉවත් නොකරන ලෙසයි. එලියට තල්ලුවී ඇති අඟල් හයක පමන කට ඇරී ඇති බෝක්කුව මතට ඉටිකොළ තබා කොන්ක්‍රිට් කරන ලෙස උපදෙස් දෙන ලදී. නමුත් එය ප්‍රායෝගික නොවන බැවින්

බෝක්කු මත කොන්ක්‍රිට් රැඳවීමට අපහසු නිසා එය ගලවා ඉවත් කර නැවතත් අඩියක පමන මඩ කොන්ක්‍රිට් එකක් යොදා එම ස්ථානය යථා තත්වයට පත්කර වැඩ අවසන් කලා. ඒ ස්ථානයට බැකෝ එකක් දාලා පස් ඉවත් කරන්න බැරි බව ඕනැම අයෙකුට පේනවා. මේ

**බෝක්කුව පිහිටි ස්ථානයේ මාර්ගය දෙපස ඇතුලට අඩි දෙකකට වඩා ප්‍රමාණවත් පස් සේදීයාමක් පාර කැඩීයන අවස්ථාවක තබූ බව වායාරූප වලින් පෙන්වා දෙන්න පුළුවන්. එම කුහර පස් ඉවත් කර කොන්ක්‍රිට් ඇතුලත් කර එය පුරවා සකස් කරන ලෙස උපදෙස් දෙන කදී. ඒ අනුවම ක්‍රියාකරමින් මෙම ව්‍යාපෘතිය නිසි අයුරින් වැඩ අවසන් කලා. නමුත් මේ කොට්ටාශයේ මන්ත්‍රීවරයා ලෙස මා සමග ඇතිවූ අර ව්‍යාපෘතිවල අඩුපාඩු පෙන්වා දුන් හේතුව මත මේ ව්‍යාපෘතියේ මුදල් කප්පාදුවක් කරලා. ඒකයි තත්වය. ඒ නිසා මේ කර්මාන්තය කල සමෝදා ග්‍රාමසංවර්ධන සමිතියෙන් ඉල්ලීමක් කරලා තියෙනවා මේ මුදල් කප්පාදුව පිලිගන්න බෑ. සාර්ථකව වැඩ අවසන් කරලා. ඒ නිසා වෙනත් කාර්මික නිලධාරියෙකු මගින් හෝ අපක්ෂපාතී පරීක්ෂණයක් කරලා ඇස්තමේන්තු මුදල සමිතියට ලබාදෙන ලෙස ට. තව දුරටත් දීර්ඝ වශයෙන් ගරු මන්ත්‍රීවරයා අදහස් දැක්වූ අතර ප්‍රායෝගිකව සිදුකල නොහැකි කාර්යන් සම්බන්ධව දැනුම් දුන්නද ඒවා නොසළකා හැර පසුව ඒ පිලිබඳව ප්‍රශ්නකරන බවත් සඳහන් කලේය. වැඩබිමේ පස් ඉවත්කිරීම් ආදි කටයුතු කුඹුරු වලට දැමීම කළ නොහැකි අතර ඒවා කුඹුරුවලට දැමීමට ගොවින් කැමති නැත. ස්කැවේටර් ඒ මාර්ගයේ යන්න බෑ. අක්කර 15,20 කුඹුරු යායවල් විනාශ වෙයි. අර ප්‍රමාණයේ බෝක්කු දාන්න බෑ. කුඹුරුකාරයෝ බනියි. නිලධාරියා කිව්ව විධිහට කලා නම්. මම හෝ මේ මුදල සමිතියට දෙනවා. තුන් ලක්ෂ පනස් දාහෙන් අසූතුන්දාහක් අඩුකර ඇති බවත් නමුත් මෙම ව්‍යාපෘතිය ඵලදායිව නිමකර ඇති බවත් ඒ සම්බන්ධ වායාරූපද ඇති බවත් දැනුම්දුණි. එසේම මේ සම්බන්ධව විගනනයට හෝ අදාළ සියළු අංශ වෙත දැනුම්දෙන බවත් ගරු මන්ත්‍රීවරයා ප්‍රකාශ කලේය.**

මෙම කාරක සභා අවස්ථාවේදී කාර්මික නිලධාරි වරයා අදහස් දක්වමින් කසළ අංගනයේ යම් යම් වෙනස් කිරිම් හා එම ඉදිකිරිම් සැළසුම් සහගතව සිදු කල බවත් එම ස්ථානයේ කානුවක් ඉදිකල හොත් පහල බිමේ පවතින පදිංචි නිවාස වෙත ජලය ගලායාම වැලැක්විය නොහැකිවන බවත් ගැටළුකාරීතත්වයක් උද්ගතවන බැවින් තාක්ෂනය භාවිතාකර ගැටළු ඇති නොවන පරිදි වාහනයක් ස්ථානයට ඒමට හැකි පරිදි නිසිපරිදි එම ස්ථානය සකසා ඇති බවත් දන්වන ලදී. පාර්ටිෂන් කිරීම සම්බන්ධයෙන් මීට ඉහත තිබූ අවිධිමත් භාවය ඉවත්කර කාර්මික නිලධාරීවරයෙකු වශයෙන් තමාගේ වසර 24 ක සේවා පරිචය භාවිතා කර වඩාත් ප්‍රශස්ත පහසු ආකාරයෙන් කසළ වර්ගීකරනය කල හැකි පරිදි මෙම ස්ථානය සැකසූ බව ප්‍රකාශ කරන ලදී. ශ්‍රම ඵලදායීතාවය, කාර්යක්ෂමව පහසු වර්ගිකරනය හා වෙළඳපළට පහසුවෙන් යොමුකලහැකි පරිදි වාහනයක් හැසිරවිමට හැකිවීම මෙතුලින් සිදුවන බවත් කලින් තිබූ ගොඩනැගිල්ල ගිනිගැනීමෙන් පසු ඉදිකල මෙම ඉදිකිරීම පිලිබඳව විගනනයෙන්ද මැණුම්කටයුතු සිදුකර පරික්ෂාවට ලක් කලද කිසිදු වැරදීමක් හෝ නොගැලපෙන යමක් නොතිබූ බවත් මෙම කර්මාන්තය සාර්ථක ව්‍යාපෘතියක් බවත් ඒ සම්බන්ධ ඕනෑම පරික්ෂනයක් සඳහා පිළිතුරු සපයන බවත් සඳහන් කරන ලදී. එසේම මෙම විධිමත්ව සිදුකළ කර්මාන්තය පිලිබඳව, ඒ මුදල් නිසිපරිදි යොදවා ඇති බව ගරු මන්ත්‍රීතුමන්ලා ද දැනුවත් වන ලෙසට ඉල්ලා සිටින ලදී. එසේම මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතියට මෙතෙක් කිසිදු මුදලක් ගෙවා නොමැති බවත් එසේම මේ විස්තර හෝ තොරතුරු තමාවෙතින් විමසා නොමැති බවත් පලමුව ලබාගත්තේනම් මෙවැනි කාල සීමාවක් වැයනොවන බවත් සඳහන් කරන ලදී. එසේම ලේඛනාගාරය සම්බන්ධව රාක්ක ගැසීමට යොදාගත් ඇළුමිනියම් වර්ගය හා ප්‍රධාන ඉංජිනේරු අනුමැතිය අනුව සිදුකළ කර්මාන්තයක් බවට විස්තර ඉදිරිපත්කල අතර ජීවිත කාලය පුරා පවතින ඔරොත්තු දෙන වර්ගයේ හොඳම

ඇළුමිනියම් භාවිතා කල බවත් විගනනයෙන් එය ද මැණුම් කළ අතර එම කර්මාන්තයද දෝෂ රහිත බවත් ප්‍රකාශ කලේය.

ගරාජය සම්බන්ධව කාර්මික නිලධාරී විසින් අදහස් දක්වමින් ඇස්තමේන්තුව අනුව එම ව්‍යාපෘතියේ වැඩ නිමකර නොමැති අතර නිසිලෙස ජලය ගලායාම සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සැකසීමට නියමිත බවත් ගරාජයේ නිෂ්කාර්ය ලෙස හැඳින්වූ කොටස පවතින්නේ ත්‍රිරෝද රථය හා අනෙකුත් කුඩා වාහන සඳහා බවත් ප්‍රකාශ කරන ලදී. එසේමඋතුරු ගළකාගම ප්‍රධාන මාර්ගයේ බෝක්කු දැමීම සම්බන්ධයෙන් ඇස්තමේන්තු පරිදි පරිදි ගෙවිම් කටයුතු සිදුකරන අතර ජේසීබියන්ත්‍රය භාවිතා නොකිරිම, දෙවන බෝක්කුවේ හියුම්පයිප්ප අළුතෙන් දමා නොමැති බවත් එම මුදලද ඇතුලත්ව නොකල වැඩ වෙනුවෙන් එම් මුදල් ප්‍රමාණය බිලෙන් අඩුකල බවත් නොකල වැඩ වෙනුවෙන් මුදල අඩුවිම පාඩුවක් නොවන බවත් සඳහන් කලේය. තමන් විසින් මේ සභාවේ වෙනත් ගරු මන්ත්‍රිතමන්ලා තුමියන්ලා සම්බන්ධකරගෙන වෙනත් ව්‍යාපෘති සිදුකර ඇති බවත් ඒවා පිලිබඳව මෙවැනි ගැටළු නොමැති බවත් මෙම කර්මාන්තය සම්බන්ධව යම් ගැටළුවක් පවතින්නේ නම් වෙනත් කාර්මික නිලධාරියෙකු සහිතව යම් කමිටුවක් මගින් මෙම කර්මාන්තය අධික්ෂනය කරන ලෙසද දැනුම් දෙන ලදී. එසේම නොකළ වැඩ වෙනුවෙන් ගෙවිම් සිදුනොකරන බවත් සඳහන් කලේය. මෙම අවස්ථාවේදී නැවතත් **. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා විසින් පෙර සඳහන් කළ කරුණු නැවත දක්වමින් එම ඇස්තමේන්තුවට කාර්මික නිලධාරිනිය ප්‍රකාශ කල කොටස් සිදු නොකලේ ජේසීබියන්ත්‍රයක් යාමට නොහැකි මාර්ගයක් බැවින් හා හා පෙර දමා තිබුණ අහල් 6 බටයට අළුතෙන් අහල් 6 ක බටයක් යොදාගෙන එම ව්‍යාපෘතිය නිමකර ඇත. එම මාර්ගය දමා තිබුණ හියුමින් බටය ඉවත්කර පාර කඩා අඩි 8 ක්පමන කොන්ක්‍රිට් තට්ටුව ඉවත්කර අළුතෙන් කොන්ක්‍රිට් යොදා හරහට අහල් 6 ක හියුමින් බට යොදා එය වැසෙන සේ කොන්ක්‍රිට් කර පස්යොදා පුරවමින් අඩි 8 පළල ට හා අඩි 8 ක් දිගට පාරසකස්කර ඇත. එය නිලධාරියා පිලි නොගනන්තා බවත් වෙල්ලක් නොමැති මේ මාර්ගයේ ඇස්තමේන්තුව පරිදි පයිප්යක් දැම්මානම් විශාල විනාශයක් වෙල් යායට සිදුවිමට හැකි බවත් එම ඇස්තමේන්තුවේ දෝෂ මත මෙම ව්‍යාපෘතියේ ගෙවිම් අඩුවූ බවත් සඳහන් කරන ලදී. එසේම සුදුසු නිලධාරින් සහිතව මෙම කමිටුව ක් මගින් මෙම කර්මානත්ය පරික්ෂා කරන ලෙසත් එදිනට සමිතිය හා එම මාර්ගයේ ප්‍රතිලාභ ලබන පවුල් 1000 ක පමන පිරිසක් ඒ සඳහා සහභාගි වියහැකි බවත් තමන් කොන්ත්‍රාත්කරු නොවන බවත් කොට්ඨාශයේ මන්ත්‍රී ලෙස තමන්ද සහභාගිවන බවත් දැනුම් දුණි.**

**මෙය කාරක සභා අවස්ථාවක් වූ අතර නැවතත් ගරු උපසභාපති අනිල් ලියනගේ මහතාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතාගේ යෝජනා ස්තිරත්වයෙන් කාරක සභාව මහාසභාව බවට පත්විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>

දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ සහාය අරන් මේ කටයුත්තට මැදිහත්වෙමු. ගමේ පිරිසක් මේ කටයුත්තට සහභාගි විම අනවශ්‍යයි.

මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා විසින් **2025.10.14 සභාවේ අවධානයට ලක් කල මාර්ගය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් තමන් විසින්ද මහා සභාවේ අවධානය වෙත යොමුකර ඇති වැලිගොඩැල්ල මාර්ගය ඇතුළු මාර්ගද එම කමිටුවෙන්ම පරික්ෂා කිරිමට කටයුතු කරවන ලෙස දැනුම්දෙන ලදී.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතාගේ යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශිය සභාවේ මේ වන විට වැඩ අවසන්ව ඇති ගබඩාව හා ගැරේජය **ලේඛනාගාරය , කසළ අංගනය හා වාහන අංගනය යන** ව්‍යාපෘති සම්බන්ධව මහා සභාවට තොරතුරු ලබාදීම සිදුකිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලව ආරච්චි මිය විසින් කරනු ලබන යෝජනා -**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලව ආරච්චි මිය-**

06-62. ගමෙක් ගංගොඩ කටුකැලේ මාර්ගයේ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මියගේ යෝජනාව අනුව** ගමෙක් ගංගොඩ කටුකැලේ මාර්ගයේ සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලව ආරච්චි මිය-**

06-63. කොඩිතුවක්කු කන්ද ප්‍රධාන මාර්ගයෙන් යන අතුරු මාර්ගයක් වන මිනිමියන හේන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මියගේ යෝජනාව අනුව** කොඩිතුවක්කු කන්ද ප්‍රධාන මාර්ගයෙන් යන අතුරු මාර්ගයක් වන මිනිමියන හේන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා</u>**

06-64. වත්තෙකඩේ උතුරු ගලුකාගම මාර්ගය කොටසක් පළල් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතාගේ යෝජනාව අනුව** වත්තෙකඩේ උතුරු ගලුකාගම මාර්ගය කොටසක් පළල් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා</u>**

06-65. කරපිංච කන්ද උඩ පාර කාණුව සකස් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා</u>**

මේ පාරේ වත්තේ ලොරි හා වෙනත් වාහන යනවා. ඒවා පාරේ හරවන්නත් බෑ. කොටසක් හෝ පාර පළල් කරන්න ඕනි. කාණුව සැකසීම අත්‍යාවශ්‍ය කරුණක්.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතාගේ යෝජනාව අනුව** කරපිංච කන්ද උඩ පාර කාණුව සකස් කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා</u>**

06-66. වත්තකඩේ සිට අංක 5 පේළි නිවාස වලට යන මාර්ගයේ අබලංවී තිබෙන බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි. මේ කරපිංච ලැයිම් පාරවල්පිලිබඳව. මිනිස්සු ආණ්ඩුකාරතුමාටත් කිව්වා. මේවායේ කාණු බෝක්කු දාලා හදන්න වෙලා. දැනට බෝක්කු හරි දාලා පස්සේ කාණු හදලා දෙන්න.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මහතාගේ යෝජනාව අනුව** වත්තකඩේ සිට අංක 5 පේලි නිවාස වලට යන මාර්ගයේ අබලංවී තිබෙන බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා විසින් කරනු ලබන යෝජනා -**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා**

06-67. කිරිඇල්ල කෝනාරදෙනිය මාර්ගය ආරම්භක කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතාගේ යෝජනාව අනුව** කිරිඇල්ල කෝනාරදෙනිය මාර්ගය ආරම්භක කොටස සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා**

06-68. කිරිඇල්ල බිම්පැලහේන ප්‍රදේශයේ පවුල් 15 කට පමණ ජලය සපයන ජල ව්‍යාපෘතිය අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා**

**යම් ජනතාවගේ හදිසි අවස්ථාවකදි මේ ජල ව්‍යාපෘතිය ඉතා වැදගත්. ඒය අළුත්වැඩියාකල යුතු තත්වයේ පවතින්නේ. වාර්තා අරන් කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතාගේ යෝජනාව අනුව** කිරිඇල්ල බිම්පැලහේන ප්‍රදේශයේ පවුල් 15 කට පමණ ජලය සපයන ජල ව්‍යාපෘතිය අළුත්වැඩියා කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>

06-69. පත්බේරිය පරකඩුව පදිංචි ඩබ්.එම්. නීතා රෝහිණී යන අයගේ හදවත් රෝගයට ප්‍රතිකාර කිරිමට අධික වියදමක් වැයවන නිසා කරුණාසහගත දීමනාවක් ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අවශ්‍ය විස්තරලබාගෙන නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව** පත්බේරිය පරකඩුව පදිංචි ඩබ්.එම්. නීතා රෝහිණී යන අයගේ හදවත් රෝගයට ප්‍රතිකාර කිරිමට අධික වියදමක් වැයවන නිසා කරුණාසහගත දීමනාවක් ලබාදීමට නිත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>

06-70. කුරුවිට ප්‍රාදේශීය සභාව හරහා මල අපද්‍රව්‍ය ඉවත් කිරිමට අදාල කටයුතු සිදු කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර සේනාරත්න මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>

ගලිබවුසර් සේවාව ඉතා වැදගත්. බොහෝ පිරිසක් අහනවා. අවිස්සාවේල්ල හරි රත්නපුර නගර සභාව හරි තමා තියෙන්නේ ඒ අයව යොමු කරවන්න. අධික මුදලක් යනවා. පොහොරබාව හරි සුදුසු තැනක හරි මේ කටයුත්ත කරන්න පුළුවන්. දැන් ජනගනත්වය වැඩියි. පර්චස් දහය පහලොව ඉඩම්. නව මාදිලියට හියුම් පයිප්ප දාලා වැසිකිලි හදනවා. මේ සියල්ල එක්ක මේ ජනතාවගේ ඉල්ලීම මධ්‍යම රජය හෝ පළාත්සභාව, මධ්‍යම පරිසර අධිකාරිය ආදී වෙත යොමු කරලා මෙක සැළසුම්කරලා ක්‍රියාත්මක කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-

කාලෝචිතයි. කුරුවිට ගරු ප්‍රාදේශීය සභාවෙන් ගලිබවුසර් සේවය ලබාගන්න තියේද කියලා **විශාල පිරිසක් අහනවා. නගරසභාවෙන් පෝලිමේ ඉදලා කරගන්න තියෙන්නේ. කාලයක් නිවිතිගලට ගෙනිච්චා. රත්නපුරේට ගෙනිච්චා. අපි මුදලක් වියදම්කරලා ගලිබවුසරයක් අරන් තැනක් හොයාගන්නත් වෙයි. ඉක්මනින් විසඳුමක් ඕනි වෙයි. ජනතාව අසරණ තත්වෙක ඉන්නේ. ඉඩකඩම් කුඩාවෙනවා. මේ වැසිකිලි සෑදීමටත් යම් ප්‍රමිතියක් ඕනි. සීල් ක්‍රමයට යන්න වෙනවා. හැමතැනම ස්කීම් වගේ ගෙවල්. සභාවෙන් මුදල් හරි දාලා මේ කටයුත්ත කරමු. චීන බවුසර් නම් මුදලට හෝ නිකංවත් ගන්න එපා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා-

**නිවිතිගල ප්‍රාදේශීය සභාවත් එක්ක ගිවිසුමක් තියෙනවා එහේ ගිහින් දාන්න. අපේ ගලියක් හැදුවා. ඒක අක්‍රිය උනොත් දිරයි.**

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

**මල අපද්‍රව්‍ය කළමණාකරණය වෙනුවෙන් ප්‍රතිපාදන ඉල්ලලා තියෙනවා. ඇස්තමේන්තු සකස්කලා. ඒ කටයුතු කඩිනම් කරමු. මේ කටයුත්ත කෙරෙනවා.**
ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශීය සභාව හරහා මල අපද්‍රව්‍ය ඉවත් කිරිමට අදාල කටයුතු සිදු කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-

06-71. පත්බේරිය ගිනිදමන මාර්ගයේ වලවල් වැසීම සඳහා ප්‍රිමික්ස් කියුබ් දෙකක් ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩගල්ස් ප්‍රේමදාස මහතා-

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව** පත්බේරිය ගිනිදමන මාර්ගයේ වලවල් වැසීම සඳහා ප්‍රිමික්ස් කියුබ් දෙකක් ලබාදීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා විසින් කරනු ලබන යෝජනා -</u>**

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

06-72. විසල් ජලව්‍යාපෘතිය කරපිංච ඔපීස් හන්දිය  සිට කොස්ගල කම්මල හන්දිය දක්වා දිර්ඝ කර කොස්ගල කිතුල්පෙ හරහා දොරළුබඩ දක්වා දිර්ඝ කිරිමට  අදාළ අංශ දැනුවත් කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  ඩී.ජී. ජස්ටින් මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

විසල් ජලව්‍යාපෘතිය කරපිංච ඔපීස් හන්දි යෙන්  කරපිංච පැත්තට විතරයි විතරයි ගිහින් තියෙන්නේ. කොස්ගල පැත්තට ගිහින් නෑ. ඒ නිසා කොස්ගල කම්මල හන්දිය දක්වා දිර්ඝ කර කොස්ගල කිතුල්පෙ හරහා දොරළුබඩ දක්වා දිර්ඝ කිරිමට  අදාල අංශ දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

තවත් ප්‍රදේශ ගනනාවකට ඉල්ලා තියෙනවා. ඒ සියළු ප්‍රෙදශත් එක්ක අදාළ අංශ දැනුවත් කරමු.

ඒ  අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩග්ලස් ප්‍රේමදාස මහතාගේ යෝජනාව**  අනුව විසල් ජලව්‍යාපෘතිය කරපිංච ඔපීස් හන්දිය  සිට කොස්ගල කම්මල හන්දිය දක්වා දිර්ඝ කර කොස්ගල කිතුල්පෙ හරහා දොරළුබඩ දක්වා දිර්ඝ කිරිමට  අදාළ අංශ දැනුවත් කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-</u>**

06-73. තෙප්පනාව ඉහලගම උඩදෙනිය වත්ත පාර සෝදාපාළුවට ලක්ව ඇති කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  දමින්ද නලින් අධිකාරම් මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව** තෙප්පනාව ඉහලගම උඩදෙනිය වත්ත පාර සෝදාපාළුවට ලක්ව ඇති කොටස සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-**

06-74. තෙප්පනාව පහලගම බී.එස්. මහතාගේ නිවස අසල සිට අසංක මහතාගේ නිවස අසල දක්වා උඩගෙදර වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව** තෙප්පනාව පහලගම බී.එස්. මහතාගේ නිවස අසල සිට අසංක මහතාගේ නිවස අසල දක්වා උඩගෙදර වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-**

06-75. තෙප්පනාව මැදගම එගොඩවත්ත මාර්ගයේ සෝදාපාළුවට ගොස් ඇති ස්ථානයේ පැතිබැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉනෝකා මල්ලවආරච්චි මිය -**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව** තෙප්පනාව මැදගම එගොඩවත්ත මාර්ගයේ සෝදාපාළුවට ගොස් ඇති ස්ථානයේ පැතිබැම්ම ඉදිකිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. එම්. ගයාන් වික්‍රමසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. එම්. ගයාන් වික්‍රමසූරිය මහතා -

**06-76.** සභා අරමුදල් නොවන වෙනත් ප්‍රභවයකින් ලැබෙන මුදල් ප්‍රතිපාදන වලින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති වල ට අදාළ ඇස්තමේන්තු අනුමත කිරිම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගෙවීම් ක්‍රියාවලිය හා ගිවිසුම් කෙටුම්පත් අනුමත ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදුකිරීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි. මේ යෝජනාවට එකතු කළ යුතු අදහස්. සභා අරමුදල් නොවන කොන්ත්‍රාත් ආවත් සභාවට එන්නේ. ප්‍රායෝගිකව අදාල පිරිවිතර ඇස්තමේන්තු අනුව නියම ආකාරයෙන් ඒකටයුත්ත කරලා තියේනම් ගෙවීම් සිදුකල යුතුයි. ඒකෙදි අනවශ්‍ය ප්‍රමාදයන් සිදුකිරීම අනවශ්‍යයි. එසේම ගැස් මිලදී ගැනීම් ආදිය කඩිනමින් ගන්න ඕනි. අද අපි සභාවේ සාමුහිකව එකඟතාවක් ගමු ගෙවීම් කරලා සභාව දැනුවත් කරමු. සභාවෙන් ප්‍රශ්න කලොත් රැඳවුම් ගෙවීමෙදි නැවත පරීක්ෂාවක් සිදු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මේ සම්බන්ධව විසඳාගත යුතු ගැටළු තියෙනවා. රැඳවුම් ගෙවීම සභාවට එන්නේ නැතිව කරන්න බෑ. උදාහරණයක් පරගල තැන්න පාර වලදුරේ පන්සල පාර ප්‍රමිතිය ගැටළු සහගතයි. ප්‍රාදේශීය ලේකම්ට දැන්වුවා. කාර්මික නිලධාරී ඇරලා බලලා සභාව ගෙවීම් කරලා. මුදල් කමිටුවට බලතල තියෙනවා කියලා. එතන අලාභය ලක්ෂ දෙකයි. රැඳවුම ලක්ෂ එකයි. ඉතුරු ලක්ෂෙට වගකියන අය කව්ද? එසේනම් මුදල්කමිටුවේ ඒ අනුමැතිය දෙන අය වගකීම ගන්න ඕනි. පුනරාවර්තන වියදම් දැරුවාට කමක් නෑ. එදිනෙදා යන වියදම්. ඒවාට විරුද්ධ නෑ. ක්‍රමවේදයක් හදන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

මේ යෝජනාව අරමුණ අනවශ්‍ය ප්‍රමාදය වැලකීම.කාර්මික නිලධාරී බලලා වාර්තා දීලයි මේ කටයුතු කරන්නේ. අපි අවුරුදු 12 ක් මහාසභා ආවරණ අනුමැතියට යටත්ව මේ කටයුත්ත කලා. ඔබතුමාත් ලක්ෂ 27 ක වැඩ කළා. ඒ යෝජනාවලට වැඩවලටත් ඒ ආකාරයෙන් ගෙව්වා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මම කොන්ත්‍රාත් කලේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

බිල්ලෝ මවන්න එපා. මුදල්කමිටුවේ අනුමැතියෙන් කරමු. ගැටළු වෙන්නේ නෑ. නීත්‍යානුකුලවයි ගෙවීම් කරන්නේ.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මේක යෝජනාව විතරයි. ක්‍රමවේදය හදන්න ඕනි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

මුදල් කමිටුවට බලය පවරමු.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මුදල් කමිටුවට පුළුවන්ද? මුදල් ප්‍රමාණය කොපමනද?

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මහින්ද ජයලාල් මහතා -

සංවර්ධන කටයුතු කාර්යක්ෂම කිරිම වැදගත්. අනවශ්‍ය ප්‍රමාදවීම් වලක්වාගෙන ගෙවීම් කඩිනමින් කරන්න පුළුවන්. මට හිතෙන විධිහට මේ ගෙවීම් මුදල් කමිටුවට දමන්න පෙර ඒවා මන්ත්‍රිවරුන්ගේ වට්ස්ඇප් ගෲප් එකටත්  දාමු. විරෝධතා ඇති අයට ඒවා ඉදිරිපත්කරන්න පුළුවන් වගේම ගුණදොස් දාන්නත් පුළුවන්.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

සමිති වලින් මේ කොන්ත්‍රාත් ගන්නේ යම් අවස්ථාවල මුදල් පමා උනත් කමක්නෑ කියලා ඉදිරිපත් වෙලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

කොන්ත්‍රාත්කරුවන් ඇවිත් චෝදනා කරනවා. මුදල්ගන්නවා කියලා. මේ ගෙවීම් කඩිනම් කරන්න. නිලධාරීන්ට ගහන්න කලින් මේවා ගෙවන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

මුදල්කමිටුවට ලක්ෂ 10 ට අඩු ඒවටයි ගෙවීම් බලය දීලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

මුදල්කමිටුවට ලක්ෂ 20 උපරිමය  දක්වා ගෙවිම් කිරීමේ බලය දෙමු. ඒ ක්‍රමවේදය සුදුසුයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා-

ලක්ෂ 20 දක්වා වන කර්මාන්තවල වැඩ අවසන් වීමෙන් පසු බිල්පත් ගෙවීම් කිරීමේ  බලය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට දෙමු. සභා අරමුදල් නොවන වෙනත් ප්‍රභවයකින් ලැබෙන මුදල් ප්‍රතිපාදන වලින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති වල ට අදාළ ඇස්තමේන්තු සඳහා සභා අනුමැතියක්ගෙන ඉදිරිපත් කල හොත් වැඩි කාලයක් ගතවන නිසා එවැනි ඇස්තමේන්තු සභා අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ අනුමැතියෙන් කටයුතු කිරිමට 2025.12.06 දිනැති මහාසභාවේ යෝජනා අංක 06- 56 මගින් තීරණය කළා. එසේම  ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගෙවීම් ක්‍රියාවලිය  හා ගිවිසුම් කෙටුම්පත් අනුමත ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදුකිරීමට  ලක්ෂ 20 දක්වා ගෙවීම් කිරීමේ බලය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට දෙමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. එම්. ගයාන් වික්‍රමසූරිය මහතා ගේ යෝජනාව අනුව සභා අරමුදල් නොවන වෙනත් ප්‍රභවයකින් ලැබෙන මුදල් ප්‍රතිපාදන වලින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති වල ට අදාළ ඇස්තමේන්තු අනුමත කිරිම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගෙවීම් ක්‍රියාවලිය හා ගිවිසුම් කෙටුම්පත් අනුමත ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදුකිරීමට සුදුසු ක්‍රමවේදයක් ලෙස සභා අරමුදල් නොවන වෙනත් ප්‍රභවයකින් ලැබෙන මුදල් ප්‍රතිපාදන වලින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති වල ට අදාළ ඇස්තමේන්තු සඳහා සභා අනුමැතියක්ගෙන ඉදිරිපත් කල හොත් වැඩි කාලයක් ගතවන නිසා එවැනි ඇස්තමේන්තු සභා අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ අනුමැතියෙන් කටයුතු කිරිමට 2025.12.06 දිනැති මහාසභාවේ යෝජනා අංක 06- 56 මගින් තීරණය කර ඇති හෙයින් තව දුරටත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ගෙවීම් ක්‍රියාවලිය හා ගිවිසුම් කෙටුම්පත් අනුමත ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදුකිරීමට සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට රු. ලක්ෂ 20 දක්වා වන ගෙවීම් කිරීමේ බලය ලබාදීමට මහා ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. එම්. ගයාන් වික්‍රමසූරිය මහතා</u>

06-78 . දකුණු කඳන්ගොඩ හේනේපොල නාන තොටුපළ සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ප්‍රතිපාදන ඇති අයුරින් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. එම්. ගයාන් වික්‍රමසූරිය මහතා ගේ යෝජනාව අනුව** දකුණු කඳන්ගොඩ හේනේපොල නාන තොටුපළ සංවර්ධනය කිරිමට **මහා ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් ඉදිරිපත්කරනු ලබන යෝජනා-</u>**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>**

**06- 79. 2026 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමලේඛණය සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සම්බන්ධව තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව2026 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවේ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමලේඛණය සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 80. 2025 වර්ෂයට අදාළ කුරුවිට ප්‍රාදේශිය සභාවේ භාණ්ඩ සමික්ෂණ වාර්තාව සඳහා මහාසභාවේ අනුමැතිය ලබාදීම සම්බන්ධව තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව 2025 වර්ෂයට අදාළ කුරුවිට ප්‍රාදේශිය සභාවේ භාණ්ඩ සමික්ෂණ වාර්තාව සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**06- 81. 2026 වර්ෂයට අදාළව සකසන ලද කුරුවිට ප්‍රාදේශිය සභාවේ මානව සම්පත් සංවර්ධන සැළැස්ම සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සම්බන්ධව තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව 2026 වර්ෂයට අදාළව සකසන ලද කුරුවිට ප්‍රාදේශිය සභාවේ මානව සම්පත් සංවර්ධන සැළැස්ම සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-82. කුරුවිට ප්‍රාදේශීය සභාවේ ඵලදායිතා වැඩසටහන කාර්යක්ෂම කරගැනීම සඳහා ටැබ් එකක් මිලදී ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මෙම ආයතනයේ ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරිමට කටයුතු සිදු වෙනවා. ඒ කටයුතු කාර්යක්ෂම කර ගන්න ටැබ් එකක් අවශ්‍ය වෙනවා. ඒ සඳහායි යෝජනාව ඉදිරිපත් කලේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මමත් මිට ඉහතදි මේ යෝජනාව කළා. අපිට සභාවෙන් එවන යම් යම් ලිපි, වාර්තා ආදිය කියවාගැනීමේදි මේ කුඩා පෝන් එකෙන් බෑ. මන්ත්‍රීතුමන්ලාට ටැබ් අරන් දෙන්න කිව්වා. මේවා අපි අනුමත කළාට ඒ සේරම කියවා ගන්න අමාරුයි. එදා සමහරු අවබෝධයක් නැතිව ඒ යෝජනාවට විරුද්ධවත් කතා කළා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ ඵලදායිතා වැඩසටහන කාර්යක්ෂම කරගැනීම සඳහා ටැබ් එකක් මිලදී ගැනීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 83.** ගරු ආණ්ඩුකාර ලේකම්ගේ **GS/ES/6/14/B(11)** වෙළුම 7 හා 2026.01.16 දිනැති ලිපිය අනුව අතුරු බදු දිම නීත්‍යානුකුල කිරිමට අනුමැතිය ලැබී ඇති බැවින් ඒ සම්බන්ධව මහා සභාවේ අනුමැතිය ලබා දීමටත් , 1/2023 චක්‍රෙල්ඛ ප්‍රකාරව දීර්ග කාලිනව බදු ලබාදෙන කාලසීමාව උපරිම වසර 30 ක් වන බැවින් ඒ සඳහා මහා සභා අනුමැතිය ලබාදීම ටත් යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

පනත අනුව වසර තුනයි.තුනෙන් එහා දෙනවා නම් ආණ්ඩුකාර අනුමැතිය ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තනූජා දීපානි චන්දිකා මිය -

අනුනම අවුරුදු බද්දට නේද දීලා තියෙන්නේ?.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ගරු ආණ්ඩුකාර ලේකම්ගේ ලිපිය අනුව සභාව සතු කඩ, පොලවල් ආදිය අතුරු බදු දීම නිත්‍යානුකූල කල හැකියි. එසේම රජයේ ඉඩම් හා දේපළ බදු දීමේදී ගිවිසුම්ගත විය හැකි උපරිම කාල සීමාව වසර 30 ක් බව පළාත් පාලන කොමසාරිස්ගේ 01/2023

චක්‍රලේඛය මගින් දක්වා තියෙනවා. ඒ අනුවයි යෝජනාව ඉදිරිපත් කලේ. ඒ අනුව කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව ගරු ආණ්ඩුකාර ලේකම්ගේ GS/ES/6/14/B(11) වෙළුම 7 හා 2026.01.16 දිනැති ලිපිය අනුව අතුරු බදු දිම නීත්‍යානුකුල කිරිමට අනුමැතිය ලැබී ඇති බැවින් ඒ සම්බන්ධව මහා සභාවේ අනුමැතිය ලබා දීමටත් , 1/2023 චක්‍රලේඛ ප්‍රකාරව දීර්ග කාලිනව බදු ලබාදෙන කාලසීමාව උපරිම වසර 30 ක් වන බැවින් ඒ අනුව කටයුතු කිරීමට මහා සභා අනුමැතිය ලබාදීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 84.** ගරු ආණ්ඩුකාර ලේකම්ගේ GS/ES/6/14/B(11) වෙළුම 7 හා 2026.01.16 දිනැති ලිපිය අනුව අතුරු බදු දිම නීත්‍යානුකුල කිරිමේ කටයුතු සම්බන්ධව ක්‍රියාත්මක වීමේ බලය, ක්‍රියාකාරීත්වයේ පහසුව සඳහා ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත පවරාදීම සම්බන්ධව සඳහා මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා</u> -

මහා සභාවට අදාල විස්තර අනිවාර්යෙන් වාර්තා කළ යුතුයි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ගරු ආණ්ඩුකාර ලේකම්ගේ GS/ES/6/14/B(11) වෙළුම 7 හා 2026.01.16 දිනැති ලිපිය අනුව අතුරු බදු දිම නීත්‍යානුකුල කිරිමේ කටයුතු සම්බන්ධව ක්‍රියාත්මක වීමේ බලය, ක්‍රියාකාරීත්වයේ පහසුව සඳහා ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත පවරාදීම කටයුත්ත සිදුකරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව ගරු ආණ්ඩුකාර ලේකම්ගේ GS/ES/6/14/B(11) වෙළුම 7 හා 2026.01.16 දිනැති ලිපිය අනුව අතුරු බදු දිම නීත්‍යානුකුල කිරිමේ කටයුතු සම්බන්ධව ක්‍රියාත්මක වීමේ බලය, ක්‍රියාකාරීත්වයේ පහසුව සඳහා ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත පවරාදීම සම්බන්ධව මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 85.** කුරුවිට ප්‍රාදේශිය සභාවේ දෛනික පදනමින් සේවය කිරිමට බඳවාගෙන ඇති සෞඛ්‍ය කම්කරු එස්. පී. අනෝමා මියගේ සේවා ගිවිසුම් කාලය **2026.02.28** දිනෙන් අවසන් වන බැවින් ඉදිරි මාස හය සඳහා ද ඇයව සේවයේ යොදවාගැනීම ට සේවා ගිවිසුම් කාලය මාස **06** කින් දීර්ඝ කිරීමට හා සභා අරමුදලෙන් වැටුප් ගෙවිම සම්බන්ධව සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ දෛනික පදනමින් සේවය කිරිමට බඳවාගෙන ඇති සෞඛ්‍ය කම්කරු එස්. පී. අනෝමා මියගේ සේවා ගිවිසුම් කාලය **2026.02.28** දිනෙන් අවසන් වන බැවින් ඉදිරි මාස හය සඳහා ද ඇයව සේවයේ යොදවාගැනීම ට සේවා ගිවිසුම් කාලය මාස **06** කින් දීර්ඝ කිරීමට හා සභා අරමුදලෙන් වැටුප් ගෙවිමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-86.** වළඳුර කොට්ඨාශයේ නඩුකාරදෙනිය, පිඹුරු අංක **227** ට අයත්, පොදු භූමියක් වන නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම ප්‍රාදේශිය සභාවට පවරාගෙන බහුකාර්යගොඩනැගිල්ලක් හා ළමාඋද්‍යානයක්, ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථානයක් ඇතුළු පොදු පහසුකම් සැපයීමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

**2026.01.02** දිනැති මහා සභාවේ මා විසින් පොදු භූමි පවරාගැනීම සම්බන්ධව යෝජනාවක් කලා. මේ කටයුත්තත් සම්බන්ධව නිවාස අධිකාරිය සමග කතා කලා. සංවර්ධනය වෙනුවෙන් කරන යෝජනා සම්බන්ධව කිසිදු ගැටළුවක් නෑ. මා විසින් ඉදිරිපත් කල යෝජනාව පිලිබඳව කටයුතු සිදුවෙන්නේ කෙසේද?.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මේ පිලිබඳව මීට පෙරත් සභාවේ පැහැදිලි කලා. නිවාස අධිකාරියෙන් පොදු භූමිය වෙන්කරලා සභාවට පැවරුම කරලා තියෙන්නේ. සභාවෙන් ඒක භාරගැනීමේ

ප්‍රමාදයක් තියෙන්නේ. ඒ ප්‍රමාදය නිසාම ඒ ඉඩමේ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදිකරන්න අනුමැතිය ගන්න ගියාම ගැටළුවක් උනා. නමුත් ඒ අවස්ථාවේ හැටියට ගැටළුව නිරාකරණය කර ගත්තත් අරගලය නිසා ඒ කටයුත්ත ආරම්භ කරන්න බැරි උනා. ඒ හින්දා මේ කටයුත්ත හෙටට ගැලපෙන ලෙස කරන්න. පළාත් සෞඛ්‍ය එක එක්ක කතාකරලා සෞඛ්‍ය මධ්‍යස්ථානය එක්ක බහුකාර්ය වගේ හෙටට ගැලපෙන ලෙස කරන්න. ඉඩම සභාවෙන් භාරගන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ කටයුත්ත සම්බන්ධව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව වළදූර කොට්ඨාශයේ නඩුකාරදෙනිය, පිඹුරු අංක 227 ට අයත්, පොදු භූමියක් වන නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම ප්‍රාදේශිය සභාවට පවරාගෙන බහුකාර්යගොඩනැගිල්ලක් හා ළමාඋද්‍යානයක්, ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථානයක් ඇතුළු පොදු පහසුකම් සැපයීමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 87.** ගලහිටිය, පරකඩුව පදිංචි ඒ.කේ. සෙනරත් මහතා සතුව ඇති තෙප්පනාව, හුණුකොටුව ලන්ද නමැති ඉඩමෙන් පර්චස් 11.5 ක් ජනතාවගේ පොදු කටයුතු සඳහා පරිත්‍යාග කිරිමට කැමැත්ත පලකර ඇති හෙයින් එම ඉඩම් කොටස නීත්‍යානුකුලව සභාවට පවරාගැනීමටත් ඉඩම පරිත්‍යාගකිරීමේදි මැණුම් ආදී කටයුතු සඳහා වැයබරක් දැරිමට සිදුවුවහොත් එම මුදල සභා අරමුදලෙන් දැරිමටත් මහා සභා අනුමැතිය ලබාදිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රාදේශීය සභාව වෙත පොදු කටයුතු සඳහා පරිත්‍යාග කරන මේ ඉඩම සම්බන්ධව අවශ්‍ය විස්තර ලබාගෙන නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව හා ගලහිටිය, පරකඩුව පදිංචි ඒ.කේ. සෙනරත් මහතා සතුව ඇති තෙප්පනාව, හුණුකොටුව ලන්ද නමැති ඉඩමෙන් පර්චස් 11.5 ක් ප්‍රාදේශීය සභාව වෙත පොදු කටයුතු සඳහා පරිත්‍යාග කිරිමට කැමැත්ත පලකර ඇති ඉල්ලීම අනුව එම ඉඩම් කොටස නීත්‍යානුකුලව සභාවට පවරාගැනීමටත් ඉඩම පරිත්‍යාගකිරීමේදි මැණුම් ආදී කටයුතු සඳහා වැයබරක්

දැරීමට සිදුවුවහොත් එම මුදල සහා අරමුදලෙන් දැරීමටත් නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-88.** කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ **2025.07.11** දිනැති ඉල්ලීම් ලිපිය අනුව පැරඩයිස් කුරුවිට ,නාලන්ද එල්ලාවල කාර්මාන්තපුරයේ ඉඩම් කොටස් දීර්ඝකාලීනව බදු දීම යටතේ වාණිජ බිම් කොටසක් මැක්ස් ඉකෝ මිනරල් ඇන්ඩ් කෝටින්ග්ස් පුද්ගලික සමාගම වෙත බදුදීම සම්බන්ධ ව මහාසභාවේ එකඟත්වය ඉල්ලා ඇති අතර අනුමැතිය ලබාදීම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි. මේ සම්බන්ධ කමිටුව මගින් මේ ඉඩම පරික්ෂා කළා. ගැටළුවක් නෑ. ඩොලමයිට් සම්බන්ධ කටයුත්තක්. අවසර දෙමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව හා කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ **2025.07.11** දිනැති ඉල්ලීම් ලිපිය අනුව පැරඩයිස් කුරුවිට ,නාලන්ද එල්ලාවල කාර්මාන්තපුරයේ ඉඩම් කොටස් දීර්ඝකාලීනව බදු දීම යටතේ වාණිජ බිම් කොටසක් මැක්ස් ඉකෝ මිනරල් ඇන්ඩ් කෝටින්ග්ස් පුද්ගලික සමාගම වෙත බදුදීම සම්බන්ධ ව මහාසභාවේ එකඟත්වය ඉල්ලා ඇති අතර අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-89.**සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් රත්නපුර සිට මලංගම, නඩුකාරදෙනිය බන්ධනාගාරය හරහා යහලකොටුන්න දක්වා බස්රථයක් ධාවනය කරවීමට සැළසුම් කර ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි .යහලකොටුන්න ප්‍රජා ශාලාව ළඟට විතරයි මේ ආකාරයට බසය යැවෙන්නේ. නිශාන්ත මහතාගේ නිවස දක්වා ගියොත් වඩාත් වැදගත්. කලින් එහෙම තමා ධාවනය උනේ. දළු ලොරියත් එතනට යනවා. බසයට එතන දක්වා යන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය</u> -

දැනටත් වැඩ කරන අය පාඩුයි කියනවා. ඒ ස්ථානය දක්වා පාර හදලාත් නෑ. යහලකොටුන්න දක්වා යන්න පුළුවන්.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

දැනට ඉල්ලා ඇති ආකාරයෙන් අනුමැතිය දෙමු. පසුව ධාවනය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

පාඩුයි කියලා බෑ. ගලුකාගම පළාත් සභා මාර්ගයක්. පාඩුයි කියලා බස් රථය නැවැත්තුවා. පස්සේ පෝමිට් එක ඉල්ලුවා. දැන් ආයෙත් බස්රථය දුවනවා. ජනතාව වෙනුවෙන් බස් රථ දුවන්නේ.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් රත්නපුර සිට මලංගම, නඩුකාරදෙනිය බන්ධනාගාරය හරහා යහලකොටුන්න දක්වා බස්රථයක් ධාවනය කරවීමට සැළසුම් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-90.** තැඹිලියන කුරුවිට පදිංචි එම්.ජී. මිහින් ලක්දිනු සිරිවර්ධන මයා විසින් රත්නපුර ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව හදාරා ඇති අතර එම ආයතනයේ ඉල්ලීම අනුව ඔහුගේ අනිවාර්ය මාස 06 පුහුණුව සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවේ අවස්ථාව ලබාදීමටත් වක්‍රෙල්බ ප්‍රකාරව දීමනාව ගෙවීමටත් මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මාස 06 පුහුණුවට අදාලව පුහුණුවීම සඳහා බඳවා ගමු. වක්‍රෙල්බ ප්‍රකාරව දීමනාව ගෙවීමට කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව තැඹිලියන කුරුවිට පදිංචි එම්.ජී. මිහින් ලක්දිනු සිරිවර්ධන මයා විසින් රත්නපුර ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව හදාරා ඇති අතර එම ආයතනයේ ඉල්ලීම අනුව ඔහුගේ අනිවාර්ය මාස 06 පුහුණුව සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවේ අවස්ථාව ලබාදීමටත් වක්‍රෙල්බ ප්‍රකාරව දීමනාව ගෙවීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-91.** කුරුවිට ප්‍රාදේශිය සභාවේ කිරිඇල්ල පෙර පාසැලට අනුබද්ධව දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භකිරිමට හා ඒ සඳහා අවශ්‍ය වන අනෙකුත් අවශ්‍යතා ඉටුකරගැනීමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි. මේ කටයුත්තේදි මේ ඉඩම පෙර පාසැල පිහිටි ඉඩමේ කොටසක අනවසර පදිංචිය සම්බන්ධව අධිකරණයෙන් නියෝග නිකුත් කළත් අපි අපි නිසි ලෙස ක්‍රියාත්මක උනේ නැති නිසා අපි අසමත්. නෙරපුම් නියෝග ක්‍රියාත්මක කරන්න කිව්වාට ඒක කලේ නෑ. ඉඩමේ හිටපු කීර්තිරත්න මැරිලා. දැන් ඒ පිලිබඳව පියවර ගැනීම සංකීර්ණ ක්‍රියාවලියක් වෙලා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

කොමසාරිස්ගෙන් අපි නැවත ඉල්ලීම කළා. මේ කටයුත්ත කඩිනම් කරන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

නාමල්දෙනිය උප කාර්යාලය ලඟ තිබුණා පෙර පාසැලක්. දැන් වැහිලා. වහලේ දිරලා. එතනත් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හැදුවොත්සභාවට ආදායමකුත් ගන්න පුළුවන්. ඒක ප්‍රතිසංස්කරණය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා

ඒ ඉඩමේ තියෙන සුදුසු ගස් ඉරලා ඒ කටයුත්ත කරන්න පුළුවන්.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

කුරුවිට ප්‍රාදේශිය සභාවේ කිරිඇල්ල පෙර පාසැලට අනුබද්ධව දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භකිරිමට හා ඒ සඳහා අවශ්‍ය වන අනෙකුත් අවශ්‍යතා ඉටුකරගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමු. ඒ අනුව දිවාසුරැකුම් මධ්‍යස්ථානයකට අනුමතවූ කාර්ය මණ්ඩලයක් සභාව සතුව නැති නිසා සුදුසු කාර්ය මණ්ඩලයක් අනුමත කරගන්නා තෙක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන සුදුසු ක්‍රමවේදයක් අනුව දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භකරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ කිරිඇල්ල පෙර පාසැලට අනුබද්ධව දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භකිරිමට හා ඒ සඳහා අවශ්‍ය වන අනෙකුත් අවශ්‍යතා ඉටුකරගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමටත් දිවාසුරැකුම් මධ්‍යස්ථානයකට අනුමතවූ කාර්ය මණ්ඩලයක් සභාව සතුව නොමැති නිසා සුදුසු කාර්ය මණ්ඩලයක් අනුමත කරගන්නා තෙක් ගරු

ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන සුදුසු ක්‍රමවේදයක් අනුව දිවාසුරකුම් මධ්‍යස්ථානයක් ආරම්භකිරිමටත් ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-92.** කුරුවිට ප්‍රාදේශිය සභාවේ කිරිඇල්ල පෙර පාසැලේ සහාය පාලිකාවක ලෙස සේවයේ නියුතුව සිටි ජී.කේ. දීපිකා කෝනාර මිය ප්‍රසූත නිවාඩු ලබා සිටි අතර ඇය **2026.08.01** දින සිට නැවත සේවයට පැමිණීමට නියමිත බැවින් එදින සිට ඉදිරි වසරක් දක්වා සේවා ගිවිසුම් ගතවීමටත් චක්‍ර ලේඛ ප්‍රකාරව සහා අරමුදලෙන් ගෙවීම් කිරිමටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමටත් මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සහා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ කිරිඇල්ල පෙර පාසැලේ සහාය පාලිකාවක ලෙස සේවයේ නියුතුව සිටි ජී.කේ. දීපිකා කෝනාර මිය ප්‍රසූත නිවාඩු ලබා සිටින බැවින් ඇය **2026.08.01** දින සිට නැවත සේවයට පැමිණීමට නියමිත බැවින් එදින සිට ඉදිරි වසරක් දක්වා සේවා ගිවිසුම් ගතවීමටත් චක්‍ර ලේඛ ප්‍රකාරව සහා අරමුදලෙන් ගෙවීම් කිරිමටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමටත් මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-93.** කුරුවිට ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලයේ කාන්තා වැසිකිළිය අළුත්වැඩියාව සඳහා වන රු. **700000.00** ක ඇස්තමේන්තුව සඳහා මහා සභා අනුමැතියය ලබාදිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u> -

දැනට පවතින වැසිකිලියේ අඩුපාඩු තියේද?

මෙම යෝජනාව සම්බන්ධව අවශ්‍ය කරුණු මහා සභාවට ඉදිරිපත් කිරිම සඳහා කාර්මික නිලධාරීගේ විස්තර ලබාගැනිමට ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ ස්ථිරත්වයෙන් මෙම අවස්ථාවේදී මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් විය.

ඒ අනුව කාර්මික නිලධාරි මහතා විසින් අදාළ වැසිකිලිය කොටස් දෙකක් වනසේ සකසා කොමඩ් එකක් සහිත හා පෝච්චිය සහිත ලෙස දෙකක් වන ලෙස සැකසීමටත් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය උපාංග මිලදී ගැනිම දොරවල් සවිකිරිම වෙන්කිරිම ආදී ලෙස අවශ්‍ය වන බවත් සඳහන් කරන ලදි. මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් අදහස් දක්වමින් වැසිකිලි පිටුපස ජලය බසින ස්ථානය පිලිබඳව අවධානය යොමුකරන ලෙසත් ඒ සම්බන්ධව මීට ඉහතදී කාර්මික නිලධාරිනියක් විසින් සිදුකළ ඉදිකිරිම්වලදීද එම තත්වය පෙන්වා දුන්නද ගැටළුව තව දුරටත් පවතින බවත් සඳහන් කරන ලදී.නැවතත් ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ ස්ථිරත්වයෙන් මෙම අවස්ථාවේදී කාරක සභාව මහා සභාව බවට පත් විය.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලයේ කාන්තා වැසිකිළිය අළුත්වැඩියාව සඳහා වන රු. **700000.00** ක ඇස්තමේන්තුව සඳහා මහා සභා අනුමැතිය ලබාදිමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-94.** පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබු කැකිරත්න අමුනේ පිටවේල්ල ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. **1786375.00** ක මුදල කොස්ගොඩ එකමුතු ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබු කැකිරත්න අමුනේ පිටවේල්ල ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. **1786375.00** ක මුදල කොස්ගොඩ එකමුතු ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරිමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-95.** පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබු ඇලි ඇස්ස අසල සිට දංවල ලියැද්ද දක්වා කෘෂි මාර්ගය සැකසිම වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. **1728069.89** ක මුදල ඉහලගම තෙප්පනාව පැරකුම් ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබූ ඇලි ඇස්ස අසල සිට දංවල ලියැද්ද දක්වා කෘෂි මාර්ගය සැකසීම වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. 1728069.89 ක මුදල ඉහලගම තෙප්පනාව පැරකුම් ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරීමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-96. පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබූ ගල්කැටිය නාගහමුල්ල ඇළ මාර්ගයේ නවතා ඇති පැතිබැම්ම දිර්ඝ කිරීම අධියර 11 වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. 1776475.00 ක මුදල පහලගම තෙප්පනාව පැරකුම් ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබූ ගල්කැටිය නාගහමුල්ල ඇළ මාර්ගයේ නවතා ඇති පැතිබැම්ම දිර්ඝ කිරීම අධියර 11 වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. 1776475.00 ක මුදල පහලගම තෙප්පනාව පැරකුම් ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරීමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-97. පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබූ තෙප්පනාව ඉහළගම දෙල්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. 1234105.59 ක මුදල ඉහලගම එක්සත් අවමංගල්‍යාදාර සමිතිය වෙත ගෙවීම් කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා_ගේ යෝජනාව අනුව පළාත් සභා ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලැබූ තෙප්පනාව ඉහළගම දෙල්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම**

**වෙනුවෙන් වැඩ අවසන් බිල්පත ලෙස රු. 1234105.59 ක මුදල ඉහලගම එක්සත් අවමංගලයාදාර සමිතිය වෙත ගෙවීම් කිරීමට මහා සභාවේ අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.**

**මෙම අවස්ථාවේදි ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා විසින් මහා සභාව දැනුවත් කරමින් අද දින සභාවේ න්‍යායපත්‍රයට ඉදිරිපත් නොවූ එහෙත් මෙම අවස්ථාවේදී මෙම ප්‍රදේශයට අත්‍යාවශ්‍ය බවට හා කඩිනමින් ඉටුකළයුතු කාර්යයක් ලෙස හඳුනාගත් මාර්ගයක් සැකසීම පිලිබඳව සභා අනුමැතිය ලබාගැනීමට** කල්දී නොමැති යෝජනා ලෙස හදිසි හා අත්‍යාවශ්‍ය යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමට ලබාදී ඇති බවත් ඒ සම්බන්ධව මහා සභාවේ එකඟත්වයත් විමසා සිටින ලදී. එම යෝජනා ඉදිරිපත්කිරිම සම්බන්ධයෙන් මහාසභාවේ එකඟත්වය පළවිය. ඒ අනුව පහත පරිදි යෝජනාව ඉදිරිපත් විය.

06- 98 . කල්දී නොමැති යෝජනා ලෙස හදිසි හා අත්‍යාවශ්‍ය යෝජනාව ඉදිරිපත්කිරිම.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා-</u>

**කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන ගලහිටිය මීගස්තැන්න මාර්ගයේ මෙනේරිපිටිය කඩාඩුවේකුඹුර හා ඇළ මායිම්ව ඇති, පියදාස මහතාගේ නිවස ආසන්නයේ මාර්ගයේ කැඩී ගොස් වලවල් වී ඇති ස්ථාන දෙක සැකසීමට රු. 590000.00ක ප්‍රතිපාදන ලබා දීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> **-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා-</u>

**මේ මාර්ගයේ ගමන් කිරීමේදි ජනතාවට ඉතාමත් අනතුරු තත්වයක් ඇතිවී තියෙනවා. වාහන ගමන්කිරිමද අනතුරුදායකයි. ඒ නිසා මේ කටයුත්ත කඩිනම් හා හදිසි කටයුත්තක් ලෙස සලකා ඉටුකරදෙන්න. ඒ සඳහා රු. 590000.00ක ප්‍රතිපාදන ලබාදෙන්න.**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා ගේ යෝජනාව අනුව කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන ගලහිටිය මීගස්තැන්න මාර්ගයේ මෙනේරිපිටිය කඩාඩුවේකුඹුර හා ඇළ මායිම්ව ඇති, පියදාස මහතාගේ නිවස ආසන්නයේ මාර්ගයේ කැඩී ගොස් වලවල් වී ඇති ස්ථාන දෙක සැකසීමට රු. 590000.00 ක ප්‍රතිපාදන ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**07.** කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම -

**07 - 01.**

1. **2025.12.18** මුදල්කමිටු වාර්තාව

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>

මේ සභාවේ වාහන රක්ෂනය කිරීමේදී ටෙන්ඩර් දාන්න. ඒ තුලින් විශාල මුදලක් ඉතිරිකරගන්න පුළුවන්. ඒ කටයුත්තකරන්න උත්සාහාකරන්න. උසාවි නඩු සඳහා ගෙවීම් පිලිබඳව මා මීට ඉහතදිත් කිව්වා යම් සමතයක් ගතහැකි කතාකරලා විසඳාගත හැකි ඒවා එහෙම කරමු කියලා. ඒවා සාකච්චජා කරමු. වියදම් අඩු වෙයි. නඩු වලට විශාල මුදලක් මෙම වාර්තාවලත් සඳහන්. තීරණ අංක **13** නඩුවේ අංක පටලැවිල්ලක් තියෙනවා. නාලන්දා පිලිරුව ළඟ එක. විනීතා ශ්‍රියාණි. **2014** කඩපු ගොඩනැගිල්ලක්. **2015** නඩුවක් දාලා. නඩු කියන මුදල් අපතේ. මම එක් නඩුවකට තනියම කතා කලා. නව නීති වාර්තාවක්. නීතිඥ සභායෙන් තොරව ඒ නඩුව දිනුවා. පුහුණු සැසිවල ඒ ගැන කතා කරනවා. මේ මුදල් ගෙවන එකට මම එකඟ නෑ. සාමදානවෙන්න තිබුනා.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

නිතිඥ ගාස්තු අඩුවැඩිකරන්න අපිට බෑ. නිතිඥ ගාස්තු ගෙවන්න බැඳී ඉන්නවා. පෙරකලාසි අත්සන්කරලා. ඒ හින්දා වගකිමක් දුන්නා තම සේවා දායකයින්ගේ අවශ්‍යතාවය ඉටුකරන්න. ඩයස් මන්ත්‍රිතුමා කියන විධිහට යම් එවැනි සමත වියහැකි නඩු තියේනම් සාකච්ජා කරලා ඒ පාර්ශව ලිපි දිය යුතුයි සභාපතිතුමාට. සභාව මේ නඩු වලට විශාල වියදමක් කලා.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

එවැනි එකඟතා ඇත්නම් හැකි ඒවා කරමු. අධික්ෂණවාර්තාවේත් සඳහන් වෙලා තියෙනවා. වාසි අවාසි සම්බන්ධයෙන් අවධානය යොමු කරලා අදාල පාර්ශව සමඟ සාකච්ජා කරලා සමථයකට පත්කරගැනීම සම්බන්ධයෙන් කරුණු සොයාබලලා අනතුරුව ඉදිරි කටයුතු සිදුකිරිම මගින් නඩුවට අදාල නිවැරදි අධිකරණ තීන්දු ලබාගැනීමේ හැකියාව නොමැති වියහැකි බවත් ඒ අනුව එවැනි අවස්ථා අවම කරලීමට කටයුතු කිරීම සුදුසු බවත් එමගින් ප්‍රාදේශිය සභාවේ බලතලහා සීමාවන්ට හානියක් නොවෙන පරිදි කරුණු සලකා බැලීමෙන් අනතුරුව එම තීරණ ගැනීම සුදුසු බවත් පෙන්වා දී තියෙනවා. ඒ අනුව හැකි කටයුත්තක් කරමු.

**2025.12.18** මුදල්කමිටු වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.

2. **2025 .12.23** මුදල්කමිටු වාර්තාව

**2025.12.23** මුදල්කමිටු වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.

3. **2025.12.26** මුදල්කමිටු වාර්තාව

**2025.12.26 මුදල්කමිටු වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.**

**4. 2025.12.29 මුදල්කමිටු වාර්තාව**

**2025.12.29 මුදල්කමිටු වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.**

**5. 2025.12.31 මුදල්කමිටු වාර්තාව**

**2025.12. 31 මුදල්කමිටු වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.**

**6. 2026.01.16 මුදල්කමිටු වාර්තාව**

**2025. 01. 16 මුදල්කමිටු වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.**

**07-02.** 1.2025.12.26 දිනැති කුඩා නගර ජල කමිටු වාර්තාව.

2025.12.26 දිනැති කුඩා නගර ජල කමිටු වාර්තාව පිලිබඳව **මහා සභාවේ සළකා බලන ලදී.**

2. 2026.01.13 දිනැති කුඩා නගර ජල කමිටු වාර්තාව.

2026.01.13 දිනැති කුඩා නගර ජල කමිටු වාර්තාව පිලිබඳව **මහා සභාවේ සළකා බලන ලදී**

3. 2026.01.26 දිනැති කුඩා නගර ජල කමිටු වාර්තාව.

2026.01.26 දිනැති කුඩා නගර ජල කමිටු වාර්තාව පිලිබඳව **මහා සභාවේ සළකා බලන ලදී**

**08 . ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිලිබඳ ප්‍රගති වාර්තා-**

**08-01. 2025 දෙසැම්බර් මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව**

**2025 දෙසැම්බර් මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව පිලිබඳ මහා සභාවේ සළකා බලන ලදී**

**08-03. 2025 දෙසැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.**

**2025 දෙසැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය පිලිබඳ මහා සභාවේ සළකා බලන ලදී**

**08-04. 2025. දෙසැම්බර් ගෙවීම් වාර්තාව පිලිබඳ මහා සභාවේ සළකා බලන ලදී**

**08- 05. 2025 දෙසැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය. මහා සභාවේ සළකා බලන ලදී**

**09.** සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

පුස්තකාල සාමාජිකත්වය දීමේදි ඒ සඳහා ග්‍රාමනිලධාරී අත්සන ලබදෙන්න කියලා .පුස්තකාලයෙන් කියනවා. නමුත් ඒ අතුරු ව්‍යවස්ථාවේ බලය දීලා තියෙනවා සාමදාන විනිශ්චයකරුවෙක්, සභිකවරයෙක් ආදි ලෙස යම් බලයක් දීලා තියෙනවා ඒ කටයුත්තට. මෙතන 46 ක් ඉන්නවා. ඒ 46 ටම පුළුවන්. ඒ හින්දා මේ මන්ත්‍රීවරුන්ටත් ඒ බලය තියෙනවා. මේ පිලිබඳව පුස්තකාලයාධිපතිවරුන් දැනුවත් කරන්න. එසේම ඉල්ලීමක් තියෙනවා. මේ යෝජනාව ගෙනාවා. අපි ණයක් ඉල්ලුවා. ඒක ලැබුනේ නෑ. ආණ්ඩුකාරතුමා හමු වෙලා සාකච්චජා කරන්න. අපේ කාලේ එහෙම කලා. විදේශ රටවලත් පුහුණු වලට ගියා. බයිසිකල් ගන්න ණය දුන්නා. ඒකට කැපෙන මුදල දිමනාවට එකතුත් කලා. ඒ වගේමයි මේ මන්ත්‍රී දිමනා වැඩිවෙන්න ඕනි. ඒවාට ලිපිගහලා වැඩක් නෑ. හමුවෙලා කතාකරන්න.

02. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-**

වැටුම්මල පරකඩුව දුලන්ත සමරකෝන් මහතාට දිට්වා සුළි කුනාටුවෙන් ගසක් වහලෙට කඩා වැටුනත් ආපදා වන්දි ලැබි නෑ. තොරතුරු තියෙනවා. ප්‍රාේදශීය ලේකම්ට යොමුකරලා ඒකට විසඳුමක් දෙන්න.

**3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා-**

මැලේබැද්දගේන නව මාර්ගය මැන්නා. ගල්ටික ඉවත්කරන්න ඕනි පාර කපන්න.
ඒකටයුත්ත කඩිනම් කර දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා-**

ඒ පාර මැන්නා. වෙඩිබෙහෙත් ඕනි ගල් ඉවත්කරන්න. ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කෙරෙමින් පවතින්නේ.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා**
අපි පුපුරණද්‍රව්‍ය පාලක මගින් කරගමු.

**4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා-**

බටහිර කොක්ඕවිට මාර්ගයේ පැතිබැම්ම සැකසීම අත්‍යවශ්‍යයි. ආපදාවට ලක්වෙලා ඒ මාර්ගයේ පසුගිය ආපදා හේතුවෙන් ඉරිතැලීම් සිදුවෙලා. පැතිබැම්ම කඩිනමින් කරදෙන්න.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා**
ඒ සම්බන්ධව පළාත්සභාවට දන්වා ඉදිරි කටයුතු කරමු.

5. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා-**

ශාන්ත ජෝකිම් වත්තේ මාර්ගයේ පාසැල ඉඩම මැදින් බෝඩ් ගැසීම සිදුකර නෑ. ඒ සඳහා සභාවේ මැදිහත්වීම අවශ්‍යයි. සිදුකරදෙන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා
ඒ සම්බන්ධව අපි කතා කලා. අනිවාර්යෙන් ඒ කටයුත්ත කරවනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-

**ක්‍රමසම්පාදන කමිටුවට සම්බන්ධවෙන්න කියලා 2026.02.03 දින උදේ 11.30 ට පමන දුරකථන ඇමතුමක් දුන්නා. මම ඒ වෙලාවේ පොදු කටයුත්තක් සඳහා දුරක ගිහින් හිටියේ. මට ඒ අවස්ථාවේ හදිසියේ සම්බන්ධ වෙන්න විධිහක් නෑ. මෙවැනි කටයුතු සිදු නොවිය යුතුයි. එසේම කොට්ඨාශය තුළ සංවර්ධනයට අදාලව යම් රැස්වීමක් තියෙන කොට අදාළ මන්ත්‍රීවරුන්ව දැනුවත් කලයුතුයි. අපි නොදැනුවත්ව රැස්වීම් තියෙනවා. ආර්ථික සංවර්ධන නිලධාරින් ද සහභාගී වී තියෙනවා. ගමතුල මෙවැනි රැස්වීම් සඳහා සහභාගී විය යුත්තේ ආණ්ඩු පක්ෂය හා රාජ්‍ය නිලධාරින් විතරද?**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා
**එසේ නෑ. ඒ චක්‍රෙල්ඛ ප්‍රකාරව යම් කටයුත්තකදී ඒ අදාල අංශ කැඳවනවා. සභා සීමාවට අදාල නොවන කටයුත්තක් පිලිබඳව රැස්වීමක් තිබුනා. ඒ සඳහා අවශ්‍ය අංශ සහභාගි වි ඇත.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා-

පරණගම සිට දීගල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරිම අවශ්‍යයි. සභාවට පවරාගෙන සංවර්ධනය කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා-

බදුවත්ත කුරුගංමෝදර පාර විශාල වලවල්. සංවර්ධනය කල යුතුයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා
සභාවට යෝජනාව ඉදිරිපත්කරන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

**මෙදිනට නියමිත මහා සභාවේ කටයුතු අවසන් වූ අතර ගරු සභාපතිතුමා විසින් සභාවේ සියළු කටයුතු සඳහා සහාය දුන් ගරු උපසභාපතිතුමාට ,සියළු ගරු මන්ත්‍රී තුමන්ලාට , මාධ්‍ය හිතවතුන්ට, කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කරන ලදි.**

**මහා සභා රැස්වීමේ කටයුතු ප.ව. 17 ට පමණ අවසන් කරන ලදී.**

එම්.විකසිත පුෂ්පසූරිය ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී